# පාලි භාෂාව

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 5 වැනි ශ්‍රේණිය

**(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

**පාලි භාෂාව**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

5 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

**පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරිමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

අකිල විරාජ් කාරියවසම්

අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයේ අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත.
ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලුම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

එම්. එන්. රණසිංහ

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තූතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තූතිය පිරිනැමේ.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**පෙරවදන**

පිරිවෙන ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණි තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍යපරම්පරාව වෙත අච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක වන විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක වන විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තූතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි.එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ සෘජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගුරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412'5'12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට සෘජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පංති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පංති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

**පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය**

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පංතිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

විජිත වෙලගෙදර
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය :** ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

**මෙහෙයවීම** : ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්‍ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

විජිත වෙලගෙදර මයා, අධ්‍යාපන අධ්‍යක්‍ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**අධීක්‍ෂණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා
අධ්‍යක්‍ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** : පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය** : පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය

කේ. ඒ. සුමිත් ධර්මශ්‍රී මයා
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (පාලි භාෂාව)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ උපදේශනය** : පූජ්‍ය මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය** : පූජ්‍ය වල්පොළ පියරතන හිමි
පරිවෙණාචාර්ය, විද්‍යොදය පිරිවෙණ
මාලිගාකන්ද, කොළඹ

ඩී. එම්. එස්. දිසානායක මයා
පරිවෙණාචාර්ය, විද්‍යාධාර මහ පිරිවෙණ
කලාකරඹෑව.

ඩබ්ලිව්. එම්. ඩී. එස්. බණ්ඩාර මයා
පරිවෙණාචාර්ය, ර/ශ්‍රී සුධර්මෝදය මහ පිරිවෙණ
පැල්මඩුල්ල

ඩබ්ලිව්. එම්. ජානක රජීන්ද්‍ර කුමාර මයා
පරිවෙණාචාර්ය, ව/පු/හලා/ විද්‍යාරත්න මහ පිරිවෙණ
වීරහේන, නාත්තන්ඩිය

පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි
සහකාර ලේකම්, ප්‍රාචීන භාෂෝපාකාර සමාගම,
අධ්‍යාපන අමාත්‍යාංශය

**භාෂා හා විෂය කරුණු සංස්කරණය**
: පූජ්‍ය මහාචාර්ය, මකුරුප්පේ ධම්මානන්ද හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය

**සෝදුපත් කියැවීම** : ඩී. ජේ. එරන් ශ්‍රීලාල් මයා
පරිවෙණාචාර්ය, සුභද්‍රාරාම පිරිවෙන් විද්‍යායතනය
ගංගොඩවිල, නුගේගොඩ

**පරිගණක වදන් සැකැසීම** : ආර්. ඒ. විමල් ප්‍රේමතිලක මයා
කථිකාචාර්ය, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය
අවිස්සාවේල්ල

**පිටකවර නිර්මාණය** :

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

පාලි භාෂාව වූකලී ලෝකයේ අතිචමත්කාරජනක මධුර මනෝහර භාෂාවන්ගෙන් එකකි. එයින් රචිත ත්‍රිපිටක සාහිත්‍යය ඇතුළු අටුවා ටීකා හා ප්‍රකරණ සාහිත්‍යාගත කෘති දාර්ශනික හා සාහිත්‍යමය වශයෙන් ලෝකයේ කිසිදු සාහිත්‍යයක දක්නට නොමැති වටිනාකමකින් යුක්ත ය. මෙබඳු භාෂාවක් හා සාහිත්‍යයක් රැක ගැනීම හා පෝෂණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය ථේරවාද සම්ප්‍රදායකට ලෝකයෙන් හිමි වන්නේ වර්ණනා විෂයාතික්‍රාන්ත වූ ගරුත්වයක් බව අපි දනිමු. මිනිසකු විසින් ලැබිය හැකි නිරාමිෂ ආස්වාදය හා බුද්ධත්වය දක්වා වූ උත්තරීතර ආධ්‍යාත්මික පරිපෘෂ්ටියත්, තදනුබද්ධ භාවිකත්වය හා බුද්ධිමය සංවර්ධනයත්, ලබා ගත හැකි විශිෂ්ට සාහිත්‍යයක් ශ්‍රී ලාංකික අප සතු වන බව මැනවින් හඳුනා ගත් බටහිර උගතුන් පවා එකී ගරුත්වය හා කෘතඥතාව ශ්‍රී ලංකාව වෙත පුද කොට ඇත. එපමණක් නො ව එම සර්වඥතාඥාණිකත්වය මුළු මහත් ලෝකයට ම ලබා දීම ජීවිත කාලයක කළ හැකි උත්කෘෂ්ට කර්තව්‍යයක් බව හඳුනා ගත් ඔවුන් එය යුරෝපා රටවලට හඳුන්වා දීමට ක්‍රියා කළ බව ද අප විසින් තේරුම් ගත යුත්තක් වේ. ශ්‍රී ලංකාවේ එවකට විසූ විශිෂ්ට පඬිවරයකු වූ **යාත්‍රාමුල්ලේ ධම්මාරාම** හිමියන්ගෙන් පාලි භාෂාව උගත් **රීස් ඩේවිඩ්ස්** පඬිතුමා එංගලන්තයේ **පාලි මූලාශ්‍රය ග්‍රන්ථ ප්‍රකාශන සංගමය**(Pali Text Society) පිහිටුවා අද දක්වා පමණක් නො ව අනාගතයේ ද මුළු ලෝකයාට ම පාලි භාෂාව හා බුද්ධවචනය ආශ්‍රිත ඥාන සම්භාරය ආධ්‍යාත්මගත කිරීමට ඉඩ සලසා තිබීම මෙයට එක් නිදසුනක් පමණකි. මෙහි වටිනාකම මැනවින් හඳුනාගෙන ඇති බටහිර උගත්හු ඉතා උද්‍යෝගයෙන් හා කැපවීමෙන් යුතු ව මීට සම්බන්ධ හැදෑරීම් මේ වන විටත් සිදු කරමින් සිටිති. ත්‍රිපිටක ධර්මයෙහි ඇතුළත් දාර්ශනික සිද්ධාන්ත පමණක් නො ව භාවනාව හා එමගින් සිදු කෙරෙන මානසික සංවර්ධනය මිනිස් ජීවිතයේ ලැබිය හැකි ලෞකික අලෞකික සියලු පුරුෂාර්ථයන් සාධනය කිරීමෙහි ලා මහඟු පිටිවහලකි. එහෙත් ශ්‍රී ලාංකික අප මෙබඳු වටිනා ඉගැන්වීමක් හා ධර්ම සාහිත්‍යයක් ළඟ තබා ගනිමින් වර්තමානයෙහි අවිඥාණික ව සිටීම බලවත් අභාග්‍යයක සලකුණකි.

ශ්‍රී ලාංකේය සම්බුද්ධ ශාසනය ශෝභමාන කිරීම හා චිරස්ථායී කිරීම සඳහා උගත් බුද්ධිමත් හා ගුණගරුක භික්ෂු භික්ෂුණී පරපුරක් සිටීම අවශ්‍ය වේ. එසේ ම උපාසක, උපාසිකා, ගිහි පිරිස ද ධර්මානුධර්ම ප්‍රතිපන්න විය යුතු ය. මෙම කාර්යය සඳහා නිර්දිෂ්ට මාර්ගය සනිටුහන් වන්නේ පාලි භාෂාවෙන් රචිත ත්‍රිපිටක සාහිත්‍යයේ මිස අන් කිසිදු තැනක නො වේ. එම මාර්ගය සුරක්ෂිත කිරීමත් විවරණය කිරීමත් සඳහා අතීත ශ්‍රී ලාංකික උතුම් මහ සඟරුවන විසින් ජීවිත පරිත්‍යාගයෙන් ඉටු කරන ලද කාර්යය නමස්කාර පූර්වක ව සිහිපත් කළ යුතු ය. එහෙත් වර්තමාන සඟ පරපුරෙන් එම වගකීම හා කාර්යභාරය ගිළිහී ගොස් ඇති බව උකටලී සිතින් මෙනෙහි කිරීමට සිදු වී ඇති බව ද නොවළහා කිව යුතු ය. ශ්‍රී ලාංකේය ථේරවාද සම්ප්‍රදායට අයත් එය සුරක්ෂිත කිරීමට අවශ්‍ය වන අමුද්‍රිත පාලි ටීකා ප්‍රකරණ ග්‍රන්ථාදියෙහි පුස්කොළ හා අත්පිටපත් සිය දහස් ගණනක් මෙතෙක් කිසිවකුගේ අවධානයට පත් නො වී තිබීමත්, ඒවා ඒ ඒ තැන්හි දිරාපත් වෙමින් තිබීමත්, ඇතැම් විට මුදලට විකිණීමත්, යනාදි කරුණු රාශියක් නිසා අපට අහිමි වෙමින් පවතී. මෙයට එක ම හේතුව වන්නේ පාලි භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නො තිබීම හා එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වී ඇති විශේෂයෙන් ත්‍රිපිටක සාහිත්‍යයේ ගැඹුර හා අනේකවිධ වටිනාකම් පිළිබඳ අවබෝධයක් නො තිබීමත් ය.

මෙයට විසඳුම කුමක් ද? එය අන් කිසිවක් නො ව පාලි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ අනාගත පරපුර ප්‍රවීණයන් කිරීම යි. එය කළ හැකි වන්නේ අනුක්‍රමික ව පාලි භාෂාව ඉගෙනීම සඳහා ආධුනිකයන් පුරුදු පුහුණු කිරීමෙන් හා එය වැඩි දුරටත් ප්‍රගුණ කිරීම සඳහා ශිෂ්‍යයන් තුළ උත්තේජනයක් ඇති කිරීමෙනි. ලෝකයේ විශිෂ්ටතම සාහිත්‍යය, දර්ශනය හා ජීවිත විද්‍යාව ඇත්තේ පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ බව පාලි විෂය උගන්වන ගුරුවරයා විසින් මෙන් ම ආධුනිකයා විසින් ද දත යුත්තකි. විශිෂ්ට පර්යේෂණ ක්‍රමයක් හා ගැඹුරු ඥාන සම්භාරයක් අටුවා හා ටීකාවල ඇතුළත් බව ඔවුන් විසින් තේරුම් ගත යුතු ය. ශ්‍රී ලාංකික අපගේ ඉතිහාසය තේරුම් ගත හැක්කේ **මහාවංසය දීපවංසය** ඇතුළු වංසකථා ග්‍රන්ථවලින් හා පාලි අට්ඨකථා ග්‍රන්ථවලිනි. එපමණක් නො ව මෙම සාහිත්‍යයේ **පජ්ජමධු** වැනි කාව්‍ය ග්‍රන්ථ ද, **වුත්තෝදය** වැනි ඡන්දස් ග්‍රන්ථ හා **සුබෝධාලංකාරය** වැනි අලංකාර ග්‍රන්ථ ද, **ජිනවංසදීපමහාකාව්‍ය** වැනි මහාකාව්‍ය ග්‍රන්ථ ද, **මහානෙක්ඛම්මචම්පු** වැනි චම්පු කාව්‍ය ග්‍රන්ථ ද, **බාලාවතාර, රූපසිද්ධි** වැනි ව්‍යාකරණ ග්‍රන්ථ ද, **අභිධානප්පදීපිකාව** හා **එකක්ඛරකොස** වැනි කෝෂ ග්‍රන්ථ ද, **ධම්මනීති, ලොකනීති** වැනි නීති ග්‍රන්ථ ද, **භෙසජ්ජමඤ්ජුසා** වැනි වෛද්‍ය ග්‍රන්ථ ද, **මිලින්දපඤ්හ** වැනි තර්ක ග්‍රන්ථ ද, **වුත්තමාලාසතක සිරිසුමංගලසතක** වැනි ශතක ග්‍රන්ථ ද, **මහානාගකුලසන්දෙසය** වැනි සන්දේශ ග්‍රන්ථ ද, **කල්‍යාණිසිලාලිපි** වැනි ශිලාලේඛන ද, **චක්කවාළදීපනී** වැනි විශ්වය පිළිබඳ ග්‍රන්ථ ද, යනාදි වශයෙන් අනේකවිධ විෂයයන් සම්බන්ධයෙන් පාලි භාෂාවෙන් ලියැවුණු බොහෝ කෘති ඇත. මේ නිසා පාලි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ මනා දැනුමක් ඇති කෙනකු විවිධ ශබ්ද ශාස්ත්‍රයන් පිළිබඳ නිරායාශයෙන් ම අද්විතීය විද්වතකු බවට පත් වේ. එබඳු උගතකු රටක තුන්කාලයට අයත් අගනා වස්තුවක් බව අමුතුවෙන් කිව යුත්තක් නො වේ. තව ද අප විසින් දත යුත්තක් වේ. එනම් කෙනකු තුළ පවතින උගත්කම පමණක් වටිනා අබරණයක් නො වේ. එයට හැදිච්චකම ද එකතු විය යුතු ය. පාලි පොතපත කියවීමෙන් මිනිසකුගේ ආධ්‍යාත්මයෙහි නො සිතිය හැකි තරම් ආලෝකයක් විහිදේ. ඔහු ඉතා උසස් මිනිසකු වේ. තථාගත දේශනාව ඇතුළත් මෙම පොතපත කියවීමෙන් ලැබෙන දැනුම හා හැදියාව විස්මය ජනක වන්නේ එහෙයිනි.

**යාවත්කාලීන වීම**

මූලික පිරිවෙන් සඳහා නිර්දේශිත ග්‍රන්ථ මාලාව ඉහත කී ප්‍රධාන අරමුණු ඉලක්ක කර ගත් කෘති සමුදායකි. ඒවා මැනැවින් අධ්‍යයනය කිරීමෙන් පසු ආධුනිකයකුට පාලි භාෂාවෙන් ලියැවී ඇති කවර කෘතියක් වුව ද කියවා තේරුම් ගැනීමට අවශ්‍ය මූලික පදනම ලැබෙනු ඇත. එහි සැකසුම හා එය කළ යුතු ආකාරය පිළිබඳ පාලි භාෂාව උගන්වනු ලබන ගුරුවරයාට මනා අවබෝධයක් තිබිය යුතු බව මුලින් ම තේරුම් ගන්න. අධ්‍යාපනය යන්න මුළුමනින් ම පාහේ රැ දී ඇත්තේ ගුරුවරයා මත ය. ඔහුගේ කාර්යය වන්නේ නො දන්නා දෙය දන්නා දෙයක් බවට පත් කිරීමත් නො හැක්කා හැකි අයකු බවට පත් කිරීමත් ය. එබැවින් ගුරුවරයා නො දන්නෙක් හෝ හැකියාව නැත්තෙක් නො විය යුතු ය. ගුරුවරයා මුලින් ම පූර්ව සූදානමකින් ශිෂ්‍යයා පුහුණු කිරීමේ කාර්යයෙහි නිරත විය යුතු ය. කිසි විටෙකත් ගුරුවරයා නො දන්නකු හෝ නො හැකියාව ඇත්තකු හෝ බව ශිෂ්‍යයාගේ මනසට සම්ප්‍රේෂණය නො කිරීමට වග බලා ගත යුතු ය. මේ සඳහා ගුරුවරයකුට ඇති ප්‍රබලතම ශක්තිය වන්නේ ඔහු සතු ඥානය හා එම ඥානයෙහි යාවත්කාලීන බව යි. එබැවින් පාලි ගුරුවරයා දිනපතා පාලි භාෂාව සම්බන්ධයෙන් තම දැනුම පෝෂණය කර ගත යුතු අතර ම ඒ සම්බන්ධ අලුතෙන් ම ලියැවෙන පොතපත කියවීම, අලුත් වචන හා එහි සංවර්ධනීය

ලක්ෂණ, නවතම ඉගැන්වීම ක්‍රම යනාදිය පිළිබඳ අවබෝධයෙන් සිටිය යුතු ය. එය මූලික අවශ්‍යතාවකි.

**ඉගැන්වීම් ක්‍රම**

ගුරුවරයාගේ ඉගැන්වීමේ කාර්යය සිදු විය යුතු ආකාරය PPP Theory ලෙස වර්තමාන අධ්‍යාපනඥයන් විසින් පෙන්වා දී ඇත. එය 1. Presentation (ප්‍රස්තුතීකරණය), 2. Practice (භාවිතය) 3. Production (නිෂ්පාදනය) යනුවෙන් දක්වා ඇත.

පළමු වන පියවර වන **ප්‍රස්තුතීකරණයේ** දී කෙරෙනුයේ නියමිත පාඩමට අදාළ දත්ත ගෙනහැර දැක්වීම යි. මෙය ගුරුවරයා විසින් කළ යුත්තකි. ඔහු විසින් විවිධ ක්‍රමෝපායන් යොදා ගනිමින් අදාළ පාඩම ශිෂ්‍යයාගේ මනසට කාවදින ලෙස විස්තර කර දිය යුතු ය. ඒ සඳහා අදාළ මාතෘකාව නිර්වචනය කිරීම, විස්තර කිරීම, නිදසුන් දැක්වීම, පුවරුවක පෙන්වීම, උපමා රූපක චිත්‍ර සටහන් ගෙන හැර දැක්වීම, සංයුක්ත තැටි හෝ වීඩියෝ දර්ශන ඉදිරිපත් කිරීම, අතීතකථා ජනකථා වර්තමාන සිද්ධි මගින් තහවුරු කිරීම යනාදි විවිධ ක්‍රියාකාරකම් කළ හැකි ය. මෙකී කවරාකාර විධියකින් හෝ අදාළ ඉදිරිපත් කිරීම චිත්තාකර්ෂණීය ලෙස සිදු කළ යුතු ය. මෙහි දී ගුරුවරයාගේ කාර්යභාරය 90%ක් වන අතර ශිෂ්‍යයාගේ සහභාගිත්වය සිදු වනුයේ 10%කිනි.

දෙවන පියවර වන **භාවිතයේ** දී එකී පාඩමට අදාළ ප්‍රායෝගික භාවිතයන් නැතහොත් පුරුදු පුහුණු කිරීම් ශිෂ්‍යයා ලවා සිදු කරවිය යුතු ය. එහි දී ශිෂ්‍යයාගේ සහභාගිත්වය 60%ක් වන අතර ගුරුවරයා විසින් 40%ක දායකත්වයක් සැපයිය යුතු ය. ප්‍රශ්න කිරීමට හා තම අදහස් ප්‍රකාශ කිරීමට හා ලියා ගැනීමට අවස්ථාව දීම, සජ්ඣායනා කරවීම, අභ්‍යාස කරවීම යනාදි ක්‍රියාකාරකම් කරවීම මෙහි දී සිදු විය යුතු ය. ගුරුවරයා විසින් මඟ පෙන්වීම කළ යුතු ය. අවසානයේ දී ගුරුවරයා විසින් ශිෂ්‍යයන්ගේ පොදු වැරදි හඳුනා ගනිමින් ඒවා නිවැරැදි කරවිය යුතු ය.

තුන් වන පියවර වන **නිෂ්පාදනයේ** දී ශිෂ්‍යයාගේ අවබෝධය ඔහුගේ ක්‍රියාකාරකම්වලින් ප්‍රකාශ කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතු ය. මෙහි 90%ක් ම සිදු කරනු ලබනුයේ ශිෂ්‍යයා විසින් වන අතර, ගුරුවරයාගේ කාර්යභාරය 10%කි. එහි දී ඔහු අදාළ පාඩම සම්බන්ධයෙන් කරුණු දක්වයි. උදාහරණ දෙමින් පැහැදිලි කරමින් ලිවීම කථා කිරීම නිර්මාණ ගෙනහැර දැක්වීම සිදුකෙරේ.

බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයෙහි ඊට වඩා අතිශයින් ම හරවත් අනුක්‍රමයක් දක්වා ඇත. **සුචිපුලිභා මුත්තො කථං පණ්ඩිතො භවෙය්‍ය** යනුවෙන් අර්ථකථාචාරීහු **සු-චි-පු-ලි-භා** යන මෙයින් තොර ව උගතෙකු විය නො හැකි බව කී හ.

**සු** යන්නෙන් අදහස් වන්නේ **සුණාති** (Listens - අසයි) යන්න යි. ඒ අනුව මුලින් ම ශිෂ්‍යයාට පාඩම අසා ගෙන සිටීමට සැලැස්විය යුතු ය.

**චි** යන්නෙන් අදහස් වන්නේ **චින්තෙති** (Thinks - සිතයි) යන්න යි. දෙවනු ව ඇසූ පාඩම පිළිබඳ යමක් සිතීමට හා මතකයෙහි රඳවා ගැනීමට ඉඩ සැලසිය යුතු ය.

**පු** යන්නෙන් අදහස් වන්නේ **පුච්ඡති** (Questions - විමසයි) යන්න යි. ඒ අනුව ශිෂ්‍යයාට යම් යම් දේ තමාගෙන් (ගුරුවරයාගෙන්) ප්‍රශ්න කිරීමට අවස්ථාව සැලසිය යුතු ය.

**ලි** යන්නෙන් අදහස් වන්නේ **ලිඛති** (Writes - ලියයි) යන්න යි. ලේඛනය යි.

ලිවීම, කියැවීම මෙන්ම අදාළ දත්ත ඒකරාශී කර ගැනීමට ඉඩ සැලසීම මෙයින් අදහස් කෙරේ. එනම් තමා උගත් දේ දීර්ඝකාලීන මතකයක් කරා රැගෙන යාම පිණිස ලියා තබා ගැනීම ඇතුළුව ඉදිරි ප්‍රයෝජනය සඳහා අවශ්‍ය අභ්‍යාස කිරීමට පෙළඹවීම මෙයින් අදහස් කෙරේ.

**භා** යන්නෙන් අදහස් වන්නේ **භාසති** (speaks/Expresses - ප්‍රකාශ කරයි) යන්න යි. අවසාන වශයෙන් ශිෂ්‍යයාට තමා ඉගෙන ගත්, අවබෝධ කර ගත් දේ වාචික ව හෝ නිර්මාණාත්මක ව හෝ වෙනත් යම් විධියකින් හෝ ප්‍රකාශයට පත් කිරීමට හැකි වෙයි.

මේ අනුව බෞද්ධ සම්ප්‍රදාය සතු ඉගැන්වීම් ක්‍රම කෙතරම් යාවත්කාලීන ද යන්න මැනැවින් තහවුරු වෙයි. ගුරුවරයකු වශයෙන් ඔබට අපට ම අනන්‍ය වූ මෙම ක්‍රමවේදය අභිමනින් යුතු ව අනුගමනය කළ හැකි ය.

තව ද බුදුන් වහන්සේ හඳුන්වනු ලබන විශේෂණවාචී එක් පර්යාය නාමයක් වන්නේ **සත්ථා** (teacher or instructor) යන්න යි. ඒ අනුව උන්වහන්සේ ද ගුරුවරයෙකි, නැතහොත් උපදේශකයෙකි, එසේත් නැත්නම් මාර්ගය පෙන්වන්නෙකි. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමවලින් එකක් දක්වෙන පාඨයක් බොහෝ සූත්‍රාන්ත දේශනාවල දක්නා ලැබේ. එනම් **අහං ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි** යන්න යි. **මම කියමි** (tell) **දේශනා කරමි** (preach) **පණවමි** (declare/appoint) **පිහිටුවමි** (establish) **විවරණය කරමි** (explain) **බෙදා දක්වමි** (analyse) **ගැටලුවෙන් එතෙර කරමි** (make clear) යනු එහි තේරුම යි.

1. **ආචික්ඛති** - ගුරුවරයා පළමු ව පාඩම සම්බන්ධයෙන් සුහදශීලී යමක් කියයි.
2. **දෙසෙති** - තමාගේ කීමට ගරුත්වයක් ආරෝපණය වන පරිදි තම භාෂාව හසුරුවයි. එය දේශනාවක් මෙන් ගැඹුරු පිළිගැනීමක් සහිත වූවකි.
3. **පඤ්ඤාපෙති** - එම පාඩම සම්බන්ධයෙන් වැදගත් ම මූලික සංකල්පයක් දක්වයි. නිදසුනක් ලෙස **සමාස** ගැන යැයි සිතන්න. 'සමාසවලින් පද රාශියක් එකතු කොට කෙටිපදයක් සාදා අදහස් රාශියක් කෙටියෙන් කිව හැකි ය' යනුවෙන් **පැණවීමක් නැතහොත් ස්ථිර මතයක්** දක්විය හැකි ය. වෙනත් විධියකින් කිවහොත් **සමාසො පද සංඛෙපො** යනුවෙන් පාඩමට ප්‍රවේශයක් ලබාගත හැකි ය.
4. **පට්ඨපෙති** - අදාළ කරුණු දක්වමින් ශිෂ්‍යයා තුළ විශ්වාසය හා රුචිකත්වය ගොඩ නගමින් එකී ඉගැන්වීම තුළ ශිෂ්‍යයා පිහිටුවයි.
5. **විවරති** - විස්තර විවරණ දක්වමින් කරුණ පැහැදිලි කරයි.
6. **විභජති** - විශ්ලේෂණය කරයි. බෙදා දක්වයි. සමාස නම් එහි විග්‍රහ වාක්‍ය **මහන්තො ච සො පුරිසො මහාපුරිසො** (මහත් වූයේත් ඔහු ය පුරුෂයකු වූයේත් ඔහු නුයි මහාපුරුෂ නම් වේ.) යනාදි නයින් විග්‍රහ වාක්‍ය දක්වීම එයින් දිගු අදහසක් කෙටි වී ඇති ආකාරය, එබඳු පද භාෂාවේ යෙදී ඇති ආකාරය, ඒවා නාමපද මෙන් විභක්තිවල වරනැගෙන ආකාරය, එයින් අර්ථය වෙනස් වන අයුරු, භාෂාව අලංකාරවත් හා ඕජෝ ගුණයෙන් යුක්ත වන ආකාරය යනාදිය පැහැදිලි කරයි. අනතුරු ව සමාස බෙදා දක්වමින් 'බෙදා දක්වා හෙවත් විභජනය කොට' ඒ සම්බන්ධයෙන් පරිසමාප්ත දැනුමක් ලබා දෙයි.
7. **උත්තානීකරොති** - ගැටලුවෙන් නිදහස් කෙරේ. ශිෂ්‍යයා සමාස පිළිබඳ තිබූ සියලු ගැටළුවලින් නිදහස් කෙරේ.

බුදුදහම තුළ පවත්නා මෙවන් සුවිශේෂ ක්‍රමවේද ඕනෑ ම කාලයක කවර ම හෝ විෂයකට කෙතරම් උචිත ද යන්න විමසා බැලීම වටී. තමා උගන්වනු ලබන සෑම පාඩමක දී ම මෙබඳු පැහැදිලි රාමුවක් තුළ හිඳිමින් සැලසුම් සහගත ව කරුණු ඉදිරිපත් කිරීම ගුරුවරයා සතු වගකීමකි.

**අවධානය රඳවා ගැනීම**

ඉගැන්වීම වූ කලී හැම අයුරකින් ම සැලසුම් සහගත, විධිමත් හා යහපත් පරිදි සිදු විය යුතු කාර්යයකි. බුදුරජාණන් වහන්සේගේ කරුණු ගෙනහැර දැක්වීමේ ස්වභාවය විවරණය කෙරෙන පද කිහිපයක් පෙළෙහි දක්වා ඇත. එම පද **සං** (යහපත් ලෙස) යන උපසර්ගය පූර්වක වන පරිදි යොදා තිබීම විශේෂයක් වේ.

**සන්දස්සෙති** - කරුණු මනා ව දක්වයි.

**සමාදපෙති** - එම කරුණු කෙරෙහි මනා විශ්වාසයක් ගොඩනගයි.

**සම්පහංසෙති** - ශිෂ්‍යයා තුළ ඉගැන්වූ කරුණු කෙරෙහි සතුටක් ඇති කරවයි.

**සමුත්තෙජෙති** - ඉගෙනීම කෙරෙහි උත්තේජනයක් ඇති කරවයි.

ගුරුවරයා විසින් කරනු ලබන කාර්යය විධිමත් වූ ද, මානසික සතුට උපදවන්නා වූ ද, ශිෂ්‍යයාට වැඩිදුර හැදෑරීම සඳහා උත්තේජනයක් ඇති කරවන්නා වූ ද, ක්‍රියාවලියක් විය යුතු ම ය. ශිෂ්‍ය අවධානය දිනා ගැනීම කිසි සේත් ඕලාරික පහත් ග්‍රාම්‍ය කථා ආදිය කීමෙන් සිදු නො කළ යුතු ය. එය බෞද්ධ ක්‍රමවේදය නො වේ. එසේ ම එවැනි දෑ තුළ ස්ථිරසාර දීර්ඝකාලීන වටිනාකමක් ද නැත. ගුරුවරයාගේ ශිෂ්ට සම්පන්න බව හා ප්‍රියශීලී හෘදයාංගම භාෂාව, දයාබරිත බව, පාඩමට අදාළ ව ම කරුණු දැක්වීම, පැහැදිලි හා නිරවුල් උච්චාරණය, සරල ඉගැන්වීම් ක්‍රම, ආකර්ෂණීය ශිෂ්‍ය ක්‍රියාකාරකම් යනාදිය ශිෂ්‍ය අවධානය රඳවා ගැනීමේ හේතු ය. බුදුරජාණන් වහන්සේ එවන් ආදර්ශමත් ඉගැන්වීමක නිරත වූ ශාස්තෘවරයෙකි.

**ව්‍යාකරණය හා පරිවර්තනය**

මූලික පිරිවෙන් පාලි විෂය ග්‍රන්ථ මාලාවෙහි සෑම පාඩමක් ම සැකසී ඇත්තේ කිසියම් ව්‍යාකරණාංගයක් ඉගැන්වීමට අදාළ වන පාලි පාඨයක් ප්‍රස්තුත කොට ගනිමිනි. එම පාඨ හුදු පරිවර්තනයක් කිරීම පමණක් අරමුණු කොට ගත් ඒවා නො වේ. බොහෝ විට පාලි ඉගෙනීම සඳහා අනුගමනය කරනුයේ ව්‍යාකරණ ඉගෙනීමත් පරිවර්තනය කිරීමත් යන ක්‍රම දෙක යි. මෙම ක්‍රමය 18 වන සියවස දී පමණ ක්‍රියාත්මක වූ දැනට යල් පැනගිය ක්‍රමයකි. ව්‍යාකරණය හා පර්වර්තනය කිරීමේ ක්‍රමවේදයෙන් කිසිදු ජීව භාෂාවක් සාර්ථක ව ඉගෙන ගත නො හැකි ය. එහෙයින් සෑම පාඩමක් ම ආරම්භ කෙරෙන පාලි ඡේදය දෙස ඊට වඩා පුළුල් ඇසකින් බැලිය යුතු ය. පළමු වන ශ්‍රේණියේ සිට පස් වන ශ්‍රේණිය දක්වා සෑම පෙළ පොතක් ම සැකසී ඇත්තේ අනිවාර්යයෙන් ම දත යුතු ව්‍යාකරණාංග කිහිපය කෙරේ දැනුම පුළුල් වන පරිදි ය. නිදසුනක් ලෙස සෑම පන්තියකට ම අදාළ ග්‍රන්ථයේ මුල් ම පාඩම වන්නේ පාලි අක්ෂර මාලාව යි. දෙවැන්න නාමපද යි. සෙසු පාඩම් ද එසේ ම ය. ඒවා කිසියම් රටාවකට සැකසී ඇත. එම පාඩම් අනුක්‍රමයෙන් ශිෂ්‍යයාගේ දැනුම දියුණු කිරීම අරමුණු කොට සකසා ඇති බව පාඩම් සැසඳීමෙන් වටහා ගන්න. එය ඒ ඒ පන්තියේ දී තම අවධානය වැඩි වශයෙන් යොමු කළ යුත්තේ කවර විෂය සීමාවක් කෙරෙහි ද යන්න අවබෝධ කර ගැනීමට ඔබට උපකාරී වනු ඇත. එකී සෑම පාලි ඡේදයක් ම මැනවින් උච්චාරණය කිරීම, ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දීම, එයින් ලැබෙන ජීවිත අවබෝධය සාකච්ඡා කිරීම, කාව්‍යමය හා සාහිත්‍යමය ලක්ෂණ පෙන්වා දෙමින් රසාස්වාදය කිරීම, සමාජ සංස්කෘතික හර පද්ධතීන් විවරණය කිරීම, ආගමික කාර්යයන් සඳහා යොමු කරවීම, නිර්මාණාත්මක වාක්‍ය රටා සෑදීමට යොමු කරවීම යනාදිය ඒ ඒ පන්තියේ ශිෂ්‍යයන්ගේ වයස් මට්ටම් ආදිය කෙරෙහි සැලකිල්ලක් දක්වමින් සිදු කළ හැකි ය. ඒ සඳහා උපකාර වන මග පෙන්වීම් පාඩම

අවසානයේ අභ්‍යාස මගින් පෙන්වා දී ඇත. මෙයින් අපේක්ෂිත කාර්යය වන්නේ අනුක්‍රමික ව ශිෂ්‍යයාගේ දැනුම මෙන් ම හදවත ද පෝෂණය කිරීම යි.

සෑම භාෂාවක ම ව්‍යාකරණය වූ කලී ශිෂ්‍යයන් විසින් ඉතා අපහසු යැයි සලකනු ලබන විෂය පරිපථයක් වේ. එහෙත් එය සත්‍යය නො වේ. භාෂාවේ ඇතැම් රීති අප ඉගෙන ගෙන ඇත්තේ කිසියම් ව්‍යාකරණ කෘතියකින් නො වේ. ඒවා බොහෝ විට ඉගෙන ගන්නේ පොතපතෙහි යෙදී ඇති ආකාරය බහුල වශයෙන් දැකීමෙනි. ඒ අනුව පොතපත වැඩි වශයෙන් කියවීම, නිවැරදි ලෙස උච්චාරණය කිරීම, පරිවර්තනය කිරීම, අරුත් තේරුම් ගැනීම යනාදියෙන් එහි ශෛලිය හා භාෂා රීතිය හඳුනා ගත හැකි ය. ඒ අනුව කෙනකුට ව්‍යාකරණ ඉගෙනීමකින් තොර ව වුව ද භාෂාවක් හැසිරවීමේ ශක්තිය ලැබේ. අනෙක් කිසිදු බුද්ධ දේශනාවක ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දී නැත. එසේ ම ව්‍යාකරණය ඉගෙනීම සඳහා ශ්‍රාවකයන් දිරිමත් කළ අවස්ථාවක් ද නැත. ව්‍යාකරණයෙහි ප්‍රවීණ වූ කිසියම් ශ්‍රාවකයකු අග තනතුරු දීම් ආදියෙන් ඇගයීමක් කළ බවට ද සාධක නැත. එහෙත් ව්‍යාකරණ හැදෑරීමකින් තොර ව බුද්ධවචනය වටහා ගැනීමෙන් මාර්ග ඵල අවබෝධ කොට ගෙන ඇත. එයින් තහවුරු වන්නේ ව්‍යාකරණය පිළිබඳ අනවශ්‍ය වටිනාකමක් දීමට මුල් කාලීන බෞද්ධ සම්ප්‍රදාය තුළ උදෙ‍යා්ගයක් නො පැවති බව යි. එබැවින් භාෂාව ඉගැන්වීමේ දී ශිෂ්‍යයා කෙරෙහි ව්‍යාකරණය සම්බන්ධයෙන් අනවශ්‍ය භීතියක් ඇති නො කරවීමට ගුරුවරයා විසින් වග බලාගත යුතු ය.

ඉහත කී අදහස දැඩි ව ගෙන වරදවා වටහා නො ගත යුතු ය. බුද්ධකාලීන ශ්‍රාවකයන් ව්‍යාකරණය නො දත් බවත් එහෙයින් මෙ කල ද ව්‍යාකරණය දැන ගැනීම අවශ්‍ය නො වන බවත් තහවුරු කිරීමට උත්සුක නො විය යුතු වන්නේ ඔවුන් සංස්කෘත භාෂාව දැන සිටි බැවින් පාලි භාෂාවේ භාවිතය ඔවුන්ට වහා වටහා ගත හැකි වූ හෙයිනි. එනිසා ඔවුන්ට ව්‍යාකරණමය දැනුමක් නො තිබූ බව කීම නිවැරැදි නො වේ. අපට ද සංස්කෘත භාෂා ඥානය මැනවින් ඇත්නම් පාලි ව්‍යාකරණ සිද්ධාන්ත ද ඒ අනුව බොහෝ සෙයින් වටහා ගත හැකි ය. මේ නිසා ව්‍යාකරණය සම්බන්ධයෙන් පහත දැක්වෙන අපගේ සාම්පදායික අදහස ද සම්භාවනීයත්වයෙන් පිළිගත යුත්තකි.

**යො නිරුත්තිං න ජානාති - ජානාති පිටකත්තයං**

**පදෙ පදෙ විකංඛෙය්‍ය - වනෙ අන්ධගජො විය**

**'යමෙක් ව්‍යාකරණය නො දනී ද, පිටකත්‍රය දනී ද, ඔහු වනයෙහි සැරිසරන අන්ධ ඇතකු මෙන් පියවරක් පාසා සැක කරයි'** යනු එහි දළ අදහස යි. මෙයින් අදහස් වන්නේ ව්‍යාකරණය නො දනී නම් බුද්ධවචනය හැදෑරීමේ දී නිතර ම ගැටලුවලට මුහුණ පාන බව යි. එයින් ගම්‍ය වන්නේ ව්‍යාකරණ ඥානයෙන් තොර ව බුද්ධවචනය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම අපහසු බව යි. මේ නිසා ව්‍යාකරණ ඥානය බුද්ධවචනය හැදෑරීමේ අත්‍යවශ්‍ය අංගයක් වේ. ලෞකික විෂයයන් හැදෑරීම සඳහා අප විසින් යොදා ගනු ලබන ඉංග්‍රීසි සිංහල භාෂාවලට වඩා බුද්ධවචනය ප්‍රකාශ වන පාලි භාෂාව වෙනස් ය. එය කිසි සේත් සෙසු භාෂාවලට සම කළ නො හැකි ය. ඊට හේතුව එය **සාත්ථ සබ්‍යඤ්ජන** ගුණයෙන් යුක්ත වීමත් ශබ්ද ධ්වනි ආශ්‍රිත ශක්ති විශේෂයන් පැවතීමත් නිසා ය. එම නිසා තනි අක්ෂරයක් වුව ද වැදගත් ය. වෙනත් භාෂාවල අක්ෂරයක් වැරදුණු පමණකින් අර්ථයට මහත් හානියක් සිදු නො වේ. එහෙත් පාලියේ අක්ෂරයක් වැරදුණ හොත්

එයින් අර්ථයට සිදු වන හානිය විශාල ය. එබැවින් ආගමික භාෂාවක් වන පාලියේ සියලු භාෂාත්මක ප්‍රයෝග සැලකිල්ලෙන් භාවිත කළ යුතු වේ. පාලි භාෂාවේ දී ව්‍යාකරණය වැදගත් වන්නේ එහෙයිනි. මෙම වචනවල තේරුම බලන්න. **අත්ථි ලිඞගං (ලිංගයක් ඇත) අත්ථිලිඞ්ගං (ලිංගත්‍රයක් නැත), මච්චො (මිනිසා) මච්ඡො (මත්ස්‍යයා), අච්චි (ගිනිදැල්) අච්ඡි (ඇස)** යනාදි වශයෙනි. එක් අක්ෂරයක වෙනස නිසා අර්ථමය වශයෙන් සිදුවන වෙනස එයින් පෙනේ. ඇතැම් පද ලියන්නේ එක සමාන ව වුවත් උච්චාරණයෙන් වෙනස පෙන්නුම් කළ යුතු ය. **අජහිතො** යන්නෙහි තේරුම **'අජානං හිතො අජහිතො'** යනුවෙන් තත්පුරිස සමාස පදයක් ලෙස ගෙන **එළුවන්ට හිතවත් වූ තැනැත්තා** යනුවෙන් අර්ථ දැක්විය හැකි ය. එසේම එයට **අජහිතො** යන්නෙහි **අත් නො හළ තැනැත්තා(න ජහිතො)** යනුවෙන් ද අරුත් කිව හැකි ය. මේ නිසා පාලි-සංස්කෘත වැනි භාෂාවල උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ හික්මවීමක් ද සිදු කෙරේ. එබැවින් කළයුතු වන්නේ කුමක් ද යන්න ඉතා පැහැදිලි ය. එනම් ව්‍යාකරණය පිළිබඳ නිරවුල් දැනුමක් තිබීම භාෂාවක් හැදෑරීමේ දී අත්‍යවශ්‍ය අංගයක් බව ශිෂ්‍යයාට අවබෝධ කර දීම හා ඒ සඳහා ඔහු තුළ උත්තේජනයක් ඇති කිරීම යි.

ව්‍යාකරණයේ සරල බව

පාලි භාෂාව මැනවින් හැදෑරීමට අවශ්‍ය වන පාලි ව්‍යාකරණය කෙනකුට වටහා ගත නො හැකි තරමට සංකීර්ණ වූවක් හෝ පුළුල් වූවක් හෝ දුෂ්කර වූවක් හෝ නො වේ. එහි විෂය සීමාව ව්‍යාකරණාංග කිහිපයකට පමණක් සීමා වේ. ඒ අනුව යමකුට අවම වශයෙන් **අක්ෂර මාලාව, නාමපද, සන්ධි, සමාස, තද්ධිත, කාරක, කිතක හා ආඛ්‍යාත** යන ව්‍යාකරණාංග 08 පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇත්නම් ඔහුට පාලි භාෂාව මැනවින් හැසිරවීමේ හැකියාවක් ලැබේ. පාලි විෂය මූලික පිරිවෙන් පොත් පෙළෙහි මෙම ව්‍යාකරණාංග කිහිපය ඉතා විධිමත් ව හා සර්ව සම්පූර්ණ ලෙස ඉගැන්වීමට හැකි වන පරිදි කරුණු පෙළ ගස්වා ඇත. මෙය ගුරුවරයා විසින් මෙන් ම ශිෂ්‍යයා විසින් ද මනා ව තේරුම් ගත යුත්තකි. මේවා ඉගැන්වීමේ දී ගුරුවරයකු වශයෙන් ඔබ තුළ ඉතා පිරිසිදු දැනුමක් තිබීම අතිශය වැදගත් බව තේරුම් ගන්න.

ව්‍යාකරණය ඉගෙනීම යනු භාෂාවක් භාවිත කරන ආකාරය දැන ගැනීම යි. විශේෂයෙන් එහි වාක්‍යයක පද යෙදීමේ රටාව තේරුම් ගැනීම යි. එය ශිෂ්‍යයාට පහසුවෙන් ග්‍රහණය කරගත හැකි වන පරිදි ගොනු කොට දැක්වීමට දක්ෂ ගුරුවරයා සමත් වෙයි. ඔහු ඒ සඳහා විවිධ උපාය මාර්ග අනුගමනය කරයි. පාඩමක මුලින් ම දක්වා ඇති පාඨයක් ශබ්ද නගා කියැවීම, සජ්ඣායනා කිරීම, පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීම ආදි ක්‍රමවලින් ශිෂ්‍යයා වාග් කෝෂය දියුණු කර ගනී. නිවැරදි උච්චාරණ රටාව හා නිවැරදි ලේඛනය හඳුනා ගනී. තිත් කොමා ආදිය නිසි පරිදි තැබිය යුතු ස්ථාන තේරුම් ගනී. පාඨයේ අර්ථය වටහා ගනී. මෙබඳු ප්‍රයෝජන රාශියක් සිදු වේ. මේවා සියල්ල ම ව්‍යාකරණට අයත් කරුණු ය. ඒ අතර ව්‍යාකරණ ග්‍රන්ථවල උගන්වනු ලබන ඉහත කී මාතෘකා ගැන ද ගුරුවරයා සිහිපත් කරයි. තමා ඉගෙන ගත් ව්‍යාකරණ සිද්ධාන්තය එකී පාඨය තුළින් ශිෂ්‍යයා මෙනෙහි කරන අතර එහි අපැහැදිලි බවක් වේ නම් ඔහු විසින් ප්‍රශ්න කරනු ඇත.

ගුරුවරයා වූ කලී සම්පාදකයෙකි (provider). ඔහු සියල්ල සපයන්නෙකි. මෙම කාර්යය වඩා සාර්ථක ව කළ හැකි වන්නේ විෂය පිළිබඳ යාවත්කාලීන දැනුමක් සහිත ව ගුරු භූමිකාවෙහි සිටින කෙනකුට පමණකි. ගුරුවරයා සිතිය යුත්තේ පියෙකු දරුවන් කෙරෙහි සිතන ආකරයට බව

බුදුරජාණන් වහන්සේ වදාළේ එහෙයිනි. එහෙයින් පොතෙහි දී ඇති පාඩමට අදාළ කරුණු පිළිබඳ පමණක් නො ව තත් විෂය සම්බන්ධ අනෙකුත් කරුණු පිළිබඳ ද විශේෂඥ දැනීමක් තිබීම ගුරුවරයකුට ඉගැන්වීමේ දී අතිශය ප්‍රයෝජනවත් වේ. නිදසුනක් ලෙස ආධුනිකයකු අක්ෂර මාලාව පිළිබඳ දත යුත්තේ එහි මූලික කරුණු කිහිපයකි. ඒ අනුව ඔහු භාෂාව මැනවින් භාවිත කරයි. එහෙත් ගුරුවරයා අක්ෂර මූලික කොට ගෙන භාෂාවක ශබ්ද විද්‍යාත්මක ලක්ෂණ ද හැදෑරීමට හැකි බව දැන සිටිය යුතු ය. නිදසුනක් ලෙස **චතුහි වාතෙහි අසම්පකම්පියො** යනුවෙන් යෙදිය හැකි පාඨය **චතුබ්භි වාතෙහි අසම්පකම්පියො** යනුවෙන් යොදා ඇත්තේ ශබ්ද විද්‍යාත්මක අවශ්‍යතාවක් නිසා ය. එකී යෙදුමෙහි ශබ්ද ධ්වනියක් ඇත. එහෙයින් ම එයින් කාව්‍යමය ගුණයක් ද ප්‍රකාශ වේ. අනෙක් අතින් මෙහි සංස්කෘතයෙහි බලපෑමක් ද විද්‍යමාන වේ. එහෙයින් ම එම ප්‍රයෝගය ඓතිහාසික ව්‍යාකරණය අනුව ද විශ්ලේෂණය කළ හැකි ය. මෙබඳු භාවිතයන් පාලියෙහි සුලබ වන හෙයින් ඒවා අධ්‍යයනය කිරීම ද භාෂාවක් පිළිබඳ ගැඹුරු විඤ්ඤාණයක් ඇති වීමට ඉවහල් වේ. අනෙක් අතින් පාලියේ එක ම තනි අක්ෂරයක වුව ද අරුත් කිහිපයක් ඇත. 'බ' යන අක්ෂරය **අහස, හිස්** යන අර්ථ ද්වයක් දෙයි. ඒ අනුව **බෙ (අහසෙහි), බග (කුරුල්ලා), බයං (ක්ෂය වීම හෝ නිවන)** යනාදි විවිධ වචන නිර්මාණය වේ. මේ නිසා ආධුනිකයකුට ඉගැන්වීමෙහි නිරත වන ගුරුවරයාට ශිෂ්‍යයා ඉදිරියෙහි තම දැනුම ප්‍රකාශ කිරීමට එයින් මහත් පිටිවහලක් ලැබේ.

ගුරුවරයා විෂය ප්‍රවීණයකු වේ නම් ඔහුට අදාළ පාඩමට ඇතුළත් විය යුතු කරුණු මනා ව පෙළගස්වා ශිෂ්‍යයාට වැඩිදුර ඉගෙනීමට මංපෙත් විවර කර දිය හැකි ය. නිදසුනක් ලෙස පාලියෙහි **කාරක විභක්ති** ප්‍රයෝග භාවිතය දෙස බලන්න. එහි දක්වා ඇත්තේ විභක්තියට අදාළ රීති කිහිපයක් පමණකි. **සමග** යන අර්ථය දීමට යොදන **සහ, සද්ධිං** යන නිපාත පද තතියා විභක්ති නාම පද සමඟ යෙදිය යුතු ය යන්න රීතියකි. එසේ ම **අතුරෙන්/අතරින්/අතර** යන අදහස පැවසීමට නාම පදය ඡට්ඨි හෝ සත්තමී බහුවචනයෙන් යෙදිය යුතු බව කාරක ප්‍රයෝගයකි. ඒ අනුව **ප්‍රඥාවන්තයන් අතුරෙන්** යැයි පැවසිය යුතු විට **පඤ්ඤාවන්තානං** හෝ **පඤ්ඤාවන්තෙසු** යැයි යෙදිය යුතු ය. මෙම දැනුම තරමක් වැඩුණු දැනුමක් සහිත ශිෂ්‍යයකු විසින් දැන ගෙන තිබීම ප්‍රමාණවත් ය. එහෙත් ගුරුවරයකු විසින් තම දැනුම මීට ද වඩා පුළුල් කොට ගෙන තිබිය යුතු ය. **සබ්බං රසං ධම්මරසො ජිනාති** යන්නෙහි තේරුම **'සියලු රස අතුරෙන් ධර්ම රසය ජය ගනියි'** යන්න යි. එම වාක්‍යයෙහි ඡට්ඨි හෝ සත්තමී රීතිය ක්‍රියාත්මක වී ඇද්ද? නැත. එයින් පෙනෙනුයේ එහි **අතුරෙන්** යන අදහස ප්‍රකාශ කිරීමට **දුතියා** විභක්තිය ද යෙදී ඇති බව යි. ගුරුවරයා මෙය දනී නම් ඔහුට ඉගැන්වීමේ කාර්යයයේ දී වඩාත් ආත්ම විශ්වාසයෙන් යුතු ව අදාළ ව්‍යාකරණ සිද්ධාන්තය ඉගැන්විය හැකි ය. ශිෂ්‍යයකු යම් අවස්ථාවක එබඳු ගැටලු ගැන ප්‍රශ්න කළ හොත් නිවැරදි පිළිතුරක් සැපයීමට හැකි වීම, ගුරුවරයාගේ සුවිශේෂ දැනුම තුළින් ශිෂ්‍යයා වැඩිදුර සෙවීමට පෙළඹවීම, අතිරේක පොතපත කියවීමට පෙළඹවීම, විශ්ලේෂණ විමර්ශන හා චින්තන ශක්තිය දියුණු කිරීම, අදාළ පාඩම සිහි කල්පනාවෙන් නැවත නැවතත් අධ්‍යයනය කිරීමට උත්තේජනයක් ඇති වීම ආදි ප්‍රයෝජන රාශියක් එයින් ලැබේ.

මෙපමණක් නො ව ගුරුවරයා තම පුළුල් දැනුමෙන් ශිෂ්‍යයාගේ අවබෝධය පුළුල් කිරීමේ උපාය මාර්ගය ද යොදයි. නිදසුනක් ලෙස ඔබ ශිෂ්‍යයකුගෙන් **එදා** යන්න පාලියෙන් කිව හැක්කේ කෙසේ දැයි ප්‍රශ්න කළහොත් ඔහු වහා **තදා** යැයි පිළිතුරු දෙනු ඇත. එහෙත් දක්ෂ ගුරුවරයා එම අදහස පැවසිය හැකි වෙනත් ආකාර ද පෙන්වා දීමෙන් භාෂාව වඩාත් පහසු ලෙස හා විධිමත් ලෙස භාවිත කිරීමට ශිෂ්‍යයාට මඟ පෙන්වයි. පහත දැක්වෙන නිදසුන් බලන්න.

| | | |
|---|---|---|
| එදා/එදවස | - තදා | (තදා අරඤ්ඤෙ එකො තාපසො අහොසි.) |
| | තස්මිං දිවසෙ | (තස්මිං දිවසෙ මනුස්සා දීඝායුකා අහෙසුං) |
| | තස්මිං සමයෙ | (තස්මිං සමයෙ ත්වං කුහිං විහාසි?) |
| | තෙන බො පන සමයෙන | (තෙන බො පන සමයෙන භගවා එවං දෙසෙසි.) |
| එක් දවසක | - එකදා | (එකදා අහං ජම්බුදීපෙ වසිං) |
| | එකස්මිං දිවසෙ | (එකස්මිං අහං දිවසෙ ජම්බුදීපෙ අචරිං) |
| | එකස්මිං කාලෙ | (එකස්මිං කාලෙ අහං ජම්බුදීපෙ උග්ගඤ්ඡිං) |
| | එකං සමයං | (එකස්මිං සමයෙ අහං ජම්බුදීපෙ විහාසිං) |
| හොඳයි/මැනවි | - සාධු | (සාධු සාධු මහාකච්චාන) |
| | භද්දං | (භද්දං තෙ දස්සනං) |
| | කල්‍යාණං | (කල්‍යාණං තවාගමනං) |
| | අභික්කන්තං | (අභික්කන්තං භො ගොතම) |
| | යන්නූන | (යන්නූන ත්වං මෙත්තං චිත්තං භාවෙය්‍යාසි) |
| නම් වූ | - නාම | (සන්තින්ද්‍රියො නමා සාමණෙරො) |
| | නාමො | (සුමනපාලො නාමො මහාසයො) |
| | සමඤ්ඤො | (සුමනො සමඤ්ඤො සමණො අහොසි.) |
| | අභිධානො | (හික්කඩුවේ සිරි සුමංගලාභිධානො නායකත්ථෙරො.) |
| | ආඛ්‍යො | (හත්ථිසෙලපුරාඛ්‍යො නගරෙ) |
| | අව්හයො | (ධම්මප්පියව්හයා භික්ඛුනී සීලවතී හොති.) |

මෙයින් පැහැදිලි වන්නේ එක ම අදහස විවිධ අයුරින් පැවසිය හැකි බව යි. මෙසේ එක ම අදහස පැවසිය හැකි ක්‍රම හඳුනා ගැනීමෙන් ශිෂ්‍යයා තම අදහස ඉතා ව්‍යක්ත ආකාරයෙන් පාලියෙන් පැවසීමේ කුශලතාව වර්ධනය කර ගනී. මෙබඳු ක්‍රම ශිෂ්‍යයාගේ මනසට මැනවින් තහවුරු වූ කල්හි පන්තියේ කරනු ලබන පරිවර්තනවල දී පාඨ ග්‍රන්ථ කියවීමේ දී හා සූත්‍ර සජ්ඣායනයේ දී ඔහු ඒ බව ස්මරණය කොට ලේඛනයේ දී පෙන්නුම් කරයි.

එපමණක් නො ව ඇතැම් යෙදුම් මතකයේ තබා ගත හැකි නම් අපට වඩාත් ව්‍යක්ත ලෙස වාක්‍ය ලිවීමටත් භාෂාව කථා කිරීමටත් හැකි වේ. නිදසුනක් ලෙස **කච්චි තෙ කස්සප ඛමනීයං? (කාශ්‍යපය, ඔබට ඉවසන්ට පුළුවන් ද?)** යන මෙම ප්‍රකාශය බලන්න. මෙම පාඨය මතකයේ ඇති ශිෂ්‍යයකුට **කච්චි තෙ ආවුසො ගමනීයං? (අවැත්නි ඔබට යන්ට පුළුවන් ද?)**
**කච්චි තෙ උපාසිකෙ පචනීයං? (උපසාසිකාවෙනි, ඔබට උයන්ට පුළුවන් ද?)**
**කච්චි තෙ මහාසය, අජ්ජ කරණීයමිදං කම්මං? (මහත්තයෝ අද මේ වැඩේ කරන්ට පුළුවන් ද?)**
යනාදි වශයෙන් බොහෝ විවිධ වාක්‍ය නිර්මාණය කළ හැකි ය. මෙබඳු වාක්‍ය මෙම පොත් පෙළෙහි විවිධ තැන්වල යෙදී තිබෙනු දැකිය හැකි ය.
නිදසුන් -
**මා රොදසීති මාතා ඔවදි.** (හඬන්න එපා කියලා අම්මා අවවාද කළා. - 2 ශ්‍රේණිය, 5 පාඩම)

**උත්තරදිසායං දමිළා, දක්ඛිණපස්සෙ ගොඨසමුද්දො, කථං සුඛෙනාහං සයාමි?**
(උතුරු පැත්තේ දෙමළු, දකුණු පැත්තේ ගොළු මුහුද, මං කොහොම සැප සේ නිදන්න ද? 2 ශ්‍රේණිය, 6 පාඩම)

**තං කිං මඤ්ඤසි මහාරාජ?** (මහරජතුමෙනි, ඔබ ඒ ගැන මොකද හිතන්නෙ? - 3 ශ්‍රේණිය, 11 පාඩම)

**අත්ථංගතෙ සූරියෙ සායමාසං භුඤ්ජිත්වා** (හිරු බැස ගිය කල්හි රාත්‍රී ආහාරය අනුභව කොට - 4 ශ්‍රේණිය, 8 පාඩම)

**බුද්ධපුත්තාම්හි සමණ පොස මං** (ශ්‍රමණය, මම කුඩා දරුවකු ඇත්තියක් වෙමි. මා පෝෂණය කරන්න. - 5 ශ්‍රේණිය, 16 පාඩම)

ඉහත වාක්‍යවල කිසියම් භාෂා රීතියක් දක්නට ඇත. එම වාක්‍ය ශිෂ්‍යයාට මතකයේ දරා ගත හැකි නම් ඔහුට එම ශෛලියෙන් ම එබඳු සිය දහස් ගණනක් වාක්‍ය නිර්මාණය කළ හැකි ය. එබැවින් ඉගැන්වීමේ දී එබඳු වාක්‍ය ශිෂ්‍යයාගේ මතකයෙහි රඳවාලීමට ගුරුවරයා සමත්විය යුතු ය.

**පාඨ විවරණය**

සෑම පාඩමක් ම කිසියම් පාඨයකින් ආරම්භ වීම මෙම ග්‍රන්ථවල මූලික ලක්ෂණයක් බව මුලින් කියන ලදී. එම පාඨ පරිවර්තනය කිරීම, ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දීම, අලුත් වචන හඳුනා ගැනීම පමණක් නො ව එම පාඨයෙන් කියැවෙන ආගමික සාමාජික සාහිත්‍යාත්මක හා ඓතිහාසික ආදි කරුණු විවරණය කොට දීම ද ඒවායින් අපේක්ෂිත කාර්යය වේ. මෙය පැහැදිලි කිරීම සඳහා මූලික පිරිවෙණ 3 ශ්‍රේණිය පොතෙහි 08 වන පාඩම ගනිමු.

> 'මන්දාර පර්වතයෙහි දුර්දාන්ත නමින් එක් සිංහයෙක් විසී ය. ඌ විසින් දිනපතා බොහෝ සිවුපාවුන් මරන ලද බැවින් කැලෑවේ සිවුපාවෝ රැස් වී 'අප අතරින් එකකු දිනපතා ඔබගේ සමීපයට එවන්නෙමු' යි කී හ. ඔහු 'ඉතා මැනවැ' යි එය පිළිගති. දිනක් මහලු හාවකුගේ වාරය පැමිණියේ ය. ඔහු 'කෙසේ නම් මරණයෙන් මිදෙන්නෙම් දැ'යි සිතමින් උපායක් සිතමින් තැන තැන කල් යවමින් සිංහයා වෙතට පැමිණියේ ය. බඩගින්නෙන් පෙළුණු සිංහයා කෝපාවිෂ්ට ව 'තෝ කුමක් නිසා පරක්කු වී ආවේ දැ'යි ඇසී ය. 'ස්වාමීනි, මගේ වරදක් නැත. අතරමග දී වෙනත් සිංහයකු විසින් මම නවත්වන ලද්දෙමි. මම ඔබතුමාගේ ළඟට අවුත් නැවත එමි යි කියන තුරු මට එන්නට නො දුන්නේ යැ'යි හාවා කී ය. එයින් අතිශය කෝපයට පත් සිංහයා 'මට වහා ඒ උඩඟු සිංහයා පෙන්වව'යි කියමින් ඔහු සමීපයට යන්නට නික්මිණි. ඉක්බිති සාවා ඔහු ඉතා ගැඹුරු ළිඳක් ළඟට පමුණුවා 'බලන්න ස්වාමීනි, ඒ දුෂ්ටයා මේ ළිඳ ඇතුළේ වෙසේ යැ'යි කියමින් ළිං ජලයෙහි පෙනෙන ඔහුගේ ම ඡායාව පෙන්වී ය. උඩඟු වූ සිංහයා මහත් හඬින් ගොරවමින් ළිඳට පැන එහි ම මළේ ය.'

ඉහත දැක්වෙන ඉතා කුඩා කථා වස්තුව රසවත් කිරීම සඳහා සාහිත්‍යකරුවා උපක්‍රම කිහිපයක් යොදයි. සිංහයා සහ හාවා අතර සංවාදය ඉන් එකකි. අවස්ථා නිරූපණය තවත් උපක්‍රමයකි. භාෂා ශෛලිය තවෙකකි. ඊට අමතර ව කථාවෙන් නො කියැවෙන බොහෝ දේ ඉස්මතු කිරීමට සංකේතාත්මක භාෂාව ද භාවිත කරයි. නිදසුනක් ලෙස මෙහි කථා නායකයාට සිංහයා යොදා

ගැනීමෙන් සමාජයේ කවරාකාර උසස් යැයි සම්මත කෙනකුට වුව ද මෙහි දැක්වෙන සිද්ධි දාමය අදාළ වන බව සංකේතවත් කෙරේ. එසේ ම මෙහි සිංහයා නො හික්මුණු දඩබ්බර කෙනකු බව වචනයකිනුදු නො කියැවේ. එහෙත් ඔහු හිතුවක්කාරයෙක් බව හැඟවේ. එය සංකේතවත් කෙරෙනුයේ ඔහු හඳුන්වනු ලබන නාමයෙනි. එනම් **දුර්දාන්ත** (දුද්දන්ත) යන්නෙනි. එයින් අදහස් කෙරෙනුයේ කිසි දමනයක් නැති අසංවර චණ්ඩ කෙනකු බව යි. **වුද්ධසසක** (මහලු සාවා) යන්නෙන් අදහස් කෙරෙනුයේ මුහුකුරා ගිය චින්තන ශක්තිය යි. ළිං ජලයෙහි ඡායාවෙන් අදහස් වන්නේ මායාව යි. මෙබඳු සංකේතාත්මක අදහස් පැවසීමක් මෙම කථා වස්තුවෙහි භාවිත පදවල දක්නා ලැබේ. අනෙක් අතින් මෙයින් ලැබෙන සමාජ විඥානය ද පුළුල් ය. තරුණකම, ශක්තිය හා බලවත්කම යනාදිය සැම විට ම ජීවිතයක් ගෙවීමේ දී ප්‍රබලතම සාධක නො වේ. ඇතැම් විට සමාජ මට්ටමෙන් කුඩා කෙනකුට වුවත් ඔහුට වයසින් මුහුකුරා ගිය බුද්ධියක් ඇත්නම් උපායශීලී ව ඇතැම් ගැටලු විසඳා ගත හැකි ය. අනෙක් අතින් අවිඥානික ජන සමාජයක දුබලයා හැමවිට ම ප්‍රබලයාගේ ගොදුරක් බවට පත් වන බව ද උපන්‍යාසයකි. මහලු සාවාගේ උපායශීලීත්වයෙන් අපට උගන්වනු ලබන පාඩම එය යි. එබැවින් මහල්ලන්ට ගැරහීම තරුණ ප්‍රජාව විසින් කිසි විටෙකත් නො කළ යුත්තක් ය යන උපදේශය ලැබේ. මෙසේ මෙම කථා වස්තු පිළිබඳ විග්‍රහයක් කිරීමෙන් ද ශිෂ්‍යයාගේ ජීවිත විඥානය හා රසාස්වාද ශක්තිය පුළුල් කළ හැකි ය.

ඉහත දැක්වූ කරුණු අනුව ඉගැන්වීමේ කාර්යයේ දී ගුරුවරයකුට වගකීම් හා කාර්යභාරයන් රාශියක් ඇත. ශිෂ්‍යයා තම ගුරුවරයාගේ ඥාන ශක්තියේ ගැඹුර හා පිරිසිදුභාවය දැකීමෙන් බොහෝ දෑ ඉගෙන ගනී. ඉගැන්වීම යනු ගුරුවරයාගේ ඇඳුම, පැළඳුම, ගමනබිමන, ගතිගුණ, කතාබහ, හැසිරීම, භාෂා පරිහරණය, කරුණු දැක්වීම, රිද්මයානුකූල අවයව චලනය ආදී ශරීරයේ සියලු ඉරියව් මගින් කරනු ලබන මග පෙන්වීමකි. එක් අතකින් ගුරුවරයා ශිෂ්‍යයාගේ දකුණ අත වැනි ය. කෙනකුගේ ජවය, ශක්තිය, හැකියාව සඳහා දකුණු අත බලපාන ආකාරය ඔබ දනී. ශිෂ්‍යයා ද පසුකාලීන ව සමාජයට බොහෝ දෑ කරනු ලබන්නේ ගුරුවරයාගෙන් ලද පන්නරය නිසා ය. බුදුන් වහන්සේ විසිනුදු **ආචරියා දක්ඛිණා දිසා** යනුවෙන් ප්‍රකාශ කිරීම ද සලකා බලන්න. පාලි භාෂාව ත්‍රිපිටක භාෂාව බව අපි දනිමු. මෙම භාෂාව ඉගෙනීමෙන් ශිෂ්‍යයාට දැනුම ලබා දීම නූතන අධ්‍යාපනයේ මූලික අරමුණ වුවත් බෞද්ධ සම්ප්‍රදාය තුළ ඊට සමගාමී ලෙස ශිෂ්‍යයාගේ හදවත පෝෂණය කිරීම ද අපේක්ෂා කෙරෙන බව තේරුම් ගන්න. සමාජයට බුද්ධිමත් මෙන් ම ගුණගරුක මිනිසකු ප්‍රදානය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. විශේෂයෙන් පාලි භාෂාව බහුල වශයෙන් හදාරනු ලබනුයේ සාමණේර භික්ෂූන් වහන්සේලා විසින් හෙයින් උන්වහන්සේලාගේ ශ්‍රමණ සාරූප්‍ය ගුණය වර්ධනය වන මානසික ඒකාග්‍රතාවට තුඩු දෙන දැනුම් සම්භාරයක් ද, නිර්වාණගාමී මාර්ගය කෙරෙහි ප්‍රවණතාවක් හා උත්තේජනයක් ද, ඇති වන පරිදි ඉගැන්වීමේ කාර්යය සිදු විය යුතු බව ගුරුවරයා අවබෝධ කර ගත යුතු ය.

**මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය | viii |
| විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xii |
| පටුන | xxii |
| ජාතික අරමුණු | xxiii |
| මූලික නිපුණතා | xxiv |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xxvi |
| විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | xxvii |
| විෂය නිර්දේශය | xxviii |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxxii |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | 1 |
| පාඩම 1 - පාලි අක්ෂරමාලාව | 4 |
| පාඩම 2 - නාම වරනැගීම I | 6 |
| පාඩම 3 - නාම වරනැගීම II | 9 |
| පාඩම 4 - නාම වරනැගීම III | 12 |
| පාඩම 5 - ආඛ්‍යාත ප්‍රභේද | 15 |
| පාඩම 6 - ආඛ්‍යාත - ධාතු ගණ හා විකරණ ප්‍රත්‍යය | 19 |
| පාඩම 7 - වාක්‍ය රචනය | 22 |
| පාඩම 8 - වාක්‍ය පරිවර්තනය | 26 |
| පාඩම 9 - පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කිරීම | 29 |
| පාඩම 10 - සන්ධි | 32 |
| පාඩම 11 - සමාස | 36 |
| පාඩම 12 - තද්ධිත | 41 |
| පාඩම 13 - කිතක | 47 |
| පාඩම 14 - උදාන පාළි සහ අපදාන පාළි | 51 |
| පාඩම 15 - පාලි සාහිත්‍යයේ සුවිශේෂ චරිත | 54 |
| තක්සේරුව සහ ඇගයීම | 58 |

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම
ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම
iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම
iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම
v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම
vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම
vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම
viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම. ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. පාලි භාෂාව නිවැරැදිව උච්චාරණය කිරීමේ හා ලිවීමේ හැකියාව ඇති කිරීම

02. පාලි භාෂාවේ අක්ෂර වින්‍යාසය, විවිධ පද, විවිධ වාක්‍ය රටා හා රචනය හුරු කිරීම

03. පාලි ගද්‍ය පද්‍ය පාඨ මාතෘභාෂාවටත්, මාතෘ භාෂාවෙන් පාලි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ඇති කිරීම

04. පාලි සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබා දීම හා එහි එන ජීවන දර්ශනය උපයෝගී කර ගනිමින් පෞරුෂේය චරිතයක් බිහිකිරීම

05. ත්‍රිපිටකාගත හරධර්ම චරිතායනය කෙරෙන ආදර්ශවත් හා මනා පෞරුෂයක් සහිත භික්ෂු පිරිසක් රටට දායාද කිරීම

06. පාලි භාෂාව පිළිබඳ දැනුම සිංහල භාෂාඥානයේ ප්‍රවීණත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කිරීම

07. පාලි භාෂාව තමාගේ මෙන්ම ජාතියේ ද සියරටේ ද උරුමයක් බව තහවුරු කිරීම

08. ත්‍රිපිටකය හැදෑරීම සඳහා පාලි භාෂාව මූලික අවශ්‍යතාවක් බව අවධාරණය කිරීම

09. ත්‍රිපිටකය හා අටුවා පරිශීලනය කරමින් ධර්මය නිවැරැදිව අර්ථකථනය කරන භික්ෂු පිරිසක් ශාසනයට දායක කිරීම

10. ත්‍රිපිටක බුද්ධවචනය නිවැරදිව ග්‍රහණය කිරීම පිණිස ඇති ඒකායන මාර්ගය පාලි භාෂාව ඉගෙනීම බව පසක් කිරීම

11. ත්‍රිපිටක බුද්ධවචනය ඉදිරියට පවත්වාගෙන යැමට ප්‍රතිබල සම්පන්න පිරිසක් බිහිකිරීම

12. මහාවිහාරීය භික්ෂු සම්ප්‍රදාය විසින් සුරක්ෂිත විශිෂ්ට ඥාණ සම්භාරය නොනසා ආරක්ෂා කිරීම

13. ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් පාලි භාෂාව භාවිත කිරීම සඳහා සිසුන් යොමු කිරීම

14. පාලි භාෂාව ඉගෙනීමෙන් තමන්ටත් සිව්පසය සපයන දායක පිරිසටත් මෙලොව පරලොව සුභසිද්ධිය ළඟා කරවා ගත හැකි බව තහවුරු කිරීම

## පාලි භාෂාව
## විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| **05** | **I** | 1.1, 1.2, 1.3, 1.4, 1.5, 2.1, 2.2, 2.3, 2.4, 3.1, 3.2, 3.3, 3.4, 4.1, 4.2, 4.3, 4.4, 4.5, 4.6, 5.1 | 50 |
| | **II** | 5.2, 5.3, 5.4, 5.5, 6.1, 6.2, 6.3, 7.1, 7.2, 7.3, 7.4, 7.5, 8.1, 8.2, 8.3, 8.4, 9.1, 9.2, 9.3, 9.4, 9.5 9.6 | 50 |
| | **III** | 10.1, 10.2, 10.3, 10.4, 11.1, 11.2, 11.3, 11.4, 12.1, 12.2 | 50 |
| | | එකතුව | **150** |

# පාලි භාෂාව - විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පාලි අක්ෂරමාලාව ප්‍රභේද ගතකර භාවිත කරයි. | 1.0<br>1.1 පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියයි.<br>1.2 පාලි අක්ෂර මාලාව ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් ප්‍රභේද කරයි.<br>1.3 උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වගුගත කරයි.<br>1.4 පාලි වචන අකාරාදී පිළිවෙළට ලියයි.<br>1.5 සංයෝගාක්ෂර පිළිබඳ විස්තර කරයි. | 1.0<br>• අක්ෂර මාලාව<br>• අක්ෂර ප්‍රභේද<br>• අක්ෂර උත්පත්ති ස්ථාන<br>• සංයෝගාක්ෂර | 1.0<br>• පාලි අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කර ලියයි.<br>• අක්ෂර ප්‍රභේද වගුගත කර දක්වයි.<br>• අක්ෂර උත්පත්ති ස්ථාන නම් කොට ඒ ඒ උත්පත්ති ස්ථානයට අයත් අක්ෂර ලියයි.<br>• විවිධ සංයෝගාක්ෂර ගෙන හැර දක්වයි.<br>• සංයෝගාක්ෂර යෙදුණු වචන නිවැරදි ව ලියයි.<br>• බාලාවතාර සූත්‍ර ආශ්‍රයෙන් පාලි වර්ණ මාලාව පැහැදිලි කරයි. | 05 |
| 2.0. පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි. | 2.0<br>2.1 නාම විභක්ති අර්ථ ගෙනහැර දක්වයි.<br>2.2 කාරක හඳුන්වා, ඒ ඒ කාරකයට නිදසුන් සපයයි.<br>2.3 උපපද විභක්ති හඳුන්වයි.<br>2.4 විභක්ති ප්‍රයෝගවලට නිදසුන් සපයයි. | 2.0<br>• නාම විභක්ති 09<br>• කාරක 06<br>• උප පද විභක්ති<br>• ඒ ඒ විභක්ති ප්‍රයෝග | 2.0<br>• නාම විභක්ති පිළිවෙළින් ලියා විභක්ති අර්ථ ගන්වයි.<br>• නාමපද කිනම් විභක්තියකට අයත් දැයි ලියයි.<br>• කාරක හය නම් කොට නිදසුන් සපයයි.<br>• කාරකාර්ථ සපයන විභක්ති නම් කරයි.<br>• කාරක නොවන විභක්ති පෙන්වයි.<br>• උපපද විභක්තිවලට නිදසුන් සපයයි.<br>• ඒ ඒ විභක්ති ප්‍රයෝගය හඳුන්වා නිදසුන් දෙයි. | 15 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි. | 3.0<br>3.1 ආඛ්‍යාත විභක්ති අට වාචෝද්ගත කර වගුගත කරයි.<br>3.2 ප්‍රත්‍යයමාලා යොදා ගනිමින් ආඛ්‍යාත වගුගත කරයි.<br>3.3 ධාතු ගණ හා විකරණ ප්‍රත්‍යය යොදා ගනිමින් විවිධ ආඛ්‍යාත පද නිර්මාණය කරයි.<br>3.4 වාක්‍යවල ඇති ආඛ්‍යාත උපුටා ආඛ්‍යාත ප්‍රභේද නම් කරයි. | 3.0<br>• ආඛ්‍යාත විභක්ති අට<br>• ධාතු ගණ | 3.0<br>• ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කරයි.<br>• දෙනු ලබන ආඛ්‍යාත පද කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ලියයි.<br>• ධාතු ගණ අට නම් කරයි.<br>• ඒ ඒ ධාතු ගණයට අයත් විකරණ ලියයි.<br>• වර්තමාන ධාත්වංගය සකසයි.<br>• ආඛ්‍යාත පදය කිනම් ධාතු ගණයකට අයත් දැයි ලියයි. | 15 |
| 4.0 පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි. | 4.0<br>4.1 කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය ලියයි.<br>4.2 නාම විශේෂණ, ක්‍රියා විශේෂණ යොදා වාක්‍ය දිගු කරයි.<br>4.3 වාක්‍ය නිර්මාණයේ දී උපසර්ග නිපාත භාවිත කරයි. | 4.0<br>• උක්ත, කර්ම, ආඛ්‍යාත<br>• උපසර්ග හා නිපාත<br>• පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා<br>• සංඛ්‍යා නාම | 4.0<br>• සරල වාක්‍ය රචනා කරයි.<br>• විවිධ පද යොදා ගනිමින් වාක්‍ය දිගු කර ලියයි.<br>• කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයෙන් ලියයි.<br>• කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයෙන් ලියයි.<br>• වචන 30 ක පමණ වාක්‍ය රචනයක් රීත්‍යනුකූල ව ලියයි. | 10 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.4 සංඛ්‍යා නාම, පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා යොදා ගනිමින් වාක්‍ය රචනා කරයි.<br>4.5 කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය ලියයි.<br>4.6 මාතෘකාවක් අනුව වචන 30 ක පමණ සරල රචනයක් ලියයි. | | | |
| 5.0 නිවැරදි වියරණ විධි සහිතව පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 5.0<br>5.1 පරිවර්තනයක දී අනුගමනය කළ යුතු මූලික කරුණු ප්‍රකාශ කරයි.<br>5.2 පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>5.3 මාධ්‍ය භාෂාගත වාක්‍ය පාලි භාෂාවට නගයි.<br>5.4 විවිධ පද යොදා ගනිමින් දිගු වාක්‍ය රචනා කරයි.<br>5.5 විවිධ ආඛ්‍යාත පද යොදා ගනිමින් වාක්‍ය නිර්මාණය කරයි. | 5.0<br>• ආඛ්‍යාත විභක්ති අට<br>• උපසර්ග<br>• නිපාත<br>• පූර්වක්‍රියා<br>• තුමන්තක්‍රියා<br>• ප්‍රයෝජ්‍යක්‍රියා<br>• නිර්දිෂ්ට නාම වරනැගීම | 5.0<br>• පරිවර්තන රීති අනුගමනය කරමින් වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.<br>• මාධ්‍ය භාෂාගත වාක්‍ය රීත්‍යනුකූල ව පාලියට නගයි.<br>• සරල වාක්‍ය දිගු වාක්‍ය බවට පත්කොට පරිවර්තනය කරයි.<br>• කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවටත් පාලි භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් පරිවර්තනය කරයි. | 15 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි. | 6.0<br>6.1 බාලාවතාරයේ නිර්දිෂ්ට කොටස් වාචෝද්ගත කරයි.<br>6.2 පාලි වරනැගිල්ලේ නියමිත කොටස් වාචෝද්ගත කරයි.<br>6.3 ආඛ්‍යාත වරනැගිල්ල වාචෝද්ගත කරයි. | 6.0<br>• වරනැගීම හා වාචෝද්ගත කිරීම<br>  • බාලාවතාර තද්ධිත හා කිතක කාණ්ඩ<br>  • 1 සිට 4 ශ්‍රේණිවලට නිර්දිෂ්ට සියලු නාම වරනැගීම්<br>  • ආඛ්‍යාත වරනැගීම් (ආඛ්‍යාත විභක්ති 8)<br>• ගණසජ්ඣායනය<br>  • ආටානාටිය සූත්‍රය | 6.0<br>• තද්ධිත හා කිතක පද සාධනයේ දී බාලාවතාර සූත්‍ර භාවිත කරයි.<br>• නාම වරනැගීම ලිංග හා ශබ්දාන්ත වශයෙන් වෙනස් වන බව දක්වයි.<br>• දෙනු ලබන ධාතුවක් ආඛ්‍යාත විභක්තියක උභය පදයේ වරනගයි.<br>• ආටානාටිය සූත්‍රය ගණ සජ්ඣායනය කරයි. | 10 |
| 7.0 පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි. | 7.0<br>7.1 සන්ධි හඳුන්වා සන්ධියේ ප්‍රයෝජන දක්වයි.<br>7.2 සන්ධි කාර්ය ලියා නිදසුන් සපයයි.<br>7.3 සන්ධි ප්‍රභේද හඳුන්වා නිදසුන් සපයයි.<br>7.4 සන්ධි පද විසන්ධි කර සන්ධි ප්‍රභේද ලියයි.<br>7.5 බාලාවතාර සූත්‍ර ඇසුරෙන් විසන්ධි පද සන්ධි කරයි. | 7.0<br>• සන්ධි විධි<br>• සන්ධි ප්‍රයෝජන<br>• සන්ධි ප්‍රභේද<br>• බාලාවතාර සූත්‍ර | 7.0<br>• සන්ධි හඳුන්වයි.<br>• සන්ධි ප්‍රයෝජන ලියයි.<br>• සන්ධි කාර්ය නම් කරයි.<br>• සන්ධි ප්‍රභේද හඳුන්වයි.<br>• සන්ධි පද විසන්ධි කරයි.<br>• විසන්ධි පද සන්ධි කිරීමේ දී බාලාවතාර සූත්‍ර දක්වයි.<br>• භාවිතයේ පවතින සන්ධි පද උපුටා දක්වයි. | 10 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිත කරයි. | 8.0<br>8.1 සමාස හඳුන්වා සමාස ප්‍රයෝජන ලියයි.<br>8.2 සමාස පද සාදා ගන්නා ආකාරය හා සමාස හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කරයි.<br>8.3 නිදසුන් සහිත ව සමාස ප්‍රභේද පැහැදිලි කරයි.<br>8.4 බාලාවතාර සූත්‍ර ඇසුරෙන් සමාස පද විග්‍රහ කරයි. | 8.0<br>• සමාස හඳුනා ගැනීම<br>• සමාස ප්‍රයෝජන<br>• සමාස ප්‍රභේද<br>• නිදර්ශන<br>• බාලාවතාර සූත්‍ර පාඨ | 8.0<br>• සමාස කෙටියෙන් හඳුන්වයි.<br>• සමාස ප්‍රයෝජන ලියයි.<br>• සමාස පද විග්‍රහ කොට සාදා ගන්නා ආකාරය පෙන්වයි.<br>• සමාස පදයක් හඳුනා ගන්නා ආකාරය ලියා පැහැදිලි කරයි.<br>• සමාස ප්‍රභේද ලියවයි.<br>• ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>• බාලාවතාර සූත්‍ර ඇසුරෙන් සමාස පද සාධනය කරයි. | 10 |
| 9.0 පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි. | 9.0<br>9.1 තද්ධිත හඳුන්වා ප්‍රයෝජන දක්වයි.<br>9.2 තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය පැහැදිලි කරයි.<br>9.3 තද්ධිත ප්‍රභේද නම් කරයි.<br>9.4 ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි. | 9.0<br>• තද්ධිත හැඳින්වීම<br>• තද්ධිත ප්‍රයෝජන<br>• තද්ධිත ප්‍රභේද<br>• බාලාවතාර සූත්‍ර පාඨ | 9.0<br>• තද්ධිත කෙටියෙන් හඳුන්වා දෙයි.<br>• තද්ධිත ප්‍රයෝජන ලියයි.<br>• පියවරෙන් පියවර තද්ධිත පද සාදා ගන්නා ආකාරය පෙන්වයි.<br>• තද්ධිත ප්‍රභේද ලියයි.<br>• නිදසුන් මගින් ප්‍රභේද විස්තර කරයි.<br>• බාලාවතාර සූත්‍රානුසාරයෙන් තද්ධිත පද සකස් කරයි.<br>• දෙනු ලබන තද්ධිත පදවල ප්‍රභේදය ලියයි. | 10 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.5 බාලාවතාර සූත්‍රානුසාරයෙන් තද්ධිත පද සාධනය කරයි.<br>9.6 තද්ධිත පද උපුටා දක්වා ප්‍රභේද නම් කරයි. | | | 10 |
| 10.0 පාලි භාෂාවේ කිතක හඳුනාගෙන භාවිත කරයි. | 10.0<br>10.1 කිතක පද හඳුන්වයි.<br>10.2 කිතක පද සාධනය පැහැදිලි කරයි.<br>10.3 කිතක ප්‍රභේද ලියයි.<br>10.4 බාලාවතාර සූත්‍රානුසාරයෙන් කිතක පද යොදයි. | 10.0<br>• කිතක හැඳින්වීම<br>• කිතක ප්‍රයෝජන<br>• කිතක ප්‍රභේද | 10.0<br>• කිතක නාම හා ක්‍රියා අව්‍යය වශයෙන් භාවිත වන බව පෙන්වයි.<br>• බාලාවතාර සූත්‍රානුසාරයෙන් කිතක පද සාදයි.<br>• කිතක ප්‍රභේද ලියා නිදසුන් දෙයි.<br>• කිතක පද උපුටා දක්වයි.<br>• කිතක පද යොදා වාක්‍ය නිර්මාණය කරයි. | 10 |
| 11.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි. | 11.0<br>11.1 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>11.2 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට නගයි.<br>11.3 පාලි පාඨ රුචිකත්වයෙන් යුතු ව කියවයි.<br>11.4 නිර්දිෂ්ට පාඨවල ඇති ජීවන දර්ශනය පෙන්වයි. | 11.0<br>• මහාපජාපතී ගොතමී අපදානය<br>• උදානපාළි<br>  • සංගාමජී සුත්ත<br>  • ගබ්භිනී සුත්ත<br>  • නන්ද සුත්ත | 11.0<br>• නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ රුචිකත්වයෙන් සහ අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය රස වින්දනයේ යෙදෙයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පද්‍යවල ධර්ම කරුණු එක්රැස් කරයි.<br>• පාලි පාඨ මාධ්‍ය භාෂාවට නගයි.<br>• සාරධර්ම චරිතායනය කරයි.<br>• සූත්‍ර පාඨ යොදා ගනිමින් ධර්ම දේශනා පවත්වයි. | 34 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 12.0 පාලි සාහිත්‍යයේ සුවිශේෂ චරිත හඳුනාගෙන චරිතායනය කරයි. | 12.0<br>12.1 අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ පෝෂණයට සිදු වූ මෙහෙය ලියයි.<br>12.2 අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ පෝෂණයට සිදු වූ සේවාව පිළිබඳ කථාවක් පවත්වයි. | 12.0<br>• අටුවාචාරී බුද්ධඝෝෂ හිමි<br>• දිඹුලාගල මහාකාශ්‍යප හිමි<br>• පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි<br>• රීස් ඩේවිඩ්ස් පඬිතුමා | 12.0<br>• අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ සංවර්ධනය උදෙසා වූ උදාර දායකත්වය අභිරුචියෙන් යුක්ත ව පෙන්වයි.<br>• පාලි සාහිත්‍යයේ පෝෂණය උදෙසා තම දායකත්වය සපයයි. | 06 |

## නිර්දිෂ්ට ග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ

- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- චතුභාණවාර පාළි
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි ව්‍යාකරණය හා රචනා
- පාලි රචනා 1 - බද්දේගම විමලවංස හිමි
- පාලි භාෂාවතරණය 1 සහ 11
- පාලි පාඨ මඤ්ජරී 1 සහ 11
- පාලි කථාමඤ්ජුසා
- ධම්මපදය
- කච්චායන ධාතු මඤ්ජුසාව
- අභිදානප්පදීපිකාව
- පාලි රචනා 1 සහ 11
- බාලාවතාරදීපනී
- පාලි සාහිත්‍යය
- උදාන පාළි
- ධම්මපදට්ඨ කතා
- අපදාන පාළි
- මහා වංසය
- පාලි පාඨාවලී
- පාලි භාෂාව පිරිවෙන් පෙළපොත්
- පාලි පාඨ මඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් පාලි භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් පාලි භාෂාවෙන් ලබා ගත හැකි ය.

දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දක්වේ.

01. පාලි භාෂා දින සුවිශේෂ වැඩ සටහන් සංවිධානය කිරීම
02. කණ්ඩායම් සංවාද හා කෙටි නාට්‍ය නිර්මාණය
03. ගාථා හා සූත්‍ර ගායනා තරග සංවිධානය කිරීම
04. පාලි කථික තරග සංවිධානය කිරීම
05. බිත්ති පුවත්පතක් ක්‍රියාත්මක කිරීම
06. රාජ්‍ය ආයතන, පාසල් ආදියේ භාවිත උපදෙස් පාඨ රැස් කිරීම
07. පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ ගවේෂණාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම
08. පාලි සමිතියක් ක්‍රියාත්මක කිරීම

## ඇගැයීම් හා තක්සේරු කාර්යය

**පාසල පදනම් කරගත් ඇගයීම්** වැඩපිළිවෙළ පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැයි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

පාලි භාෂාව පිළිබඳ මූලික පිරිවෙන් අවසාන නව විෂය නිර්දේශය සකස් කොට ඇත්තේ නිපුණතා පාදක කර ගෙනය. නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රමුඛ ස්ථානයක් ගනී. අද වන විට විශේෂයෙන් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් වී ඇත්තේ දේශන ක්‍රමය කේන්ද්‍ර කර ගත් සම්ප්‍රේෂණ භූමිකාවක ගුරුවරයා සිටින ආකාරයෙනි. එහෙත් නව නිපුණතා පාදක අධ්‍යාපනයේ දී පැරණි සම්ප්‍රේෂණ භූමිකාව හැරදමා ගුරුවරයා සිසුන් ගවේෂණයට යොමු කරන මාර්ගෝපදේශකයෙකු විය යුතු ය. මෙහි දී පාලි භාෂාවේ සුවිශේෂ අධ්‍යාපන ක්‍රම හා නවීන ක්‍රම ශිල්ප කිහිපයක් යොදාගත හැකි ආකාරය පිළිබඳ කෙටියෙන් සඳහන් කරමු.

බුදුරජාණන් වහන්සේ මාර්ග දර්ශකයාණෝ ය. ගුරුවරයා විසින් පාලි භාෂාව ඉගැන්විමේ දී බුදුරදුන් අනුගමනය කළ ක්‍රමවේදය උපයෝග කර ගැනීම වඩාත් සුදුසු ය. එබැවින් නූතන ගුරුවරයා මනෝ මූලික හා විෂය මූලික සාධක ඔස්සේ පූර්ව විනිශ්චවලට නොඑළඹ ශිෂ්‍යයා ගවේෂකයෙකු හා නවෝත්පාදකයෙකු කිරීමට මාර්ගෝපදේශ සැපයීම මැනවි.

**1 ක්‍රමය**

**'සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං' (මහාවග්ගපාළි)**

| | | |
|---|---|---|
| ආදිකල්‍යාණං | - | පාඩමක ආරම්භය ශිෂ්‍යයා පොළඹවන, සිත්ගන්නාසුලු චමත්කාරජනක අත්දැකීම් ඇසුරින් ඉදිරිපත් විය යුතු ය. |
| මජ්ඣෙ කල්‍යාණං | - | පාඩමෙහි මැද සාරවත් කරුණු අන්තර්ගත විය යුතුවා සේම පැහැදිලි හා නිරවුල් ද විය යුතු ය. තව දුරටත් ශිෂ්‍යයා මාතෘකාවට පොළඹවන, ගවේෂකයෙකු කරවන ක්‍රියාවලියක් විය යුතු ය. |
| පරියොසානකල්‍යාණං | - | පාඩමේ අවසානය ශිෂ්‍යයා ප්‍රාප්ති මට්ටමකට පමුණුවා ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීමට සමත් විය යුතු ය. |
| සාත්ථං | - | පාඩම සරල සුගම හා අර්ථවත් කරුණුවලින් සමන්විත විය යුතු ය. |
| සබ්‍යඤ්ජනං | - | යොදා ගන්නා වාග්මාලාව අරුත් ප්‍රකට කරවන අදහස් නිවැරදිව සන්නිවේදනය කරවන්නක් විය යුතු ය. |
| පරිසුද්ධං | - | පාඩම අසභ්‍ය හා ග්‍රාම්‍ය ව්‍යවහාරයෙන් තොර විය යුතුය. |
| කේවලපරිපුණ්ණං | - | පාඩම ඌනතාවලින් තොරව භාෂණය, ලේඛනය, චින්තනය, චරිතායනය කර ගැනීමට හැකිවන අංගයන්ගෙන් සමුපලක්ෂිත විය යුතු ය. |

මෙම ලක්ෂණවලින් යුතුව පාඩමක් මෙහෙයවීමෙන් ශිෂ්‍යයා නිපුණතාවට ළංවන අතර ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ද ඇති කළ හැකි ය.

**2 ක්‍රමය**

**ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානිකම්මං (සච්චවිභංග සුත්ත - මජ්ඣිමනිකාය)**

| | | |
|---|---|---|
| ආචික්ඛනා | - | පාඩමට අදාළව අපේක්ෂිත කරුණු කෙටියෙන් කීම |
| දෙසනා | - | උචිත භාෂාව යොදා ගනිමින් කෙටියෙන් කී කරුණු ගුරුවරයා කෙරෙහි ප්‍රාමාණික විශ්වාසයක් ඇති වන පරිදි ධර්මානුකූලව විස්තර කිරීම |
| පඤ්ඤපනා | - | ශිෂ්‍යයාගේ බුද්ධියට හා ප්‍රඥාවට යෝග්‍ය ලෙස කරුණු පෙළ ගැස්වීම |
| පට්ඨපනා | - | අපේක්ෂිත අරමුණෙහි ශිෂ්‍යයා පිහිටුවීම |
| විවරණා | - | වසා තිබූවක් විවෘත කරන්නාක් සේ හේතුඵලවාදී ව කරුණු විවරණය කිරීම |
| විභජනා | - | කරුණු විශ්ලේෂණය කොට කුඩා අනුකුඩා කොටස්වලට බෙදා විග්‍රහ කිරීම |
| උත්තානිකම්මං | - | සංයුක්ත සංකල්ප නිදසුන් වශයෙන් ගෙනහැර දක්වමින් ශ්‍රාවක බුද්ධියට ගෝචරවන ලෙස මතුකර දැක්වීම හා ශිෂ්‍යයා ගැටලුවෙන් නිදහස් කිරීම |

**3 ක්‍රමය**

**ශිෂ්‍යයාගේ අවබෝධය දියුණු කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමය අනුපූර්ව ප්‍රතිපදාවයි.**

ශිෂ්‍යයාට අලුත් අත්දැකීම් ලබා දෙන විට එය ඔහුගේ අතීත අත්දැකීම්වලට සම්බන්ධ දෙයක්වීම වැදගත් වේ. ශිෂ්‍යයා ආස්වාදිත දෙයෙහි සිට නොදන්නා සත්‍යය කරා යොමු කරවීම මෙම අධ්‍යාපන ක්‍රමයේ පිළිවෙළයි.

| | | |
|---|---|---|
| සද්ධාජාතො උපසංකමති | - | ශ්‍රද්ධාව ඇතිකර ගැනීමයි. එසේ ගුරුවරයා කෙරේ ශිෂ්‍යයාගේ විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරුවරයා වෙත එළඹෙයි. |
| පයිරුපාසති | - | විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරු ඇසුර ලැබීමට ප්‍රිය කරයි. |
| සොතං ඔදහති | - | පාඩමට සාවධාන ව හා අවික්ෂිප්ත ව ඇහුම්කන් දෙයි. |
| සුත්වා ධාරෙති | - | ඇසූ පාඩම සිතේ දරා ගනියි. |
| අත්ථං උපපරික්ඛති | - | දරාගත් කරුණුවල අර්ථය නුවණින් පරීක්ෂා කර බලයි. |
| ධම්මා නිජ්ඣානං ඛමන්ති | - | කරුණු නුවණින් සලකා බලා වටහා ගනියි. |
| ඡන්දො ජායති | - | කරුණු වටහා ගැනීම නිසා ගුරුවරයාගේ පාඩමට රුචියක් ඇති වෙයි. |
| උස්සහති | - | පාඩමේ කරුණුවල ප්‍රාප්ති මට්ටමට ළඟාවීමට උත්සාහ කරයි. |
| තුලෙති | - | වෙනත් කරුණු හා තුලනය කර බලයි. |
| පදහති | - | සංසන්දනය කොට නිපුණතා මට්ටමට යාමට වීර්ය කරයි. |
| සච්චං සච්ඡිකරොති | - | සත්‍ය වූ තත්ත්වය අවබෝධ සාක්ෂාත් කර ගනියි. |
| පඤ්ඤාය ච නං පටිවිජ්ඣ පස්සති | - | නුවණින් ද එය විනිවිද දකී. (කීටාගිරි සූත්ත - මජ්ඣිමනිකාය) |

සරල අවස්ථාවේ සිට අනුක්‍රමයෙන් ගැඹුරට යන ආකාරයේ පිළිවෙළක් මෙහි දක්නට ඇත. පාලි භාෂාව විෂයෙහි ශිෂ්‍ය නිපුණතාව ඇති කිරීමේ දී මෙම ඉගැන්වීම් ක්‍රම උපයෝග කර ගත හැකි ය. මෙබඳු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම රාශියක් පාලි සාහිත්‍යයේ අඩංගු ය.

පාලි භාෂාවේ නව විෂය නිර්දේශය ඉගැන්වීමට සරල සුගම ක්‍රමවේදයක් මෙහිලා දක්වමු. (ආශ්‍රය - පාලි භාෂාව 9 - 10 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1984)

i. පියවර - නිර්දිෂ්ට පාලි පාඨ හා ඡේද උස් හඬින් ගුරුවරයා විසින් කියවීම, පාලි විෂයේ ආරම්භක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම භාෂාව කනට හුරු කරවීම මෙයින් අපේක්ෂා කෙරේ. පාලි භාෂා ව්‍යවහාරය දරුවන්ගේ ඇසට, කනට හුරු කරවීමට මෙම ක්‍රමය යෝග්‍ය වේ.

ii. පියවර - අනතුරුව ගුරුවරයා විසින් කළ යුත්තේ එකී කොටස අර්ථවත් ලෙස භාවාර්ථ පැහැදිලි වන පරිදි ඉදිරිපත් කිරීමයි. එමඟින් පාලි භාෂා ව්‍යවහාරය හා රීතිය ශිෂ්‍යයාගේ ඉන්ද්‍රියයන්ට හුරුවනු ඇත.

iii. පියවර - කාලවේලාව අනුව පාලි උද්ධෘතය ශිෂ්‍යයන් ලවා සාමූහික ව හෝ වෙන් වෙන් වශයෙන් හෝ නිවැරදි උච්චාරණය සහිත ව කියවීම ප්‍රයොජනවත් ය.

iv. පියවර - පාලි උද්ධෘතයන්හි අර්ථය අවබෝධ කර ගැනීමට ගුරුවරයා සිසුන්ට උදව් කළ යුතු ය.

v. පියවර - උද්ධෘත ඡේදවල වාක්‍ය හා වාක්‍යාංශ හුණුපුවරුවේ ලියා එම යෙදුම් රටාව ශිෂ්‍යයාට පැහැදිලි කළ යුතු ය.

vi. පියවර - උද්ධෘත ඡේදවල ඇතුළත් පද හා වාක්‍යවල ව්‍යාකරණ ලක්ෂණ පැහැදිලි කළ යුතු ය. මෙය සරල ක්‍රමවේදවලින් පටන් ගෙන සංකීර්ණ ක්‍රම දක්වා වැඩි කිරීම සුදුසු ය.

vii. පියවර - වැදගත් ගාථා හා ඡේද වනපොත් කිරීමේ අවශ්‍යතාව ශිෂ්‍යයන්ට ඒත්තු ගැන්වීම අවශ්‍ය වෙයි.

මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම මගින් ශිෂ්‍යයන් අපේක්ෂිත නිපුණතා මට්ටමට ළඟාවනු ඇත. සිසුන් කරුණු හා තොරතුරු ගවේෂණයට යොමු කළ යුතු ය. ගවේෂිත කරුණු අධීක්ෂණය ගුරුවරයා විසින් කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පන්ති කාමරයට පමණක් සීමා නොකොට බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ද යොමු කිරීම ගුරුවරයාගේ යුතුකමකි. සිසු දරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරතුරු අවධානයෙන් සිටීමෙන් ඇගයීම හා තක්සේරුව ද විනිවිදභාවයකින් යුතුව කිරීමට ගුරුවරයාට ඉඩකඩ සැලසේ. මෙම නව විෂයමාලා සංශෝධනයේ අපේක්ෂාව ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර වූ සම්ප්‍රේෂණ අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කර ක්‍රියාකාරී ගවේෂණාත්මක අධ්‍යාපන ක්‍රමවේදයකට යොමු කිරීම හා එමගින් සිසුන්ගේ නිපුණතාව ඉහළ නංවා සමාජයට රටට යෝග්‍ය පුරවැසියන් බිහි කිරීමයි.

# පාඩම 1 - පාලි අක්‍ෂරමාලාව

**නිපුණතාව** : 1.0 පාලි අක්‍ෂර මාලාව ප්‍රභේදගත කර භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියයි.
1.2 පාලි අක්ෂර මාලාව ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් ප්‍රභේද කරයි.
1.3 උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වගුගත කරයි.
1.4 පාලි වචන අකාරාදි පිළිවෙළට ලියයි.
1.5 සංයෝගාක්ෂර පිළිබඳ විස්තර කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :
- පාලි අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කර ලියයි.
- අක්ෂර ප්‍රභේද වගුගත කර දක්වයි.
- අක්ෂර උත්පත්ති ස්ථාන නම් කොට ඒ ඒ උත්පත්ති ස්ථානයට අයත් අක්ෂර ලියයි.
- විවිධ සංයෝගාක්‍ෂර ගෙන හැර දක්වයි.
- සංයෝගාක්‍ෂර යෙදුණු වචන නිවැරදි ව ලියයි.
- බාලාවතාර සූත්‍ර ආශ්‍රයෙන් පාලි වර්ණ මාලාව පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- ඇමුණුම 01 හි දක්වා ඇති අක්ෂර උත්පත්ති ස්ථාන දැක්වෙන බාලාවතාර සූත්‍ර පාඨ සිසුන් සමග සාමූහික ව කියවමින් පෙර දැනුම ඉස්මතු කරන්න.
- පෙළ පොතේ අදාළ පාඩමෙහි ඇති රූපසටහන වෙත සිසු අවධානය යොමු කරවමින් අක්‍ෂර උත්පත්ති ස්ථාන පෙන්වන්න.
- මෙම සූත්‍ර පාඨ මතක තබා ගැනීමෙන් අක්‍ෂරවල උත්පත්ති ස්ථාන පහසුවෙන් හඳුනාගත හැකි බව සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 01**
- අකාරාදි පිළිවෙළට පාලි වර්ණ මාලාව මතකයෙන් ලිවීමට හා ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- පෙළ පොතෙහි දක්වා ඇති බාලාවතාර සූත්‍රානුසාරයෙන් වර්ණ මාලාව පැහැදිලි කරන්න.
- පෙළ පොත අනුසාරයෙන් අක්ෂර ප්‍රභේද වගුගත කොට දක්වන්න.
- ඇමුණුම 01 සිසුන්ට ලබා දෙන්න.
- ඇමුණුම 01 හි ප්‍රධාන ක්‍රම අනුව සංයෝගාක්ෂර නිවැරදි ව ලිවීමට සිසුන් යොමු කරන්න.
- අක්ෂර උත්පත්ති ස්ථාන දැක්වෙන බාලාවතාර සූත්‍ර පාඨ වාචෝද්ගත කරවන්න.
- අක්‍ෂර උත්පත්ති ස්ථාන ලියා දක්වා ඒ ඒ උත්පත්ති ස්ථානයට අයත් අක්ෂර ලියා දක්වන්න.
- ඒකජාක්‍ෂර හා ද්විජාක්‍ෂර පැහැදිලි කරන්න.
- පාලි - සිංහල ශබ්දකෝෂයක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි වචන අකාරාදි පිළිවෙළට සකස් කොට ඇති ආකාරය පෙන්වා දෙන්න.
- ගුරු මේසය මත ශබ්දකෝෂයක් තබා ගුරු භවතා ප්‍රකාශ කරනු ලබන පාලි වචනය තත්පර කිහිපයක් තුළ සොයා පෙන්වීමේ තරගයක් පවත්වන්න.
- පෙළ පොතේ අදාළ පාඩමේ සහ ඇමුණුම 02 හි ඇති අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පාලි වර්ණ මාලාව පිළිවෙළින් ප්‍රකාශ කිරීම හා ලිවීම
- පාලි වර්ණ මාලාවේ ප්‍රභේද ලියා ඒ ඒ ප්‍රභේදයට අයත් අක්ෂර ලියා දැක්වීම
- බාලාවතාර සූත්‍ර පාඨ සහිත ව අක්ෂර උත්පත්ති ස්ථාන හා ඒවාට අදාළ අක්ෂර නම් කිරීම
- පාලි වචන අකාරාදි පිළිවෙළට සකස් කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 01 හා 02
- පෙළ පොත
- පාලි - සිංහල ශබ්දකෝෂය

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇමුණුම 01**

අක්ෂර උත්පත්ති ස්ථාන දක්වෙන බාලාවතාර සූත්‍ර

**අකවග්ගහා කණ්ඨජා / ඉචවග්ගයා තාලුජා / උපවග්ගා ඔට්ඨජා / ටවග්ගරළා මුද්ධජා**

**තවග්ගලසා දන්තජා / එ කණ්ඨතාලුජො / ඔ කණ්ඨොට්ඨජො / වො දන්තොට්ඨජො**

සංයෝගාක්ෂර

ක් + ක = ක්‍ක
ත් + ව = ත්‍ව
බ් + ර් + අ = බ්‍ර
ල් + ල් + එ = ල්ලෙ
ද් + ධ + ඔ = ද්ධො
ත් + ය් + අ = ත්‍ය
ද්ධ = ද්ධ
ච් + ච = ච්ච
බ් + බ = බ්බ

**ඇමුණුම 02**

**01. පහත සඳහන් පද අකාරාදි පිළිවෙළට සකස් කරන්න.**

| | | | | |
|---|---|---|---|---|
| අස්සො | ඉහාගච්ඡ | කඤ්ඤා | උපගන්තුං | අනුජානාමි |
| ඉස්සරො | අන්ධො | එතදවොච | රක්ඛන්තු | ඛිප්පං |
| හෙට්ඨං | අනුපුබ්බෙන | මඤ්ජූසා | ලංකා | සක්ඛරා |
| වාලුකා | අන්තරා | තිරියං | සමන්තා | භානුමන්තු |
| මත්තඤ්ඤු | කටච්ඡු | ධම්මවාදී | සීසයායී | භොගී |

**02. පහත සඳහන් පදවල අක්ෂර වින්‍යාසයේ සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.**

| | | | | |
|---|---|---|---|---|
| අත්‍ථදත්තං | පක්කමති | සබ්බිරෙව | සන්ධීතො | සුවන්න |
| පච්ඡා | චත්තාලීසති | සීහලදීපෙ | හට්ඨතුට්ටෙ | කින්නරි |
| අතිදුක්ඛරානි | අසම්බුද්දං | විද්දංසිනො | කුසලත්තිකානං | භවාබවං |

# පාඩම 2 - නාම වරනැගීම - 1

**නිපුණතාව** : 2.0 පාලි නාම පද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 නාම විභක්ති අර්ථ ගෙනහැර දක්වයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- නාම විභක්ති පිළිවෙළින් ලියා විභක්ති අර්ථ ගන්වයි.
- නාමපද කිනම් විභක්තියකට අයත් දැයි ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**

- යම් තැනැත්තෙක් ගෙදර සිටින විට එක් ඇඳුමක් ද, ගෙදරින් පිටතට යන විට තවත් ඇඳුමක් ද, මඟුල් ගෙදරට තවත් ඇඳුමක් ද, අවමඟුල් ගෙදරට තවත් ඇඳුමක් ද, විනෝද ගමනක් යන විට තවත් ඇඳුමක් ද අඳින්නා සේ **ප්‍රකෘති නාමය** ඒ ඒ අවස්ථාවන්ට උචිත වන පරිදි **විභක්ති ප්‍රත්‍යය** නැමැති මුහුණුවර ගනිමින් වෙනස් වන අයුරු පහත වගුව ඇසුරින් සාකච්ඡා කරන්න.

| නාමය | විභක්ති ප්‍රත්‍යය | නාමපදය |
|---|---|---|
| බුද්ධ | අං | බුද්ධං |
| නර | එන | නරෙන |
| දෙව | ආය | දෙවාය |

- නාමය යනු ප්‍රකෘතිය බවත් එයට විභක්ති ප්‍රත්‍යය එක්වීමෙන් විවිධ ස්වරූප ගන්නා බවත් පැහැදිලි කර දෙන්න.
- නාමයක් හා විභක්ති ප්‍රත්‍යයක් එක්වීමෙන් නාමපදයක් සෑදෙන ආකාරය පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 1**

- ඇමුණුම 01 හි අඩංගු නාම විභක්ති නවය හා ඒ ඒ විභක්තිවලට අයත් ප්‍රත්‍යය සහිත වගුව සිසුන්ට සපයන්න.
- විභක්ති ප්‍රත්‍යය යොදා නාම පදයක් සාදා ගන්නා අයුරු සාකච්ඡා කරන්න.
- නාමයක් විභක්ති ගත කළ විට විවිධාර්ථවත් වන බව පැහැදිලි කරන්න.
- 'පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල' උපයෝග කර ගනිමින් නාම වරනැගීමේ දී **ලිංග** හා **අන්ත** වශයෙන් විවිධ වන බව පෙන්වා දෙන්න.
- ඇමුණුම 01 හි දැක්වෙන පරිදි මූලික විභක්ති අර්ථ පැහැදිලි කර දෙමින් ඊට අදාළ බාලාවතාර සූත්‍ර පාඨ වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- පෙළ පොත ඇසුරෙන් සංඛ්‍යා ශබ්ද ලිංගත්‍රයේ වරනැගෙන අයුරු සාකච්ඡා කරන්න.
- සංඛ්‍යාවාචී පද අර්ථවත් ලෙස වාක්‍යවල යෙදෙන අයුරු පෙන්වා දෙන්න.
- ඇමුණුම 02 හි අභ්‍යාස කිරීමට සිසුන් මෙහෙයවන්න.

**මූලික වදන් සංකල්ප**

- **නාම** - ශබ්ද ප්‍රකෘතිය හෙවත් වර නොනැගුණු ශබ්ද මූලය
- **විභක්ති** - නාමයක් විවිධ අර්ථවලට බෙදා දැක්වීම
- **විභක්ති ප්‍රත්‍යය** - කිසියම් ශබ්දයක් විවිධාර්ථ ගැන්වීමට යොදා ගන්නා ප්‍රත්‍යය විශේෂය
- **නාමපද** - විභක්තිවල වරනැගු පද
- **සංඛ්‍යා ශබ්ද** - ඒක, ද්වි, ති, චතු ආදි සංඛ්‍යාවාචක ශබ්ද

### ඇගයීම හා තක්සේරුකරණය:

- නාම විභක්ති නම් කර ඒවායේ අර්ථ දැක්වීම
- ඒ ඒ විභක්තිවල ප්‍රත්‍යය ලියා දැක්වීම.
- නාමපද කීපයක් ප්‍රකාශ කළ විට අදාළ විභක්තිය නම් කිරීම
- නියමිත සංඛ්‍යා ශබ්ද වරනැගීම
- සංඛ්‍යාවාචී පද භාෂාවේ යෙදෙන ආකාරය පෙන්වා දීම

### ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01 හා 02
- පෙළ පොත
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල

### ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇමුණුම 01**

| විභක්ති | විභක්ති අර්ථය | ප්‍රත්‍යය | | බාලාවතාර සූත්‍ර පාඨය |
|---|---|---|---|---|
| | | ඒක | බහු | |
| පඨමා | උක්ත කර්තෘ | සි | යො | ලිංගත්‍ථෙ පඨමා |
| දුතියා | කර්මය | අං | යො | කම්මත්‍ථෙ දුතියා |
| තතියා | අනුක්ත කර්තෘ (විසින්) | නා | හි | කත්තරි තතියා |
| කරණ | කරණාර්ථය (කරණකොට) | නා | හි | කරණෙ තතියා |
| චතුත්‍ථී | සම්ප්‍රදාන (ට/හට/පිණිස) | ස | නං | සම්පදානෙ චතුත්‍ථී |
| පඤ්චමී | අපාදාන (ගෙන්/කෙරෙන්) | ස්මා | හි | අපාදානෙ පඤ්චමී |
| ඡට්ඨී | අයිතිය (ගේ) | ස | නං | සාමිස්මිං ඡට්ඨී |
| සත්තමී | ආධාර (හි/කෙරෙහි) | ස්මිං | සු | ඔකාසෙ සත්තමී |

01. කළු අකුරින් මුද්‍රිත සදොස් පද නිදොස් කර ලියන්න.

i. **චත්තාරො** වනිතානං
ii. **තයො** කඤ්ඤායො
iii. **චතස්සන්නං** පුරිසානං
iv. **එකො** ඉත්ථී
v. **තිස්සො** මුනයො
vi. **චත්තාරො** අරියසච්චානි
vii. **තිස්සන්නං** වෙදනාය
viii. **තයො** ලක්ඛනානි
ix. **අඤ්ඤතරො** දෙවතා
x. **කතමෙ** යක්ඛානං
xi. **තස්මිං** වෙලායං
xii. **ඉමානි** ආටානාටියං
xiii. **යස්ස** භික්ඛූනං
xiv. **තෙසං** අමනුස්සෙසු
xv. **ඉමෙසං** උපාසකෙහි
xvi. **එසො** කඤ්ඤායො
xvii. **ඉමාසං** සෙනාපතීනං
xviii. **ඉමිනා** බාලකාය
xix. **තස්මිං** රත්තියං

**02. පහත දැක්වෙන පදවල විභක්තිය, වචනය හා අර්ථය ලියන්න.**

| | විභක්තිය | වචනය | අර්ථය |
|---|---|---|---|
| නාගෙන | | | |
| යක්ඛස්ස | | | |
| මයූරා | | | |
| ගහපතීනං | | | |
| ජලනිධිම්හි | | | |
| අම්හාකං | | | |
| මයං | | | |
| තුය්හං | | | |
| රඤ්ඤො | | | |
| හත්ථීසු | | | |
| සාරථීනං | | | |
| ධම්මවාදිනො | | | |
| දන්තී | | | |
| ගුණවතං | | | |
| ගුණවන්තෙසු | | | |
| භගවා | | | |
| පඤ්ඤාවන්තානං | | | |
| බලවන්තෙහි | | | |
| වනිතායං | | | |
| අටවියං | | | |

# පාඩම 3 - නාම වරනැගීම - 11

**නිපුණතාව** : 2.0 පාලි නාම පද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.2 කාරක හඳුන්වා, ඒ ඒ කාරකයට නිදසුන් සපයයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :
- කාරක හය නම් කොට නිදසුන් සපයයි.
- කාරකාර්ථ සපයන විභක්ති නම් කරයි.
- කාරක නොවන විභක්ති පෙන්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**
- '**කරොති කිරියං නිප්ඵාදෙතීති කාරකං**' යන වැකිය හුණු පුවරුවේ ලියා සිසුන් සමග හඬ නගා කියවන්න.
- කාරක යනු කුමක් දැයි පැහැදිලි කර දෙන්න.
- ක්‍රියාවේ නිෂ්පත්තියට කාරක උපයෝග වන අයුරු විස්තර කරන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 1**
- ඇමුණුම 01 සිසුන්ට ලබා දී කාරක යනු කවරේ දැයි පැහැදිලි කරන්න.
- විභක්ති අතුරෙන් කාරක විභක්ති හය ද අකාරක විභක්ති තුන ද නම් කරන්න.
- කාරක නොවන විභක්ති පිළිබඳ විස්තර කරන්න.
- පඨමා විභක්තිය ප්‍රමුඛ කාරකය වන ආකාරය පහත ආකාරයට සනාථ කර පෙන්වන්න.
  - ක්‍රියාවක් කිරීමට කරන්නෙක් සිටිය යුතුය.
  - ක්‍රියාව කරන්නා සිටිනුයේ **පඨමා විභක්ති**යෙනි.
    උදා: සො ගාමං ගච්ඡති. (ඔහු ගමට යයි.)
  - මෙහි 'යයි' යන ක්‍රියාව කරනුයේ 'ඔහු' ය. 'ඔහු' නැත් නම් ක්‍රියාව ද නැත.
    සො රථෙන ගාමං ගච්ඡති. (ඔහු රථයෙන් ගමට යයි.)
  - මෙහි 'ඔහු'ගේ යෑමේ ක්‍රියාවට උපකාර වූයේ රථය යි.
  - රථය යනු ක්‍රියාව කරන්නා නොව ක්‍රියාවට උපකාර වූ දෙයයි.
- ඒ අනුව ක්‍රියාවට උපකාර වන දේ කාරක වන බවත්, පඨමා විභක්තිය ප්‍රමුඛ කාරකය වන බවත් පැහැදිලි කරන්න.
- පාලියේ කාරක විභක්ති භාවිතය පෙන්වා දෙමින් වාක්‍යවල කාරක විභක්ති යෙදෙන අයුරු පෙළ පොත ඇසුරින් පෙන්වා දෙන්න.
- ඇමුණුම 2 අභ්‍යාස කිරීමට සිසුන් මෙහෙයවන්න.

**මූලික වදන් සංකල්ප**
- **කාරක** - ක්‍රියා නිෂ්පත්තියට උපකාර වනුයේ කාරක නම් වේ.
  **(කරොති කිරියං නිප්ඵාදෙතීති කාරකං)**
- **කාරක විභක්ති** - දුතියා, තතියා, කරණ, චතුත්ථී, පඤ්චමී, සත්තමී
- **අකාරක විභක්ති** - පඨමා, ආලපන, ඡට්ඨී

- **ප්‍රමුඛ කාරකය** - පාලි භාෂාවේ **පඨමා විභක්තිය** කාරක විභක්ති ගොනුවට එක් කොට නැත. ඊට හේතුව පඨමා විභක්තිය ක්‍රියා සිද්ධිය උපකාරකයෙක් නොව ක්‍රියාව කරන්නා හෙයිනි.

## ඇගයීම හා තක්සේරුකරණය:

- කාරක යන්න හඳුන්වයි.
- කාරකාර්ථය ලබන හා නොලබන (කාරක සහ අකාරක) විභක්ති වෙන්කර දක්වයි.
- කාරක හය නම් කර උදාහරණ සපයයි.
- කිසියම් වාක්‍යයක කාරක ප්‍රයෝගය හා විභක්තිය විමසූ කල්හි ඒවා නම් කරයි.
- පාලියේ කාරක විභක්ති භාවිතය දක්වා වාක්‍යවල කාරක විභක්ති යෙදෙන අයුරු පෙන්වා දෙයි.

## ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01 සහ 02
- පෙළ පොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- බාලාවතාරය
- පාලි භාෂාවතරණය I, II - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- පාළි භාෂාව හා රචනය, පැණිහෙල සම්බෝධි මාහිමි
- පාලි ව්‍යාකරණ විවරණය - මයිලෑවේ සිරිනිවාස නාහිමි

**ඇමුණුම 01**

| **කාරක විභක්ති** | **කාරකාර්ථය** | **උදාහරණ** |
|---|---|---|
| දුතියා විභක්තිය | කර්මාර්ථය | උපාසකො ධම්මං සුණාති. |
| තතියා විභක්තිය | කර්තෘ අර්ථය | බුද්ධෙන ධම්මො දෙසිතො. |
| කරණ විභක්තිය | කරණාර්ථය | ඵරසුනා රුක්ඛං ඡින්දති. |
| චතුත්‍ථී විභක්තිය | සම්ප්‍රදානාර්ථය | **සංඝස්ස** දානං දෙති. |
| පඤ්චමී විභක්තිය | අපාදානාර්ථය | වානරො රුක්ඛම්හා පතති. |
| සත්තමී විභක්තිය | ආධාරාර්ථය | බාලකො පීඨෙ නිසීදති. |

**ඇමුණුම 02**

**01. කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති ප්‍රයෝගය නම් කොට අර්ථය ලියා දක්වන්න.**

i. භගවා **තයො** මාසෙ අභිධම්මං දෙසෙසි.
ii. පටිභන්තු **තං** චුන්ද බොජ්ඣංගා.
iii. **එකං සමයං** භගවා සාවත්‍ථියං විහරති.
iv. න **ජච්චා** වසලො හොති.
v. **කාලෙන** ධම්මසවණං එතං මංගල මුත්තමං.
vi. **පච්ඡිමෙන** විරූපක්ඛො භවති.

vii. නවහි මාසෙහි සංගීතිං අකංසු.
viii. සා භින්නෙන සීසෙන පටිවිස්සකානං උජ්ඣාපෙසි.
ix. මාතා පුත්තෙන සහ ගච්ඡති.
x. සෙට්ඨී යාචකානං දානං දෙති.
xi. නමො තස්ස භගවතො.
xii. අත්ථාය හිතාය සුඛාය සංවත්තති.
xiii. පාපා චිත්තං නිවාරයෙ.
xiv. භගවති ධම්මං දෙසෙන්තෙ පටාචාරා තත්ථාගච්ඡි.
xv. ආයස්මා ආනන්දො අරහත්තං අඤ්ඤතරො අහොසි.

02. පහත සඳහන් වගු සම්පූර්ණ කරන්න.

A

| චක්ඛුමන්තු ශබ්දය | | |
|---|---|---|
| විභක්තිය | ඒකවචන | බහුවචන |
| පඨමා | | |
| ආලපන | | |
| දුතියා | | |
| තතියා | | |
| කරණ | | |
| චතුත්ථී | | |
| පඤ්චමී | | |
| ඡට්ඨී | | |
| සත්තමී | | |

B

| නාම මූලය | පඨමා | | තතියා | | චතුත්ථී | | පඤ්චමී | | සත්තමී | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| සතිමන්තු | | | | | | | | | | |
| විචරන්ත | | | | | | | | | | |
| සීලවන්තු | | | | | | | | | | |
| හසන්ත | | | | | | | | | | |
| ඉම | | | | | | | | | | |
| එත | | | | | | | | | | |
| අම්හ | | | | | | | | | | |
| තුම්හ | | | | | | | | | | |
| අපර | | | | | | | | | | |

# පාඩම 4 - නාම වරනැගීම - 111

**නිපුණතාව** : 2.0 පාලි නාම පද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.3 උපපද විභක්ති හඳුන්වයි.
2.4 විභක්ති ප්‍රයෝගවලට නිදසුන් සපයයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :
- උපපද විභක්තිවලට නිදසුන් සපයයි.
- ඒ ඒ විභක්ති ප්‍රයෝගය හඳුන්වා නිදසුන් දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- **සූරියෙ උග්ගච්ඡන්තෙ පුප්ඵානි විකසන්ති.** (හිරු නැගෙද්දී මල් පිපෙයි.) යන වැකිය හුණු පුවරුවේ ලියා සිසුන්ට හඬ නගා කියවීමට උපදෙස් දෙන්න.
- මෙහි ඇති **භාව සත්තමී විභක්ති** ප්‍රයෝගය කෙරෙහි ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.
- **උග්ගච්ඡන්තෙ** (නැගෙද්දී) යන ක්‍රියාවට මුල් වූ '**සූරියෙ**' යන පදය සත්තමී විභක්තියෙන් තැබෙන බව සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනයඃ**
- ඇමුණුම 01 සිසුන්ට සපයන්න.
- විභක්ති නම් කොට, එහි නිශ්චිත අර්ථය සාකච්ඡා කරන්න.
- ඒ ඒ කාරක විභක්තියට අයත් **විභක්ති ප්‍රයෝග** පෙන්වා දෙන්න.
- පාලි භාෂාවේ නිතර දක්නට ලැබෙන විභක්ති ප්‍රයෝග හඳුන්වා ඒවාට නිදසුන් දක්වන්න.
- **උපපද විභක්ති** යනු මොනවා දැයි ඇමුණුම 02 ඇසුරින් පැහැදිලි කරන්න.
- උපපද විභක්ති වාක්‍යවල යෙදෙන අයුරු පෙන්වීමේ උද්ධෘත උපුටා දක්වන්න.
- උපපද විභක්ති පද සහිත වාක්‍ය කීපයක් උපුටා දක්වන්න.
- ඇමුණුම 03 අභ්‍යාස සඳහා සිසුන් යොමු කරන්න.

## මූලික වදන් සංකල්ප
- **විභක්ති ප්‍රයෝග**- උපසර්ග, නිපාත ආදී පදවල බලපෑම නිසා නිශ්චිත විභක්ත්‍යර්ථයෙන් බැහැරව වෙනත් විභක්ත්‍යර්ථවලින් පෙනී සිටින අවස්ථා
- **උපපද විභක්ති** - කිසියම් පදයක් කාරකාර්ථය හැර සමීපව සිටි නිපාත, උපසර්ග, ධාතු ආදී අන්‍ය පදයක් නිසා වෙනත් විභක්ති ස්වරූපයක් ගැනීම

**ඇගයීම හා තක්සේරුකරණයඃ**
- විභක්ති නමය ලියා දැක්වීම
- ඒ ඒ විභක්ති අර්ථ පැහැදිලි කිරීම
- උපපද විභක්ති පද උපුටා දැක්වීම
- උපපද විභක්ති සහිත වාක්‍ය උපුටා දක්වා අර්ථ ලිවීම
- ඒ ඒ විභක්තියට අයත් විභක්ති ප්‍රයෝග උදාහරණ සහිතව ගෙනහැර දැක්වීම
- වාක්‍යවල ඇති විභක්ති ප්‍රයෝග උපුටා දැක්වීම
- වාක්‍යවල ඇති උපපද විභක්ති උපුටා දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම - 01, 02 හා 03
- පෙළ පොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය - II - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- බාලාවතාරය

**ඇමුණුම 01**

| විභක්තිය | නිශ්චිත විභක්ත්‍යර්ථය | ප්‍රයෝග අවස්ථා | නිදසුන් |
|---|---|---|---|
| දුතියා | කර්මාර්ථය | අච්චන්තසංයෝගය<br>කර්මප්‍රවචනීයාර්ථය<br>ක්‍රියා විශේෂණාර්ථය<br>කාලවාචී අර්ථය | ථෙරො **තෙමාසං** පරිත්තං භණති.<br>සාධු දෙවදත්තො **මාතරං** අනු.<br>උපසන්තො **සුඛං** සෙති.<br>සො **එකදිවසං** වනං පාවිසි. |
| තතියා | කර්තෘ අර්ථය | ක්‍රියාපවර්ගාර්ථය<br>අංගවිකාර අවයවාර්ථය<br>කාලාර්ථය<br>සහාදි යෝගය | ථෙරා **නවහි මාසෙහි** සංගීතිං අකංසු.<br>සො **අක්ඛිනා** කාණො.<br>**තෙන සමයෙන** භගවා විහාරං පාවිසි.<br>පඤ්චසතා භික්ඛූ **තෙන සද්ධිං** ගමිංසු. |
| කරණ | කරණාර්ථය | | |
| චතුත්ථී | සම්ප්‍රදානාර්ථය | නමො යෝගය<br><br>තදර්ථය | නමො **තස්ස භගවතො සම්මා සම්බුද්ධස්ස.**<br>බුද්ධො **ලොකානුකම්පාය** ධම්මං දෙසෙති. |
| පඤ්චමී | අපාදානාර්ථය | උපසග්ග යෝගය<br>නිපාත යෝගය<br><br>හේත්වර්ථය | **ආබ්‍රහ්මලොකා** සද්දො අබ්භුග්ගච්ඡති.<br>**අරුණුග්ගමනතො** පට්ඨාය කම්මං කරොති.<br>**පෙමතො** ජායතී සොකො. |
| ඡට්ඨී | සම්බන්ධාර්ථය | නිර්ධාරණාර්ථය | එතදග්ගං භික්ඛවෙ මම **සාවකානං** යදිදං මහාකච්චායනො. |
| සත්තමී | ආධාරාර්ථය | ගහ ආදි ධාතු යෝගය<br>සම්ප්‍රදානාර්ථය<br>කාලාර්ථය<br>භාවාර්ථය<br>නිර්ධාරණාර්ථය | **පාදෙසු** ගහෙත්වා පාරගංගං ඛිපිස්සාමි.<br>**සංඝෙ** ගොතමී දෙහි.<br>**තස්මිං සමයෙ** භගවා අවොච.<br>**බ්‍රහ්මදත්තෙ** රජ්ජං කාරෙන්තෙ.<br>**බ්‍රාහ්මණෙසු** දෙවදත්තො පණ්ඩිතො. |

## ඇමුණුම 02

උපපද විභක්තිය යනු සමීපව යෙදෙන නිපාත, උපසර්ග, ධාතු හා කිතක පද නිසා විභක්ත්‍යර්ථය වෙනස් වීමයි. ඒ සඳහා නිදසුන් කීපයක් පහත දැක්වේ.

01. **නිපාත නිසා විභක්තිය වෙනස් වීම - තස්ස කිං**
'**ඒ කරුණෙන් කුමන වැඩක් ද**' යන අර්ථය ගැන්වීමට යෙදිය යුතු වන්නේ '**තෙන කිං**' යන්න යි. එහෙත් මෙහි දී '**කිං**' යන නිපාතය නිසා නිසා '**තෙන**' යනුවෙන් තැබිය යුතු පදය '**තස්ස**' ලෙස යොදා ඇත.

02. **උපසර්ග නිසා විභක්තිය වෙනස් වීම - ගාමං අධිවසති**
'**ගමෙහි වසයි**' යනාර්ථය ගැන්වීමට විභක්ත්‍යර්ථානුකූලව යෙදිය යුත්තේ '**ගාමෙ අධිවසති**' යනුවෙනි. එහෙත් '**අධි**' උපසර්ගයේ බලපෑම නිසා '**ගාමෙ**' යන්න '**ගාමං**' යනුවෙන් වෙනස් වී ඇත.

03. **ධාතුවක් නිසා විභක්තිය වෙනස් වීම - ජටාසු අක්කමි**
'**ජටාව පෑගුවේය**' යන අර්ථය සූචනය කිරීමට ව්‍යාකරණානුකූලව යෙදිය යුත්තේ '**ජටං අක්කමි**' ලෙස ය. එහෙත් **කමු** ධාතු යෝගය නිසා '**ජටං**' යන දුතියා විභක්ති පදය '**ජටාසු**' යනුවෙන් සත්තමී විභක්ති වී ඇත.

04. **කිතක පදයක් නිසා විභක්තිය වෙනස් වීම - ධම්මස්ස අඤ්ඤාතාරො**
මෙහි '**ධම්මං**' යනුවෙන් තැබිය යුතු වුව ද කෘදන්ත පද යෝගය නිසා '**ධම්මස්ස**' කියා යෙදී ඇත.

## ඇමුණුම 03

01. විභක්ති ප්‍රයෝග යෙදී ඇති පහත සඳහන් වාක්‍යවල එම ප්‍රයෝග යොදා ගනිමින් වෙනත් සුදුසු වාක්‍ය නිර්මාණය කරන්න.

සාමණෙරො බුද්ධං වන්දති.
බාලකො සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති.
යාචකො සෙට්ඨිං ධනං යාචති.
කාලෙන ධම්මසවණං එතං මංගලමුත්තමන්ති සම්මාසම්බුද්ධො දෙසෙසි.
උපාසකො පුත්තෙන සද්ධිං විහාරං ගච්ඡති.
නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.
බුද්ධො ලොකානුකම්පාය ධම්මං දෙසෙති.

02. උපපද විභක්ති ප්‍රයෝග සහිත පහත වාක්‍යවල සිංහල අර්ථය ලියන්න.

i. අය්‍යා දාසිං **කෙසෙසු ගහෙත්වා** පහරි.
ii. මාතා කුමාරං **මුද්ධනි චුම්බි.**
iii. ත්වං **පාදෙසු ගහෙත්වා** පාරගංගං ඛිපිස්සාමි.
iv. සාමණෙරො **යට්ඨිකොටියං ගහෙත්වා** ථෙරං නයති.
v. භගවා **අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං** මග්ගං පටිපන්නො හොති.
vi. සාධු දෙවදත්තො **මාතරං පති**.
vii. තං ඛො පන **භගවන්තං ගොතමං** කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො.
viii. **පරාභවන්තං පුරිසං** මයං පුච්ඡාම ගොතමං.
ix. භගවා **නෙරංඤ්ජං පති** විහරති.
x. උපමා **මං පටිභාති**.

# පාඩම 5 - ආඛ්‍යාත ප්‍රභේද

**නිපුණතාව** : 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.1 ආඛ්‍යාත විභක්ති අට වාචෝදගත කර වගුගත කරයි.
3.2 ප්‍රත්‍යයමාලා යොදා ගනිමින් ආඛ්‍යාත වගුගත කරයි.
3.3 ධාතු ගණ හා විකරණ ප්‍රත්‍යය යොදා ගනිමින් විවිධ ආඛ්‍යාත පද නිර්මාණය කරයි.
3.4 වාක්‍යවල ඇති ආඛ්‍යාත උපුටා ආඛ්‍යාත ප්‍රභේද නම් කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල :**
- ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කරයි.
- දෙනු ලබන ආඛ්‍යාත පද කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- පහත ගාථාව හුණු පුවරුවේ ලියා දක්වන්න.
 **යං තිකාලං තිපුරිසං - ක්‍රියාවාචී තිකාරකං**
 **අත්තිලිංගං ද්විවචනං - තදාඛ්‍යාතන්ති වුච්චති**
- එහි ඇති සෑම වචනයක ම අර්ථ ප්‍රකාශ කළ හැකි දැයි විමසන්න.
- ඒ අනුව ඉහත ගාථාවේ තේරුම ලෙස **කාලත්‍රයක්, පුරුෂත්‍රයක්, කාරකත්‍රයක්, වචන දෙකක් ඇති, ලිංග භේදයක් නැති, ක්‍රියා අර්ථයක් පවසන යමක් වේ ද එය ආඛ්‍යාත** නම් වන බව පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**
- ඇමුණුම 01 සිසුන්ට සපයන්න.
- ඒ ආශ්‍රයෙන් ආඛ්‍යාත පදයක ලක්ෂණ කවරේදැයි සාකච්ඡා කරන්න.
- පෙළ පොතේ අදාළ වගුව වෙත සිසු අවධානය යොමු කරමින් ආඛ්‍යාත විභක්ති අටෙහි අර්ථ බාලාවතාර සූත්‍ර සමගින් ගළපා පෙන්වන්න.
- ඒවා වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- පහත නිදසුන් පද ඇසුරින් ආඛ්‍යාත පදයක් ලිංග භේදයෙන් තොර බව විස්තර කරන්න.
 බාලකො භත්තං ඛාදති. - ළමයා බත් කයි.
 බාලිකා භත්තං ඛාදති. - බාලිකාව බත් කයි.
 උපාසකා බුද්ධං වන්දන්ති. - උපාසකයෝ බුදුන් වඳිති.
 උපාසිකායො බුද්ධං වන්දන්ති. - උපාසිකාවෝ බුදුන් වඳිති.
- **අත්තනොපද** හා **පරස්සපද** යන්නෙහි අර්ථ පැහැදිලි කරන්න.
- ඇමුණුම 03 හි දැක්වෙන ආඛ්‍යාත ප්‍රත්‍යය මාලාව සිසුන් සමග කිහිප වතාවක් කියවීමෙන් අනතුරු ව සිසුන් ලවා නිවැරදි උච්චාරණය සහිත ව කියවවන්න.
- ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය මතකයෙන් වගුගත කරවන්න.
- එක් ධාතුවක් ආඛ්‍යාත විභක්ති අටෙහි වරනඟා පෙන්වන්න. (උදාඃ ✓භූ - භවති)
- සිසුන්ට ද ආඛ්‍යාත පදයක් දී වරනගා වගුගත කිරීමට පවරන්න.
- උක්තය හා ආඛ්‍යාතය හැම විටම පුරුෂයෙන් හා වචනයෙන් සමාන වන බව පෙන්වා දෙන්න.

- **හීයත්තනී, අජ්ජතනී, පරොක්ඛා** හා **කාලාතිපත්ති** යන ආඛ්‍යාතවලින් අතීත කාලය හැඟවෙන බව පෙන්වා දෙන්න.
- **හීයත්තනී** සහ **අජ්ජතනී** ආඛ්‍යාත දෙකේ වෙනස පැහැදිලි කර දෙන්න.
- **'පඤ්චමී'** හා **'සත්තමී'** ආඛ්‍යාත භාෂාවේ යෙදෙන අයුරු පෙළ පොත ඇසුරින් සාකච්ඡා කරන්න.
- ආඛ්‍යාත ප්‍රත්‍යය හෝ ආඛ්‍යාත පද වගුගත කිරීමේ දී සංස්කෘත වචන සමග පටලවා නොගෙන නිවැරදි භාවිතයට හුරුකරන්න.

  උදා:

  | | |
  |---|---|
  | **සංස්කෘත** | **පාලි** |
  | පරස්මෛපද | පරස්සපද |
  | ආත්මනෙපද | අත්තනොපද |
  | ප්‍රථමපුරුෂ | පඨමපුරිස |
  | මධ්‍යමපුරුෂ | මජ්ඣිමපුරිස |

- ඇමුණුම 02 අභ්‍යාස කිරීමට සිසුන් මෙහෙයවන්න.

## මූලික වදන් සංකල්ප :

- **ආඛ්‍යාත** - ආඛ්‍යාත යනු යම් ක්‍රියා සිද්ධියක් ප්‍රකාශ කිරීම සඳහා යොදාගනු ලබන පද විශේෂයකි. ධාතුවකට හෙවත් ක්‍රියා මූලයකට ආඛ්‍යාත ප්‍රත්‍යයක් එකතු වීමෙන් ආඛ්‍යාත පදයක් සෑදේ.

- **පරස්ස පද** - ක්‍රියාවේ ඵලය තමාට නොවී වෙනත් අයකුට වේ නම් එය පරස්ස පදයෙන් තැබේ. බෞද්ධ පරමාදර්ශය ස්වාර්ථයට වඩා පරාර්ථයට නැඹුරු හෙයින් බොහෝ ක්‍රියා පද පරස්ස පදයෙන් තැබේ.
- **අත්තනො පද** - ක්‍රියාවේ ඵලය තමාට වේ නම් එය අත්තනො පදයෙන් තැබේ.

## ඇගයීම හා තක්සේරුකරණය:

- ආඛ්‍යාත යනු කවරේ දැයි නිවැරදි නිර්වචනය කිරීම
- ආඛ්‍යාත විභක්ති අට හා ඒවා යෙදෙන අර්ථ බාලාවතාර සූත්‍ර සමගින් මතකයෙන් ප්‍රකාශ කිරීම සහ ලිවීම
- ආඛ්‍යාත විභක්ති අට කාලත්‍රයට අනුව බෙදා දැක්වීම
- ඒ ඒ ආඛ්‍යාත විභක්තිවල ප්‍රත්‍යය නිවැරදි ව වගුගත කොට ලිවීම
- ආඛ්‍යාත විභක්තිවල වචන භේදය, කාල භේදය, පුරුෂ භේදය නිවැරදිව හඳුනා ගෙන දෙනු ලබන ධාතුවක් වගුගත කිරීම
- **පඤ්චමී** සහ **සත්තමී** ආඛ්‍යාතවල භාවිත අර්ථ නිවැරදි ව ප්‍රකාශ කිරීම
- අත්තනොපද හා පරස්සපද භේදය නිවැරදි ව විස්තර කිරීම
- උක්තාඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව ගැළපීම


## ගුණාත්මක යෙදවුම්:

- ඇමුණුම අංක 1, 2 හා 3
- පෙළ පොත
- ආඛ්‍යාත වරනැගිල්ල

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජුසා - ජාතික අධ්‍යාපන ආයතනය
- බාලාවතාරය
- කච්චායන ධාතුමඤ්ජුසාව

**ඇමුණුම 01**




**යං තිකාලං තිපුරිසං**
**ක්‍රියාවාචී තිකාරකං**
**අත්තිලිංගං ද්විවචනං**
**තදාඛ්‍යාතන්ති වුච්චති.**

**ඇමුණුම 02**

01. කළු අකුරින් මුද්‍රිත පදවල ආඛ්‍යාත වර්ගය නම් කොට සිංහලට නගන්න.
   - i. **අධිවාසෙතු** නො භන්තෙ.
   - ii. න හි සො භික්ඛවෙ අභිනා දට්ඨො කාලං **කරෙය්‍ය.**
   - iii. රාහු චන්දං **පමුච්චස්සු.**
   - iv. න **භජෙ** පාපකෙ මිත්තෙ.
   - v. න සුරු සුරු කාරකං **භුඤ්ජිස්සාමීති** සික්ඛා කරණීයා.
   - vi. සචෙ සො අගාරං **අජ්ඣාවසිස්සා** චක්කවත්ති රාජා **අභවිස්සා.**
   - vii. බ්‍රහ්මබන්ධු පුරෙ **ආසිං.**
   - viii. **නික්ඛම** සමණ **පවිස** සමණ.
   - ix. තුම්හෙ සුඛිතා **භවච්හො.**
   - x. තෙ ඉතො **පවිසිංසු.**

02. වරහන තුළ ඇති ආඛ්‍යාත පදය හිස් තැනට ගැළපෙන අයුරින් වරනගා ලියන්න.
   - i. සාමණෙරා බුද්ධං ......................................... (වන්දති)
   - ii. මයං පරිවෙණෙ ධම්මං......................................... (උග්ගණ්හාති)
   - iii. මා තෙ.........................................අන්තරායො. (භවති)
   - iv. අලං ආවුසො මා......................................... (පරිදෙවති)
   - v. හීයො බාලකො පාඨසාලයං......................................... (ගච්ඡති)
   - vi. අතික්කන්තමාසෙ ද්වෙ වාණිජා ඉධ......................................... (ආගච්ඡති)
   - vii. සුවෙ අම්හාකං පරිවෙණෙ මහුස්සවො......................................... (භවති)
   - viii. සචෙ ත්‍වං......................................... අහම්’පි......................................... (බාදති)
   - ix. ත්වං හීයො ධම්මං......................................... (සුණාති)
   - x. සචාහං පඨමවයෙ...............................අරහා......................... (පබ්බජ්ජෙති, භවති)

## ඇමුණුම 03

| ආඛ්‍යාත වර්ගය | පරස්සපද | | | | | | අත්තනොපද | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පඨම | | මජ්ඣිම | | උත්තම | | පඨම | | මජ්ඣිම | | උත්තම | |
| | ඒක | බහු | ඒක | බහු | ඒක | බහු | ඒක | බහු | ඒක | බහු | ඒක | බහු |
| 01. වත්තමාන | ති | අන්ති | සි | ථ | මි | ම | තෙ | අන්තෙ | සෙ | ව්හෙ | එ | ම්හෙ |
| 02. පඤ්චමී | තු | අන්තු | හි | ථ | මි | ම | තං | අන්තං | ස්සු | ව්හො | එ | ආමසෙ |
| 03. සත්තමී | එය්‍ය | එය්‍යුං | එය්‍යාසි | එය්‍යථ | එය්‍යාමි | එය්‍යාම | එථ | එරං | එථො | එය්‍යාව්හො | එය්‍යං | එය්‍යාම්හෙ |
| 04. හීයත්තනී | ආ | ඌ | ඔ | ත්ථ | අ | ම්හා | ත්ථ | ත්ථුං | සෙ | ව්හං | ඉං | ම්හසෙ |
| 05. පරොක්ඛා | ආ | ඌ | එ | ත්ථ | අ | ම්හ | ත්ථ | රෙ | ත්ථො | ව්හො | ඉ | ම්හො |
| 06. අජ්ජතනී | ඊං | ඌං | ඔ | ත්ථ | ඉං | ම්හා | ආ | ඌ | සෙ | ව්හං | අ | ම්හෙ |
| 07. කාලාතිපත්ති | ස්සා | ස්සංසු | ස්සෙ | ස්සථ | ස්සං | ස්සම්හා | ස්සථ | ස්සිංසු | ස්සසෙ | ස්සව්හෙ | ස්සං | ස්සාම්හසේ |
| 08. භවිස්සන්ති | ස්සති | ස්සන්ති | ස්සසි | ස්සථ | ස්සාමි | ස්සාම | ස්සතෙ | ස්සන්තෙ | ස්සසෙ | ස්සව්හෙ | ස්සං | ස්සාම්හෙ |

# පාඩම 6 - ආඛ්‍යාත - ධාතු ගණ හා විකරණ ප්‍රත්‍යය

**නිපුණතාව** : 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.3 ධාතු ගණ හා විකරණ ප්‍රත්‍යය යොදා ගනිමින් විවිධ ආඛ්‍යාත පද සාදයි.
3.4 වාක්‍යවල ඇති ආඛ්‍යාත උපුටා ආඛ්‍යාත ප්‍රභේද නම් කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල :**
- ධාතු ගණ අට නම් කරයි.
- ඒ ඒ ධාතු ගණයට අයත් විකරණ ලියයි.
- වර්තමාන ධාත්වංගය සකසයි.
- ආඛ්‍යාත පදය කිනම් ධාතු ගණයකට අයත් දැයි ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**
- පහත දැක්වෙන පරිදි ධාතු කිහිපයක් ප්‍රත්‍යය සමගින් හුණු පුවරුවේ ලියා දක්වන්න.
  - ✓පච + ති - පචති
  - ✓ලිඛ + තු - ලිඛතු
  - ✓ජීන්ද + සි - ජීන්දසි
- ධාතු හා ප්‍රත්‍යය වෙන් කොට හුණු පුවරුවේ ලියා දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- නාමයක මූලය ශබ්ද ප්‍රකෘතිය සේ ක්‍රියාවක මූලය **ධාතුව** වන බව පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**
- ධාතුවක් යනු ක්‍රියාමූලයක් හෙවත් ආඛ්‍යාත පදයක මුල් ස්වරූපය බව පෙන්වා දෙන්න.
- සිසුන්ට ඇමුණුම 01 සපයමින් ධාතුවක මූලික ප්‍රභේද දෙක වන **අකර්මක** සහ **සකර්මක** ප්‍රභේද නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.
- පෙළ පොත ඇසුරින් **ධාතු ගණ** හඳුන්වා එහි ප්‍රභේද අට නම් කරන්න.
- **විකරණය** යනු කුමක්දැයි පහදන්න.
- පද සිද්ධියේ දී විකරණ ප්‍රත්‍යයේ බලපෑම උදාහරණ ඇසුරින් පෙන්වන්න.
- පෙළ පොතේ අදාළ වගුව ඇසුරින් **ධාතු ගණ** අට හා ඒවාට අදාළ **විකරණ ප්‍රත්‍යය** දැක්වෙන බාලාවතාර සූත්‍ර වාචෝද්ගත කිරීමට සිසුන් යොමු කරන්න.
- ධාතු ගණය හා අදාළ විකරණය මතකයෙන් ලියවන්න.
- 'ධාතුමඤ්ජුසා' ග්‍රන්ථය ආශ්‍රයෙන් ධාතු ගණ අටට අදාළ ධාතු වෙන් වෙන්ව තෝරා ගැනීමට සිසුන්ට සහාය වන්න.
- පහත නිදසුන උපයෝග කොට ගනිමින් ධාතුවකට අයත් විකරණ ප්‍රත්‍යය යොදා ධාත්වංගය සකසා ගන්නා අයුරු පෙන්වන්න.

  භූවාදි ධාතු ගණය
  
  භූ + අ + ති (භූවාදිතො අ)
  
  භ් + ඌ > ඔ + ති (අඤ්ඤෙසු ච)
  
  භ් + ඔ > අව් > අ + ති (ඔ අවසරෙ)
  
  භවති

පච + අ + ති (භූවාදිතො අ)
පච් + ~~අ~~ + අ + ති (ධාතුස්සන්තො ලොපො. . . )
පච් + අ + ති (නයෙ පරං යුත්තෙ)
පචති

- ඇතැම් ධාතු ධාතු ගණ දෙකක යෙදෙන බව දැනුවත් කරන්න. (විස්තර අවශ්‍ය නැත.)
- ඇමුණුම 02 අභ්‍යාස කිරීමට සිසුන් මෙහෙයවන්න.

**මූලික වදන් සංකල්ප :**

- **ධාතු ගණ**
  **ගණ** යනු සමූහයකි. ධාතූහු සමූහ වශයෙන් කොටස් අටකට බෙදෙති. සියලු ධාතු මෙසේ ගණ වශයෙන් බෙදා ඇත්තේ විකරණ ප්‍රත්‍යය පදනම් කරගෙන ය. විකරණ ප්‍රත්‍යය මගින් ඒ ඒ ගණයට අයත් ධාතු වෙන් වෙන් වශයෙන් හඳුනා ගනු ලැබේ.

- **විකරණ ප්‍රත්‍යය**
  ක්‍රියාපදයක් සෑදීමේ දී ධාතුවටත් ආඛ්‍යාත ප්‍රත්‍යයටත් අතර යෙදෙනුයේ විකරණ ප්‍රත්‍යයෝ ය. විකරණ ප්‍රත්‍යයවල කාර්යය වනුයේ ධාතුවටත් ආඛ්‍යාත ප්‍රත්‍යයටත් අතර සිටිමින් එම ධාතු ප්‍රත්‍යය ඇසුරු කර එක් පදයක් බවට පත් කිරීම යි.

## ඇගයීම හා තක්සේරුකරණය:

- ධාතුවක් යනු කුමක්දැයි පැහැදිලි කිරීම
- අකර්මක හා සකර්මක ධාතු වෙන් කර පෙන්වීම
- ධාතු ගණ අට මතකයෙන් ප්‍රකාශ කිරීම සහ ලියා දැක්වීම
- ධාතු ගණවලට අදාළ විකරණ ප්‍රත්‍ය බාලාවතාර සූත්‍ර ඇසුරින් පෙන්වීම
- ආඛ්‍යාත පදයක විකරණ ප්‍රත්‍යය වෙන් කොට දක්වමින් අදාළ ධාතු ගණය නම් කිරීම
- දෙනු ලබන ධාතුවකට විකරණ ප්‍රත්‍යය යොදා ධාත්වංගය සැකසීම

## ගුණාත්මක යෙදවුම්:

- ඇමුණුම 1 හා 2
- පෙළ පොත
- කච්චායන ධාතුමඤ්ජුසාව
- පාලි වරනැගිල්ල
- බාලාවතාරය

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය I, II - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- පාලි භාෂාව හා රචනය - පැණිහෙල සිරි සම්බෝධි හිමි

**ඇමුණුම 01**

| | | |
|---|---|---|
| ධාතු | අකර්මක | **කර්ම පදයක් අපේක්ෂා නො කරයි**<br>බාලකො හසති - ළමයා සිනාසෙයි.<br>රූපං ජීරති - රූපය දිරයි.<br>කලන්දකො කන්දති - ලේනා හඬයි.<br>චන්දො ඔභාසති - සඳ බබළයි.<br>ගංගායො සන්දන්ති - ගංගාවෝ ගලා බසිත්. |
| | සකර්මක | **කර්ම පදයක් අපේක්ෂා කරයි**<br>සො භත්තං ඛාදති - ඔහු බත් කයි.<br>උපාසකො බුද්ධං වන්දති - උපාසකයා බුදුන් වඳියි.<br>ත්වං ධම්මං සුණාසි - නුඹ ධර්මය අසහි.<br>මයං ගාමං ගච්ඡාම - අපි ගමට යමු.<br>තුම්හෙ පාඨං පඨථ - නුඹලා පාඩම පාඩම් කරහු. |

**ඇමුණුම 02**

01. **වරහන් තුළ දක්වා ඇති ධාතුව සුදුසු පරිදි සකසා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

i. න ...................... පාපකෙ මිත්තෙ. (✓භජ)
ii. අහං උපාලිං විනයං ...................... (✓පුච්ඡ)
iii. සෙට්ඨිනො හීයො භත්තං ...................... (✓භුජ)
iv. කම්මකාරො නිදාඝසමයෙ භූමිං ජලං ...................... (✓සිච)
v. බාලිකායො මධුරස්සරෙන ගීතං ...................... (✓ගා)
vi. තාරකායො ආකාසෙ ...................... (✓දිප)
vii. සබ්බදානං ධම්මදානං ...................... (✓ජි)
viii. අතික්කන්තමාසෙ වාණිජා බහවො භණ්ඩානි ...................... (වි +✓කී)
ix. මයං රුක්ඛං ...................... තං නො දීඝරත්තං හිතාය භවිස්සති. (✓රුප)
x. අජගරො අජං භොගෙන ...................... (✓වෙඨ)

02. **ඉරි ඇඳි ආඛ්‍යාත පදවල ධාතුව වෙන් කොට ලියා දක්වන්න.**

i. දෙවො <u>වස්සතු</u> කාලෙන. (.............)
ii. <u>නික්ඛම</u> සමණ පවිස සමණ. (.............)
iii. කුමාරො අක්ඛරං <u>ලිඛති</u>. (.............)
iv. කුමාරො හීයො ගාමං <u>ජගාම.</u> (.............)
v. රාජා රට්ඨං <u>පාලෙති</u>. (.............)
vi. ත්වං හීයො ගාමං <u>ගච්ඡො.</u> (.............)
vii. භික්ඛු ධම්මං <u>සුණාති.</u> (.............)
viii. සා පඤ්චසීලං <u>සමාදියති</u>. (.............)
ix. පුරිසො පාතොව <u>පබ්බජ්ඣති</u>. (.............)
x. බාලකො ගෙහෙ කම්මං <u>කරොති.</u> (.............)

# පාඩම 7 - වාක්‍ය රචනය

**නිපුණතාව** : 4.0 පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි.

**නිපුණතා මට්ටම** :
- 4.1 කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය ලියයි.
- 4.2 නාම විශේෂණ, ක්‍රියා විශේෂණ යොදා වාක්‍ය දිගු කරයි.
- 4.3 වාක්‍ය නිර්මාණයේ දී උපසර්ග නිපාත භාවිත කරයි.
- 4.4 සංඛ්‍යා නාම, පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා යොදා ගනිමින් වාක්‍ය රචනා කරයි.
- 4.5 කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය ලියයි.
- 4.6 මාතෘකාවක් අනුව වචන 30 ක පමණ සරල රචනයක් ලියයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- සරල වාක්‍ය රචනා කරයි.
- විවිධ පද යොදා ගනිමින් වාක්‍ය දිගු කර ලියයි.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයෙන් ලියයි.
- කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයෙන් ලියයි.
- වචන 30 ක පමණ වාක්‍ය රචනයක් රීත්‍යනුකූල ව ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- වාක්‍ය රචනය පිළිබඳ පෙර දැනුම සාකච්ඡා කරන්න.
- ඇමුණුම - 01 ඡේදය සිසුන්ට ඉදිරිපත් කරන්න.
- වාක්‍ය රචනයක තිබිය යුතු අංග ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම - 01 හි ඡේදයේ අඩංගු විවිධ පද, එහි දී ඇති වගුවේ සටහන් කරවන්න.
- එවැනි පද භාවිත කරමින් වාක්‍ය රචනයක් නිර්මාණාත්මක ව ලිවීමේ ක්‍රමවේදය පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**
- පන්තියේ සිසුන් සියලු දෙනාට ම එකමුතු ව වාක්‍ය රචනයක් ලිවිය හැකි සරල තේමාවක් යෝජනා කරන්න.
  නිදඃ - අම්හාකං පරිවෙණං
- එම තේමාව ඔස්සේ කර්තෘ, කර්ම, ක්‍රියා සහිත සරල වාක්‍ය ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒවායේ උක්තාඛ්‍යාත සම්බන්ධය පැහැදිලි කර දෙන්න.
- එකී වාක්‍ය නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ භාවිතයෙන් දීර්ඝ වාක්‍ය බවට පත් කිරීමට සිසුන්ට මග පෙන්වන්න.
- ඒවා සුදුසු අනුපිළිවෙළකට පෙළ ගස්වන්න.
- පෙළ පොත ආශ්‍රයෙන් **නාම විශේෂණය,** විශේෂ්‍ය පදයේ ලිංග, විභක්ති හා වචනයට සමානව තැබිය යුතු බව පහදා දෙන්න.
- පෙළ පොත ඇසුරෙන් ක්‍රියා විශේෂණය **දුතියා** හෝ **තතියා** විභක්තිවලින් තැබිය යුතු බව තේරුම් කර දෙන්න.
- වාක්‍ය නිර්මාණයේ දී **උපසර්ග, නිපාත** හා **සංඛ්‍යා නාම** භාවිත වන අයුරු විස්තර කරන්න.

- සිසුන් නිර්මාණය කළ වාක්‍යවලට උපසර්ග, නිපාත හා සංඛ්‍යා නාම ඇතුළත් කරවන්න.
- පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා, මිශ්‍ර ක්‍රියා භාවිත කරමින් වාක්‍ය කීපයක් එක් වාක්‍යයක් බවට පත් කර ගන්නා අයුරු පෙන්වා දෙන්න.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය රටාවල අවධානය යොමු විය යුතු කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න.
- සිසුන් සාමූහික ව හුණු පුවරුවේ ගොඩනගන ලද වාක්‍ය රචනාව හඬ නගා කියවන්න.
- සරල මාතෘකා කිහිපයක් ලබා දී රචනා කීපයක් ලියවන්න.
  නිදඃ - **වෙසාඛපුණ්ණමියං, සාරිපුත්තත්ථෙරො, මම මිත්තො, සිරිලංකාදීපො**
- පෙළ පොතේ සහ ඇමුණුම 02 අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් සංකල්පඃ

- **නාම විශේෂණ** - නාම පදයක් විස්තර කරන පද
- **ක්‍රියා විශේෂණ** - ක්‍රියා පදයක් විස්තර කරන පද
- **සංඛ්‍යා නාම** - සංඛ්‍යාවාචී පද
- **පූර්වක්‍රියා පද** - අවසාන ක්‍රියාවට පෙර අවසන් වූ ක්‍රියා පද
- **තුමන්ත ක්‍රියා පද** - 'තුං' ප්‍රත්‍යය අන්ත කොට ඇති ක්‍රියා පද

## ඇගයීම හා තක්සේරුකරණය :

- කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත නිවැරදි වාක්‍ය නිර්මාණය කිරීම
- නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ ආශ්‍රයෙන් නිවැරදි ව වාක්‍ය දිගු කර ලිවීම
- උපසර්ග හා නිපාත වාක්‍ය රචනයේ දී භාවිත කිරීම
- පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා භාවිත කොට වාක්‍ය කීපයක් තනි වාක්‍යයක් ලෙස ප්‍රකාශ කිරීම හා ලිවීම
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ප්‍රකාශ කිරීම හා ලිවීම
- කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ප්‍රකාශ කිරීම හා ලිවීම
- දෙනු ලබන සරල මාතෘකාවකට අනුව කෙටි වාක්‍ය රචනා ලිවීම

## ගුණාත්මක යෙදවුම්ඃ

- ඇමුණුම 01 සහ 02
- පෙළ පොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි රචනා 2 - බද්දේගම විමලවංස අනුනාහිමි
- පාලි පාඨමඤ්ජරී 2 - කහඳාමෝදර චන්ද්‍රකීර්ති ශ්‍රී පියරතන නාහිමි
- පාලි භාෂාවතරණය 1 - පොල්වත්තේ බුද්ධදත්ත මහනාහිමි
- පාලි ගද්‍ය පද්‍ය රචනා - පොල්වත්තේ බුද්ධදත්ත මහනාහිමි

## ඇමුණුම 01

සාමණෙරො පාතො'ව පබුජ්ඣති. ධිතිමා සො මුඛං ධොවිත්වා උදකං පිබති. පච්ඡා සො සාමණෙරො අඤ්ඤෙ සහායකෙ'පි පබුජ්ඣාපෙති. තදනන්තරං සො දහරො භික්ඛු සෙතානි ච පීතානි ච පුප්ඵානි ඔචිනිතුං අඞ්ගණං ගච්ඡති. සද්ධාවන්තො සො එකෙන සහායකෙන සද්ධිං සනිකං විහාරං ගච්ඡති. විහාරං ගන්ත්වා තෙ මිලාතානි පුප්ඵානි ඡඩ්ඩෙත්වා පුප්ඵාසනං උදකෙන ධොවන්ති. තස්ස සහායකෙ විහාරමන්දිරං සම්මජ්ජන්තෙ අනලසො සො සාමණෙරො බොධිඅඞ්ගණං සාධුකං සම්මජ්ජති. සඤ්ඣං නදිතෙ විහාරවත්තං නිට්ඨාපෙත්වා අඤ්ඤෙහි සබ්බෙහි මිත්තෙහි සද්ධිං තෙ උභො'පි විහාරමන්දිරං පවිසන්ති. තෙ මධුරස්සරෙන ගාථා සජ්ඣායන්තා බුද්ධං වන්දන්ති.

ඉහත ඡේදයේ ඇති පද යොදා පහත වගුව සම්පූර්ණ කරන්න. (නිදසුනක් දී ඇත.)

| නාම විශේෂණ | ක්‍රියා විශේෂණ | පූර්ව ක්‍රියා | මිශ්‍ර ක්‍රියා | තුමන්ත ක්‍රියා | නිපාත | උපසර්ග | උක්තය | ආඛ්‍යාතය |
|---|---|---|---|---|---|---|---|---|
| ධිතිමා | සනිකං | ධොවිත්වා | සජ්ඣායන්තා | ඔචිනිතුං | ච | පවිසන්ති | සො | පිබති |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

## ඇමුණුම 02

01. නාමවිශේෂණ පද, ක්‍රියාවිශේෂණ පද, සංඛ්‍යා නාම, උපසර්ග හා නිපාත පද සුදුසු පරිදි භාවිත කොට පහත දැක්වෙන වාක්‍ය දිගු කොට ලියන්න.

i. භික්ඛු ධම්මං සුණාති.
ii. උපාසකො කුසුමානි ආදාය විහාරං ගච්ඡති.
iii. බුද්ධඝොසත්ථෙරො අට්ඨකථානි මාගධිභාසාය ආරොපෙසි.
iv. උපාසිකායො භොජනානි ආදාය ආරාමං ගච්ඡිංසු.
v. නාරියො පුප්ඵානි ඔචිනිත්වා චෙතියං පූජෙස්සන්ති.
vi. රාජභටො චොරං ගණ්හිතුං ධාවි.
vii. කස්සකා නඞ්ගලෙහි ඛෙත්තානි කසිත්වා වපිස්සන්ති.
viii. දාරකො යාචකස්ස වත්ථං දෙති.
ix. ආනන්දත්ථෙරො ජෙතවනං අගමාසි.
x. ගජො සොණ්ඩාය දාරකං පහරති.

02. පහත දැක්වෙන වාක්‍ය පූර්වක්‍රියා පද හා තුමන්ත ක්‍රියාපද භාවිත කොට තනි වාක්‍ය ලෙස ලියන්න.

i. බුද්ධො ධම්මං දෙසෙසි. බුද්ධො ජෙතවනං අගමාසි.
ii. වාණිජා භණ්ඩානි වික්කිණිස්සන්ති. වාණිජා නගරං ගච්ඡිස්සන්ති.
iii. සිස්සා සම්මා පඨන්ති. සිස්සා පාඨාලයං ගච්ඡන්ති.
iv. වනිතා බුද්ධං වන්දති. වනිතා ගාථායො සජ්ඣායති.
v. ආචරියො සිස්සානං ඔවාදං දදාති. ආචරියො සිස්සානං එකං කථං කථෙති.
vi. කම්මකාරා ආහාරං ලභන්ති. කම්මකාරා කම්මානි කරොන්ති.
vii. මය්හං පිතා ඛෙත්තං කසති. මය්හං පිතා ගාමෙ වසති.
viii. අහං ජිව්හාය රසං සායාමි. අහං අම්බපානං පිවාමි.
ix. වානරා ඵලානි ඛාදිංසු. වානරො රුක්ඛං ආරුහිංසු.
x. ගොණො තිණං ඛාදති. ගොණො වනං ගච්ඡති.

03. පහත දැක්වෙන මාතෘකාවලට අදාළව වචන 30 කට නො අඩු රචනාවක් ලියන්න.

i. මම ජන්මභූමි
ii. මම කල්‍යාණමිත්තො
iii. සම්මාසම්බුද්ධො
iv. ආනන්දත්ථෙරො
v. කොළම්බනගරං
vi. ජම්බුදීපං

# පාඩම 8 - පරිවර්තනය

**නිපුණතාව** : 5.0 නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.1 පරිවර්තනයක දී අනුගමනය කළ යුතු මූලික කරුණු ප්‍රකාශ කරයි.
5.2 පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.
5.3 මාධ්‍ය භාෂාගත වාක්‍ය පාලි භාෂාවට නගයි.
5.4 විවිධ පද යොදා ගනිමින් දිගු වාක්‍ය රචනා කරයි.
5.5 විවිධ ආඛ්‍යාත පද යොදා ගනිමින් වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- පරිවර්තන රීති අනුගමනය කරමින් වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- මාධ්‍ය භාෂාගත වාක්‍ය රීත්‍යනුකූල ව පාලියට නගයි.
- සරල වාක්‍ය දිගු වාක්‍ය බවට පත්කොට පරිවර්තනය කරයි.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවටත් පාලි භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් පරිවර්තනය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයː**

- ඇමුණුම 01 හි සඳහන් වාක්‍ය කියවමින් හුණු පුවරුවේ ලිවීමට ශිෂ්‍යයකුට අවස්ථාව දෙන්න.
- එහි ඇති විශේෂණ, නිපාත, උපසර්ග, පූර්වක්‍රියා, තුමන්ත ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, සහ ආඛ්‍යාත විභක්තිය යනාදිය උපුටා දැක්වීමට සිසුන් යොමු කරන්න.
- ඉහත භාෂා ප්‍රයෝග යෙදීමෙන් වාක්‍යයක් සරල අවස්ථාවේ සිට සංකීර්ණ වන ආකාරය පෙන්වන්න.
- එබඳු සංකීර්ණ වාක්‍යවල අර්ථය විශද වන ආකාරයෙන් පරිවර්තන කාර්යයෙහි යෙදිය යුතු අයුරු පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනයː**

**පියවර 1**

- පාලියෙහි වාක්‍යයක් දිගු කිරීමට යොදා ගන්නා විවිධ **ව්‍යාකරණාංග** හඳුන්වා දෙන්න.
- ඇතැම් වාක්‍ය පරිවර්තනයේ දී **නිපාත** හා **උපසර්ගවල** අර්ථ සන්දර්භයට අදාළ වන පරිදි නිවැරදි ව හැඳිනීමේ වැදගත්කම පහත සඳහන් නිදසුන් ඇසුරින් අවධාරණය කරන්න.
  - **මා** මං අපාදකො හිංසි. - පා නැත්තා මට හිංසා **නොකරන්න**.
  - **කහං පන** භික්ඛු **එතරහි** සො භගවා විහරති? - භික්‍ෂුව, **දැන්** ඒ භාග්‍යවතුන් වහන්සේ **කොහි** වාසය කරන සේක් ද?
  - **අභික්කන්තං භො** ගොතම **අභික්කන්තං භො** ගොතම. - භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි ඉතා මැනවි.
  - ධම්මො **හවෙ** රක්ඛති ධම්මචාරිං. - ධර්මයේ හැසිරෙන්නා ඒකාන්තයෙන් ධර්මය රකී.
- වාක්‍ය දිගු කිරීමට හා සංකීර්ණ අර්ථ ප්‍රකාශ කිරීමට යොදා ගැනෙන **පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා** හා **ප්‍රයෝජ්‍ය ක්‍රියා** ආදියෙහි භාවිත යොදමින් නිවැරදි ව අර්ථය ප්‍රකාශ වන පරිදි මාධ්‍ය භාෂාවට නගන ආකාරය නිදසුන් මගින් පෙන්වා දෙන්න.
- මීට පෙර උගත් **උපපද විභක්ත්‍යර්ථ** හා **විභක්ති ප්‍රයෝග** පිළිබඳ **විශේෂ** අවධානය යොමු කරවමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය පරිවර්තනයේ දී **භාෂා රීති** පිළිබඳ සැලකිල්ල යොමු වන සේ ඇමුණුම 02 හි පළමු වන අභ්‍යාසයේ තෝරාගත් වාක්‍ය කිහිපයක් සිසුන් සමග එක්ව පාලියට නගන්න.
- ඇමුණුම 02 අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්පයː**

- **අන්වය** - උක්ත, කර්ම සහ ආඛ්‍යාත නිසි පරිදි ගැළපීම
- **පදගතාර්ථ** - පාලි හෝ සිංහල වාක්‍යවල දැක්වෙන සියලු රූප පරිවර්තනය කිරීම
- **භාවාර්ථ** - මූලාශ්‍රය භාෂාවේ සහ ඉලක්ක භාෂාවේ භාෂා රටාවට අනුව පරිවර්තනය කිරීම
- **භාෂා රීති** - ඒ ඒ භාෂාවලට ආවේණික ව්‍යාකරණ, සාම්ප්‍රදායික ලක්‍ෂණ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පරිවර්තන රීති අනුගමනය කරමින් පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීම
- මාධ්‍ය භාෂාගත වාක්‍ය පාලි භාෂා රීතියට අනුව පාලියට නැගීම
- පාලි වාක්‍යයන්හි භාවිත පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා හා ප්‍රයෝජ්‍ය ක්‍රියා ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් නිවැරදි අර්ථ ප්‍රකාශනය වන පරිදි මාධ්‍ය භාෂාවට නැගීම

**ගුණාත්මක යෙදවුම්ː**

- ඇමුණුම 01 හා 02
- පෙළ පොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය ii, iii - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- පාලි ගද්‍ය පද්‍ය රචනා - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- පාළි පාඨාවලී - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- පාළිපාඨමඤ්ජරී - කහඳාමෝදර චන්ද්‍රකීර්ති ශ්‍රී පියරතන නාහිමි
- පාලි රචනා - 2 - බද්දේගම විමලවංස අනුනාහිමි

**ඇමුණුම 01**

**බාලකො පාතො’ව උට්ඨාය මුඛං පක්ඛාලෙතුං කූපං ගන්ත්වා පුන ආගම්ම වත්ථානි අච්ඡාදෙත්වා මාතාපිතුන්නං සක්කච්චං වන්දිත්වා මිත්තෙන සද්ධිං සණිකං සණිකං පාඨාලයාභිමුඛං ගච්ඡි.**

(ළමයා උදෑසන ම නැගිට මුහුණ සේදීමට ළිඳට ගොස් නැවත පැමිණ වස්ත්‍ර හැඳ මව්පියන්ට සකසා වැඳ මිතුරා සමග සෙමෙන් සෙමෙන් පාසල වෙත ගියේය.)

**ඇමුණුම 02**

01. පාලි රීතිය පිළිබඳ සැලකිලිමත් වෙමින් පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. මගේ අතින් වරදක් වුණා.
ii. මේ බුද්ධ පරිනිර්වාණයෙන් 2562 අවුරුද්දයි.
iii. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්න.
iv. භවත් ගෞතමයන් වහන්ස, ඉතා හොඳයි ඉතා හොඳයි.

v. මහණෙනි, නුඹලා ලොකු ගිනිකඳක් දකිහු ද?
vi. මේ ධර්මය ප්‍රඥාවන්තයන් සඳහා ය. අඥානයන් සඳහා නොවේ.
vii. මෛත්‍රිය වඩන්නවුන් විසින් මේ ආනිශංස කැමැති විය යුතුය.
viii. මිනිසුන් වසන තැන බල්ලෝ ද පූසෝ ද වසත්.
ix. හිරු උදා වන විට මල් පිපේ.
x. ලඞ්කාවේ මිනිසුන් අතරින් බොහෝ දෙනෙක් බෞද්ධයෝ ය.
xi. ඇතැමෙක් බුදුරජාණන් වහන්සේ සමග සතුටු වූහ.
xii. ස්වාමීනි, බොහෝ සෙයින් යක්ෂයෝ භාග්‍යවතුන් වහන්සේට අකමැති ය.
xiii. එයට හේතුව කුමක් ද?
xiv. ඔබගේ සැප දුක් කෙසේ ද?
xv. සමගිව වෙසෙන්න, විවාද නොකරන්න.
xvi. ඒකාන්තයෙන් මේ ශරීරය මහපොළොවෙහි සයනය කරන්නේය.
xvii. බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරවන කල්හි බෝසතාණන් වහන්සේ සිටු කුලයක උපන්නේය.
xviii. මාගේ ශ්‍රාවකයන් අතරින් මුගලන් තෙරණුවෝ ඍද්ධිමත් භික්ෂූන් අතරින් අග්‍ර ය.
xix. ඉදින් නුඹ පාඩම් කරන්නේ නම්, විභාගය සමත් වන්නේ ය.
xx. ලක්දිව මාගම කාවන්තිස්ස නම් රජතුමෙක් වූයේ ලු.

02. භාෂා රීති පිළිබඳ අවධානය යොමු කරමින් පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

බාරාණසියං දධිවාහනො නාම එකො රාජා රජ්ජං කාරෙසි. සො එකදිවසං ගංගායං නහානත්ථාය අගමාසි. තස්ස නහානට්ඨානං ජාලෙහි පරික්ඛිත්තං අහොසි. රඤ්ඤො නහායන්තෙ එකං අම්බඵලං නදියා ආගන්ත්වා ජාලෙ ලග්ගි. තං අහොසි අම්බඵලං ඝටප්පමාණං සුවණ්ණවණ්ණං අතිමධුරං ච. රාජා තං ගහෙත්වා ඛාදිත්වා මධුරරසෙ ගිද්ධො අම්බට්ඨිං අත්තනො උය්‍යානෙ රොපෙසි. රුක්ඛො සාඛා පත්තෙහි සවඩ්ඪිත්වා න චිරෙනෙ'ව ඵලං ගණ්හි. අඤ්ඤං තාදිසං අතිමධුරං ඵලං නත්‍ථී'ති වත්තබ්බතං පාපුණි. තස්මා තස්ස අම්බරුක්ඛස්ස මහාසක්කාරො අහොසි, රත්තින්දිවං රාජපුරිසා ආරක්ඛං කරොන්ති, ඛීරො'දකෙනපි සිඤ්චන්ති ච.

දධිවාහනරාජා අඤ්ඤෙසං රාජූනං අම්බඵලං දෙන්තො'පි රුක්ඛනිබ්බත්තනභයෙන අම්බට්ඨිං කණ්ටකෙන විජ්ඣිත්වා'ව දෙති. තෙපි තං ඛාදිත්වා මධුරරසෙ ගිද්ධා අට්ඨිං රොපෙන්ති. තථා'පි තං න සම්පජ්ජති. තෙ 'කිං නුඛො එත්‍ථ කාරණන්ති' වීමංසෙන්තො පච්ඡා තදත්ථං ජානිංසු.

අථෙ'කදා එකො උය්‍යානපාලො දධිවාහනරාජානං උපසංකමිත්වා, උය්‍යානපාලනකම්මෙ අත්තනො සාමත්‍ථියං වණ්ණෙසි. රාජා තස්මිං පසන්නො අත්තනො උය්‍යානපාලස්ස සහායත්‍ථාය තම්පි නියොජෙසි. තතො පට්ඨාය තෙ ද්වෙ'පි ජනා උය්‍යානං පටිජග්ගන්ති. අධුනා'ගතො උය්‍යානපාලො අත්තනො සාමත්‍ථියං දස්සෙන්තො අකාලපුප්ඵානි පුප්ඵාපෙති. අකාලඵලානි ගණ්හාපෙති. අථ සබ්බං උය්‍යානං පුප්ඵඵලහරිතෙහි රුක්ඛලතා ගුම්බෙහි අතීව රමණීයං අහොසි.

රාජා තස්මිං අතීව පසන්නො පොරාණකං උය්‍යානපාලං නීහරිත්වා තස්සෙ'ව සබ්බං උය්‍යානං භාරමකාසි. සො 'ඉදානි මය්හං අධිප්පාය - සාධනාය කාලො'ති ඤත්වා තං අම්බරුක්ඛං පරිවාරෙත්වා නිම්බරුක්ඛෙ රොපෙසි. න චිරෙනෙ'ව අම්බමූලෙහි නිම්බමූලානි ච සාඛාහි සාඛා ච සංසට්ඨා අහෙසුං. අහො! අසාධු සංසග්ගෙන තාව මධුරානි අම්බඵලානි තිත්තකානි අහෙසුං. අම්බඵලානං මධුරභාවං අසහන්තෙන එකෙන රාජෙන සහස්සං දත්වා පයොජිතො සො උය්‍යානපාලො අත්තනො අධිප්පායස්ස මත්‍ථකප්පත්තභාවං ඤත්වා වෙගෙන පලායි.

අථ රාජා අම්බඵලානං තිත්තරසභාවං සුත්වා සොකප්පත්තො පුරොහිතභූතං බොධිසත්තං පුච්ඡි. බොධිසත්තො තත්‍ථ ගන්ත්වා උපපරික්ඛන්තො 'නිබ්බරුක්ඛෙ නිස්සාය තථා අහොසී'ති ඤත්වා, තදත්ථං පකාසෙසි. රාජා තං සුත්වා සබ්බෙ නිම්බෙ සමූලං උද්ධරාපෙසි. තතො පට්ඨාය අම්බො'පි පුන මධුරො ජාතො.

# පාඩම 9 - පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කිරීම

**නිපුණතාව** : 6.0 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 බාලාවතාරයේ නිර්දිෂ්ට කොටස් වාචෝද්ගත කරයි.
6.2 පාලි වරනැගිල්ලේ නියමිත කොටස් වාචෝද්ගත කරයි.
6.3 ආඛ්‍යාත වරනැගිල්ල වාචෝද්ගත කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- තද්ධිත හා කිතක පද සාධනයේ දී බාලාවතාර සූත්‍ර භාවිත කරයි.
- නාම වරනැගීම ලිංග හා ශබ්දාන්ත වශයෙන් වෙනස් වන බව දක්වයි.
- දෙනු ලබන ධාතුවක් ආඛ්‍යාත විභක්තියක උභය පදයේ වරනගයි.
- ආටානාටිය සූත්‍රය ගණ සජ්ඣායනය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- බාලාවතාරයේ හෝ පාලි නාමාඛ්‍යාත වරනැගිල්ලේ හෝ නියමිත කොටසක් මනාව උච්චාරණය කරමින් පන්තියට මතකයෙන් ඉදිරිපත් කරන්න.
- එම කොටස් ඇතුළු අදාළ කරුණු වනපොත් කිරීමෙන් තමාට අත් වූ වාසි ධනාත්මකව පහදා දෙන්න.
- බාලාවතාරය, පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල ආදියෙහි නියමිත කොටස් වාචෝද්ගත කිරීමෙහි වැදගත්කම අළලා සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**
- පළමු වන ශ්‍රේණියේ පටන් වනපොත් කොට ඇති පරිදි පාලි වරනැගිල්ලේ 'බුද්ධ', 'අත්ත' ආදි පුල්ලිංග ශබ්දවල නම් වරනැගිල්ලේ ඇති ආකාරයට පිළිවෙළින් කියන්නට සිසුන් මෙහෙයවන්න.
- අනතුරුව පහත සඳහන් ගාථාව හුණු පුවරුවේ ලියන්න.
  **බුද්ධ'ත්තා රාජ ගුණවා - ගච්ඡන්තගගාදි දණ්ඩි ච**
  **භික්ඛු ජන්තු ච සත්ථා ච - නත්තා ච පිතු භාතු ච**
  **අභිභූ සබ්බඤ්ඤූ ගො'ති - එවං පුල්ලිංගසංගහො**
- එම ගාථාව ශබ්ද නගා දෙතුන් විටක් සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- මුලින් ඇසූ ප්‍රශ්නයේ පිළිතුර මෙම **උද්දාන ගාථාවේ** අන්තර්ගත බව පැහැදිලි කරන්න.
- පිටු ගණනාවක් පුරා මතක ශක්තිය විහිදුවා ග්‍රහණය කර ගත යුතු කරුණක් පේළි කීපයකින් ග්‍රහණය කර ගැනීමේ පහසුව පෙන්වා දෙන්න.
- බාලාවතාරයේ හා පාලි වරනැගිල්ලේ මෙවැනි තාක්‍ෂණික ක්‍රම භාවිත කර ඇති හෙයින් අදාළ සූත්‍ර ආදිය මතක තබා ගැනීමේ වැදගත්කම තවදුරටත් පැහැදිලි කර දෙන්න.
- එම සූත්‍ර වනපොත් කිරීමට දිරිගන්වන්න.

**පියවර 2**
- බාලාවතාරයේ තද්ධිත හා කිතක කාණ්ඩවල **සූත්‍ර** හා **වෘත්ති** නිවැරදි ව සිසුන් සමග කියවන්න.
- අදාළ **සූත්‍ර** හා **වෘත්ති** සාමූහික ව කියවීමටත් අනතුරු ව වාචෝද්ගත කිරීමටත් උපදෙස් දෙන්න.
- බාලාවතාරයේ **තද්ධිත** හා **කිතක** කාණ්ඩ මතකයෙන් ලිවීමට යොමු කරවන්න.
- ආඛ්‍යාත විභක්ති අට මතකයෙන් කීමට අවස්ථාව සලසන්න.

- ආඛ්‍යාත විභක්ති අට කාලත්‍රයට අනුව බෙදා දක්වමින් ලේඛනගත කිරීමට සලස්වන්න.
- පෙර ශ්‍රේණිවල දී උගත් සියලු නාම පිළිබඳ කෙටි සමාලෝචනයක් කරන්න.
- සාමූහික අභ්‍යාසයක් මගින් මතකය ආවර්ජනය කිරීමට සිසුන් යොමු කරන්න.
- නියමිත ධාතු, ඕනෑම ආඛ්‍යාත විභක්තියක උභය පදයෙහි වරනැගීමට හා වගු ගත කිරීමට සිසුන් පොළඹවන්න.
- නාම, ආඛ්‍යාත පිළිබඳ විධිමත් හා ක්‍රමවත් නිබන්ධනයක් සකස් කිරීමට උපදෙස් ලබා දී ඒවා ඇගයීමට ලක් කරන්න.

**පියවර 03**

- පිරුවාණා පොත් වහන්සේ සහ පෙළ පොත යොදා ගනිමින් නිවැරදි උච්චාරණ විධි සහිත ව **ආටානාටිය සූත්‍රය** සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- පන්තියේ කණ්ඩායම්වලට ආටානාටිය සූත්‍රය ගණ සජ්ඣායනයට අවස්ථාව දෙන්න.
- මේ සඳහා පෙළ පොතේ අදාළ පාඩම් උපයෝග කර ගන්න.
- ඇමුණුම 01 අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප:**

- **ගණ සජ්ඣායනය** - පිරිසක් එකතුව එක ම සාම්ප්‍රදායික රිද්මයකට, එක ම ස්වරයකට හා හඬකට අනුව ගායනා කිරීම
- **උද්දාන ගාථා** - උද්දාන යනු දාමය නොහොත් දම්වැල යි. දාමයකින් ගැළපෙන අංග කීපයක් එකට එකතු කරන්නා සේ උද්දාන ගාථා මගින් සියල්ල එකට එක් කොට දක්වා ඇත. මෙය අවබෝධය හා මතක තබා ගැනීම පහසු කරවන භාෂාවේ භාවිත තාක්‍ෂණික ක්‍රමයකි.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අදාළ නාම හා ආඛ්‍යාත නිවැරදි ව වරනැගීම හා වගු ගත කර දැක්වීම
- බාලාවතාර තද්ධිත හා කිතක කාණ්ඩය මතකයෙන් ප්‍රකාශ කිරීම හා ලිවීම
- ලේඛන කාර්යයේ දී තද්ධිත, කිතක, නාම හා ආඛ්‍යාත නිවැරදි ව භාවිත කිරීම
- නාමාඛ්‍යාත පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් සැකසීම
- ආටානාටිය සූත්‍රය නිවැරදි ව උච්චාරණය කරමින් ශ්‍රැතිගෝචර ව ගණ සජ්ඣායනය කිරීම

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම 01
- පෙළ පොත
- පිරුවාණා පොත් වහන්සේ
- බාලාවතාරය
- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල

**ඇමුණුම 01**

01. පහත සඳහන් පාඨ සම්පූර්ණ කරන්න.

i. නාමානං........................................ යුත්තත්ථො
ii. කම්මධාරයො ද්වන්දො ච........................................ ලාභිනො
තයො........................................ ලිංගං........................................ පදන්තරෙ
iii. ද්විපදෙ........................................ කම්මධාරයො
iv. නාමානං........................................ ද්වන්දො
v. ........................................ අබ්‍යයීභාවො
vi. තෙසං........................................ ලොපා ච
vii. ........................................ විධවාදිනො
viii. යෙන වා........................................ ණිකො

ix. ........................................ භාවෙතු
x. සබ්බෙහි........................................ යො
xi. ........................................ නිග්ගහීතපුබ්බං ච
xii. චුරාදිතො........................................
xiii. යං........................................ තිපුරිසං ක්‍රියාවාචි........................................
........................................ ද්විවචනං........................................ වුච්චති
xiv. ........................................ පඤ්චමී
xv. ........................................ සත්තමී
xvi. අපච්චක්ඛෙ........................................
xvii. ........................................ තුන ත්වාන ත්වා වා
xviii. ........................................ බාධතෙ කොචි........................................ අනුවත්තතෙ
තමෙවඤ්ඤො........................................ ........................................ තිධා
xix. යෙන වා........................................ තං........................................
xx. උපෙච්ච........................................ ........................................ උපසග්ගා
xxi. වග්ගෙ........................................ ........................................ ........................................ පඨමා
xxii. ........................................ ........................................ තවෙ තුං වා
xxiii. පච්චෙසන්තො........................................ ........................................ ........................................
තතොතලා
xxiv. සුත්තං........................................ උදානං........................................ වෙදල්ලන්ති.
xxv. විපස්සිස්ස........................................ ........................................ ........................................
........................................ නමත්ථු ........................................

# පාඩම 10 - සන්ධි

**නිපුණතාව** : 7.0 පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 7.1 සන්ධි හඳුන්වා සන්ධියේ ප්‍රයෝජන දක්වයි.
7.2 සන්ධි කාර්ය ලියා නිදසුන් සපයයි.
7.3 සන්ධි ප්‍රභේද හඳුන්වා නිදසුන් සපයයි.
7.4 සන්ධි පද විසන්ධි කර සන්ධි ප්‍රභේද ලියයි.
7.5 බාලාවතාර සූත්‍ර ඇසුරෙන් විසන්ධි පද සන්ධි කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- සන්ධි හඳුන්වයි.
- සන්ධි ප්‍රයෝජන ලියයි.
- සන්ධි කාර්ය නම් කරයි.
- සන්ධි ප්‍රභේද හඳුන්වයි.
- සන්ධි පද විසන්ධි කරයි.
- විසන්ධි පද සන්ධි කිරීමේ දී බාලාවතාර සූත්‍ර දක්වයි.
- භාවිතයේ පවතින සන්ධි පද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**
- පහත පාඨය හුණු පුවරුවේ ලියා අර්ථය සාකච්ඡා කරන්න.
  '**සම්මා ධීයතී'ති සන්ධි**' - මනාව ගළපනු ලබන හෙයින් සන්ධි නම් වේ.
- සන්ධියක් යනු කුමක් දැයි සිසු පෙර දැනුම විමසන්න.
- පහත ගාථාව හුණු පුවරුවේ ලියන්න.
  **සමාධියන්ති යං තත්‍ථ - අදස්සෙත්වානමන්තරං**
  **වඩ්ඪකීනා'ව ධීයන්ති - සන්ධි තෙන පවුච්චති**
- එය සාමූහිකව දෙතුන් විටක් ශබ්ද නගා කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පන්තියේ ඇති ගෘහ භාණ්ඩයක ලී කැබලි දෙකක් පුරුද්දා (සම්බන්ධ කොට) ඇති ස්ථානයක් පෙන්විය හැකි දැයි සිසුන්ගෙන් විමසන්න.
- වඩුවෙකු විසින් (ලී දෙක අතර) අතරක් නොපෙන්වා ලී කැබැලි දෙකක් මනාකොට එකට ගළපනු ලැබේ ද එමෙන්ම පද දෙකක් අතරක් නැතිව මනාකොට ගැළපීම සන්ධි නම් වන බව පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 1**
- සන්ධි පිළිබඳ හඳුන්වා එහි ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
- **සන්ධි කාර්ය** හඳුන්වා දෙමින් නිදසුන් සහිත ව විස්තර කරන්න.
- පෙළ පොතේ අදාළ වගු වෙත සිසු අවධානය යොමු කරවන්න.
- **ස්වර, ව්‍යඤ්ජන** හා **නිග්ගහීත** යන සන්ධි ප්‍රභේදවලට අදාළ සූත්‍ර උපුටා දක්වන්න.
- එම සන්ධි ප්‍රභේද සූත්‍රානුසාරයෙන් පැහැදිලි කර දෙන්න.
- බාලාවතාර සූත්‍ර වාචෝද්ගත කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඒවා වාචෝද්ගත කර ඇත් දැයි වාචික අභ්‍යාස මගින් පරීක්ෂා කරන්න.

- භාෂා අධ්‍යයනයේ දී සුලබ ව හමුවන සන්ධි කාර්ය වෙත පහත සඳහන් නිදසුන් ඇසුරින් සිසු අවධානය යොමු කරන්න.

| සන්ධි කාර්යය | බාලාවතාර සූත්‍රය | උදාහරණ |
|---|---|---|
| පූර්ව ස්වර ලෝපය | සරා සරෙ ලොපං | මාතුපට්ඨානං |
| පර ස්වර ලෝපය | වා පරො අසරූපා | ඡායාව |
| පූර්ව ස්වර දීර්ඝය | පුබ්බො ච | කිංසූධ |
| පර ස්වර දීර්ඝය | දීඝං | යානීධ |
| අසවර්ණාදේශය | ක්වචාසවණ්ණං ලුත්තෙ | ගංගොදය/බන්ධුස්සෙව |
| යකාරාදේශය | යමෙදන්තස්සාදෙසො<br>ඉවණ්ණො යං නවා | ත්‍යජ්ජ<br>වුත්‍යස්ස |
| වකාරාදේශය | වමොදුදන්තානං | අන්වෙති |
| ආගම | යවමදනතරළා චාගමා | පරියෙසති / තස්මාතිහ... |
| ද්විත්වය | පරද්වෙභාවො ඨානෙ | පච්චන්තං |
| අසමාන ද්විත්වය | වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා | අක්ඛාතො / පඨමජ්ඣාන |
| වර්ගාන්තාදේශය | වග්ගන්තං වා වග්ගෙ | කිඞ්කතො / සණ්ඨිතො |
| 'ම'කාර 'ද'කාර ආදේශ | මදාසරෙ | එවම්මං / එතදවොච |
| 'ඤ'කාරාදේශය | එහෙඤ්ඤං | තඤ්ඤෙව |
| නිග්ගහීත ලෝපය | ක්වචි ලොපං | විදූනග්ගං |

- සන්ධි ප්‍රභේදත්‍රයට අමතර ව ඇති **'වොමිස්සක' සන්ධි** ප්‍රභේදය පෙළ පොත ඇසුරෙන් සරලව හඳුන්වා දෙන්න.
- බාලාවතාර සූත්‍රවල නියමය ඇතැම් විට සිදු නොවන බව **'ක්වචි, වා, ච, නවා'** යන නිපාත ඇතුළත් බාලාවතාර සූත්‍ර ඇසුරින් පෙන්වා දෙන්න.
- පෙළ පොතේ එන පාලි ඡේදවල ඇතුළත් සන්ධි පද උපුටා ඒවා විසන්ධි කොට නැවත සූත්‍රානුසාරයෙන් සන්ධි කිරීමට සිසුන් යොමු කරන්න.
- පෙළ පොතේ අදාළ අභ්‍යාස සහ ඇමුණුම 01 අභ්‍යාස කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

## මූලික වදන් සංකල්පඃ

- **වොමිස්සක සන්ධිය** - ස්වර, ව්‍යඤ්ජන හා නිග්ගහීත යන සන්ධිවලට අදාළ සන්ධි කාර්ය කිහිපයක් මිශ්‍ර වී ඇති සන්ධි ක්‍රමය
- **සූත්‍ර නියමය** - සූත්‍රවලට අදාළ කාර්යය

## ඇගයීම හා තක්සේරුකරණය :

- සන්ධි යනු කුමක් දැයි හඳුන්වා සන්ධි ප්‍රයෝජන පැහැදිලි කිරීම
- සන්ධි කාර්ය පිළිබඳ නිවැරදි ව විස්තර කිරීම
- ස්වර, ව්‍යඤ්ජන, නිග්ගහීත සන්ධිවල මූලික ලක්‍ෂණ පෙළ ගැස්වීම
- ස්වර, ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධිවල ප්‍රභේද විස්තර කොට සූත්‍රානුසාරයෙන් විසන්ධි පද සන්ධි කිරීම
- නිතර හමුවන ඒ ඒ සන්ධි පදවල අදාළ බාලාවතාර සූත්‍ර ඉදිරිපත් කිරීම
- දෙනු ලබන ඡේදයකින් සන්ධි පද උපුටා විසන්ධි කොට නැවත සූත්‍රානුසාරයෙන් සන්ධි කිරීම

## ගුණාත්මක යෙදවුම්ඃ

- ඇමුණුම 1
- පෙළ පොත
- බාලාවතාරය

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජුසා - ජාතික අධ්‍යාපන ආයතනය

## ඇමුණුම 01

01. පහත ඡේදයේ ඇතුළත් සන්ධි පද විසන්ධි කොට සූත්‍රානුසාරයෙන් සන්ධි කර දක්වන්න.

අථ ඛො සා දෙවතා ඉස්සරකාලෙ සෙට්ඨිනා සද්ධිං කථෙතුම්පි අසක්කොන්තී, ''ඉදානායං දුග්ගතත්තා මම වචනං ගණ්හිස්සතී''ති මඤ්ඤමානා අඩ්ඪරත්තසමයෙ සිරිගබ්භං පවිසිත්වා ඔභාසං ඵරිත්වා ආකාසෙ අට්ඨාසි. සෙට්ඨි දිස්වා ''කො එසො''ති ආහ. ''අහං මහාසෙට්ඨි, චතුත්ථද්වාරකොට්ඨකෙ අධිවත්ථා දෙවතා''ති. ''කිමත්ථං ආගතාසී''ති? ''තුය්හං ඔවාදං කථෙතුකාමා හුත්වා''ති. ''තෙන හි කථෙහී''ති. ''මහාසෙට්ඨි, ත්වං පච්ඡිමකාලං න චින්තෙසි. පුත්තධීතරො න ඔලොකෙසි. සමණස්ස තෙ ගොතමස්ස සාසනෙ බහුධනං විප්පකිණ්ණං. සො ත්වං අතිවෙලං ධනවිස්සජ්ජනෙන වා නවකම්මන්තානං අකරණෙන වා සමණං ගොතමං නිස්සාය දුග්ගතො ජාතො. එවම්භූතො'පි සමණං ගොතමං න මුඤ්චසි. අජ්ජා'පි තෙ සමණා සරං පවිසන්තියෙව. යං තාව තෙහි නීතං තං න සක්කා පච්චාහරාපෙතුං. ගහිතමෙව හොතු. ඉතො පට්ඨාය පන සයඤ්ච සමණස්ස ගොතමස්ස සන්තිකං මා ගමිත්ථ. සාවකානඤ්චස්ස ඉමං සරං පවිසිතුං මා අදාසි. සමණං ගොතමං නිවත්තිත්වා'පි අනොලොකෙන්තො අත්තනො වොහාරෙ ච වණිජ්ජඤ්ච කත්වා කුටුම්බං සණ්ඨපෙහී''ති.

02. පහත සඳහන් සන්ධි පද විසන්ධි කොට අදාළ බාලාවතාර සූත්‍ර දක්වන්න.

| සන්ධිය | විසන්ධිය | අදාළ සූත්‍ර |
|---|---|---|
| යස්සින්ද්‍රියානි | | |
| බව්හාබාධො | | |
| ඉතොනායති | | |
| පග්සරති | | |
| අදාසාහං | | |
| සණ්ඨිතො | | |
| සසීලවා | | |
| යථොදකෙ | | |
| ඉච්චෙතං | | |
| තණ්හක්ඛයො | | |
| එවමස්ස | | |
| බහූපකාරො | | |
| චත්තාරොමෙ | | |
| භුවාදයො | | |
| අභිනන්දුන්ති | | |

03. පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කොට අදාළ සූත්‍රය ලියා දක්වන්න.

i. යන්නූන + අහං
ii. ඉධ + ආගමනාය
iii. ඉදං + ආසනං
iv. සංසං + ච
v. තස්මිං + එව
vi. එවං + එව
vii. උපසංකමිංසු
viii. එතං + අවොචුං
ix. පන + ආයස්මා
x. ති ඛත්තුං
xi. අංජලිං
xii. තෙසං ච
xiii. කිඤ්චි + ඉති
xiv. වීමංසෙය්‍යං + ඉති
xv. උට්ඨාසි + ඉති
xvi. ඛිප්පං + එව
xvii. දුතියං + අපි
xviii. දෙවානං + ඉන්දො
xix. යස්ස + ඉදානි
xx. බුද්ධ + උපට්ඨාන

04. පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කොට සන්ධි වර්ගය නම් කරන්න.

i. පඤ්චසතානම්පි
ii. ආගච්ඡෙය්‍යාසීති
iii. කකුටපාදානන්ති
iv. පනාහං
v. එතමත්ථං
vi. පුත්තෙනපි
vii. අහඤ්ච
viii. භන්තෙති
ix. තෙනුපසඞ්කමි
x. පාතොව
xi. තතොප්පභුති
xii. බ්‍රහ්මාති
xiii. තත්‍රෛතං
xiv. සන්තංයෙව
xv. මය්හමෙවෙතෙ
xvi. පඤ්චන්නං
xvii. තම්මිත්තං
xviii. නානුජානෙය්‍යුං
xix. ලොකානුකම්පාය
xx. අබ්භුග්ගතො

# පාඩම 11 - සමාස

**නිපුණතාව** : 8.0 පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 සමාස හඳුන්වා සමාස ප්‍රයෝජන ලියයි.
8.2 සමාස පද සාදා ගන්නා ආකාරය හා සමාස හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කරයි.
8.3 නිදසුන් සහිත ව සමාස ප්‍රභේද පැහැදිලි කරයි.
8.4 බාලාවතාර සූත්‍ර ඇසුරෙන් සමාස පද විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- සමාස කෙටියෙන් හඳුන්වයි.
- සමාස ප්‍රයෝජන ලියයි.
- සමාස පද විග්‍රහ කොට සාදා ගන්නා ආකාරය පෙන්වයි.
- සමාස පදයක් හඳුනා ගන්නා ආකාරය ලියා පැහැදිලි කරයි.
- සමාස ප්‍රභේද ලියවයි.
- ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි.
- බාලාවතාර සූත්‍ර ඇසුරෙන් සමාස පද සාධනය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- පහත දැක්වෙන සමාස නො කළ පද සහිත වාක්‍යය හුණු පුවරුවේ ලියන්න.
  **රඤ්ඤො පුරිසා සීලවන්තෙහි උපාසකෙහි සද්ධිං අන්නං ච පානං ච ආදාය විහාරං ගන්ත්වා පඤ්චානි සීලානි සමාදිත්‍වා සහස්සානං ථෙරානං දානං දදිංසු.**
- එය හඬ නගා සාමූහිකව උච්චාරණය කරන්න.
- අනතුරු ව පහත දැක්වෙන ආකාරයට එම අසමස්ත පද සමාස කරමින් නැවත එම වාක්‍යය ලියා පෙන්වන්න.
  **රාජපුරිසා සීලවන්තුපාසකෙහි** සද්ධිං **අන්නපානමාදාය** විහාරං ගන්ත්වා **පඤ්චසීලං** සමාදිත්‍වා **සහස්සථෙරානං** දානං දදිංසු.
- එය හඬ නගා සාමූහිකව උච්චාරණය කරන්න.
- එහි ඇති සුබෝච්චාරණය ධනාත්මකව අගයන්න.
- එහි පද සමාස කර ඇති ආකාරය සාකච්ඡා කරන්න.
- ඒ අනුව පද දෙකක් හෝ කීපයක් සමාස කිරීමෙන් පද සංක්ෂේප වන බවත් (**සමාසො පද සංඛෙපො**), භාෂාවේ ඕජෝ ගුණය ඇති වන බවත් අවබෝධ කරවමින් භාෂාවක ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා සමාසවල වටිනාකම පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**
- ඇමුණුම 01 සිසුන්ට ලබා දෙන්න.
- සමාස යනු කුමක් දැයි හඳුන්වන්න.
- සමාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
- පෙළ පොත ඇසුරෙන් සමාස ප්‍රභේද හය විස්තර කරන්න.
- එක් එක් සමාසයක අවබෝධය උදාහරණ සහිත ව අධ්‍යයනය කරවන්න.
- පෙළ පොත ඇසුරින් සමාස ප්‍රභේද මෙන් ම සමාසයක් තුළ ඇති ප්‍රභේද ද පෙන්වා දෙන්න.

- ඇමුණුම 02 සිසුන්ට සපයමින් සමාස හය සඳහා වන බාලාවතාර සූත්‍ර සිංහල අදහස සහිත ව වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 03 සිසුන්ට සපයමින් සමාස පදයක පද සිද්ධිය වන අයුරු බාලාවතාර සූත්‍ර ඇසුරෙන් ලියා දක්වා පැහැදිලි කර දෙන්න.
- ඇමුණුම 04 සිසුන්ට සපයා සමාස පද අසමාස කිරීමටත්, අසමාස පද සමාස කිරීමටත් සිසුන්ට අවස්ථාව දෙන්න. (සුදුසු තරගයකට සිසුන් යොමු කරන්න.)
- තෝරාගත් ඡේද කිහිපයක සමාස පද උපුටා දැක්වීමට සිසුන් යොමු කරන්න.
- පෙළ පොත ඇසුරෙන් **ගර්භ සමාස** (මිශ්‍ර) පද පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- පෙළ පොතේ සහ ඇමුණුම 05 අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් සංකල්පඃ

- **සමාස** - **නාමානං සමාසො යුත්තත්‍ථො** - අන්‍යොන්‍ය සම්බන්ධය ඇති පද දෙකක් හෝ වැඩි ගණනක් එක් පදයක් වන සේ මනා කොට ගැළපීම සමාස නම් වේ.
- **ගර්භ සමාස** - එක් සමාස පදයක තවත් සමාස පද ඇතුළත් වේ නම් එය ගර්භ සමාස හෙවත් මිශ්‍ර සමාස යනුවෙන් හැඳින්වේ.
- **ඕජෝ ගුණය** - ඡේදයක හෝ ගාථාවක සමාස පද බහුල වූ විට ඒ තුළින් ඇති වන ගුණය ඕජෝ ගුණය නම් වේ. (ඕජො සමාස බාහුල්‍යසය) මෙය කාව්‍යාලංකාර ශාස්ත්‍රයේ ඉගැන්වෙන අලංකාරයක් ද වේ.

## ඇගයීම හා තක්සේරුකරණය :

- සමාස යනු කුමක් දැයි ප්‍රකාශ කිරීම
- සමාස හඳුන්වන '**සමාසො පද සංඛෙපො**' පාඨය මතකයෙන් ප්‍රකාශ කිරීම
- සමාස ප්‍රභේද හය පිළිවෙළින් නම් කිරීම
- එක් එක් සමාසයට උදාහරණ දැක්වීම
- සමාස පද විග්‍රහ කොට සමාස පද ගොඩනැංවීම
- සමාස පදවල පදසාධනය ලිවීම
- සමාස පදයක් හඳුනා ගන්නා ආකාරය ප්‍රකාශ කිරීම
- සමාසයක් තුළ ඇති ප්‍රභේද පෙන්වා දීම
- සමාස හඳුන්වන බාලාවතාර සූත්‍ර මතකයෙන් කීම
- සමාස සහිත පාලි වාක්‍ය සිංහලටත් සිංහල වාක්‍ය පාලියටත් පරිවර්තනය කිරීම


## ගුණාත්මක යෙදවුම්ඃ

- ඇමුණුම 01, 02, 03, 04 හා 05
- පෙළ පොත
- බාලාවතාරය

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය II, III - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- පාලි භාෂාව හා රචනය - පැණිහෙල සිරි සම්බෝධි හිමි
- පාලි ව්‍යාකරණ විවරණය - මයිලෑවේ සිරිනිවාස නාහිමි
- විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය - මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි

**ඇමුණුම 01**




**ඇමුණුම් 2**

| | | |
|---|---|---|
| කම්මධාරය සමාසය | - | ද්විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො |
| තප්පුරිස සමාසය | - | අමාදයො පරපදෙහි |
| දිගු සමාසය | - | සංඛ්‍යා පුබ්බො දිගු |
| බහුබ්බීහි සමාසය | - | අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි |
| ද්වන්ද සමාසය | - | නාමානං සමුච්චයො ද්වන්දෙ |
| අබ්‍යයීභාව සමාසය | - | උපසග්ගනිපාතපුබ්බකො අබ්‍යයීභාවො |

## ඇමුණුම 03

| | |
|---|---|
| **සුමෙධො ච සො පණ්ඩිතො ච** | විග්‍රහ වාක්‍යය |
| **සුමෙධො පණ්ඩිතො** | අධික පද මකා දැමීම |
| **සුමෙධ පණ්ඩිත** | විභක්ති ප්‍රත්‍ය ලොප් කිරීම |
| **සුමෙධපණ්ඩිත** | සන්ධි කිරීම |
| **සුමෙධපණ්ඩිත + සි** | විභක්ති ප්‍රත්‍යය යෙදීම |
| **සුමෙධපණ්ඩිතො** | සමාස නාම පදය |

## ඇමුණුම 04

| **අසමාස පද** | **සමාස පදය** |
|---|---|
| පුරාණො විහාරො | පුරාණවිහාරො |
| ධම්මපාලො ආචරියො | ධම්මපාලාචරියො |
| තීනි මලානි | තිමලං |
| රඤ්ඤො පුරිසො | රාජපුරිසො |
| සාරිපුත්තො ච මොග්ගල්ලානො | සාරිපුත්තමොග්ගල්ලානො |

## ඇමුණුම 05

01. පහත සඳහන් සමාස පිළිබඳ වගුව සම්පූර්ණ කරන්න.

| | උද්ධෘත පදය | සමාස නාමය | විග්‍රහ වාක්‍යය | අර්ථය |
|---|---|---|---|---|
| 01 | පාදවන්දිකා | | | |
| 02 | යථාක්කමං | | | |
| 03 | භූමිචාලො | | | |
| 04 | මෙරුරාජා | | | |
| 05 | පුප්ඵවුට්ඨි | | | |

| | උද්ධෘත පදය | සමාස නාමය | විග්‍රහ වාක්‍යය | අර්ථය |
|---|---|---|---|---|
| 06 | නාගාසුරා | | | |
| 07 | සත්‍ථුසාසනං | | | |
| 08 | කාලානුරූපං | | | |
| 09 | මාතුනිබ්බුතිං | | | |
| 10 | අස්සුපුණ්ණො | | | |
| 11 | සුරියොදයෙ | | | |
| 12 | බුද්ධමාතරි | | | |
| 13 | ලොකපාලා | | | |
| 14 | පුප්ඵකඤ්චුකා | | | |
| 15 | ගන්ධමාලාභි | | | |
| 16 | දෙවමනුජා | | | |
| 17 | පුථුපඤ්ඤා | | | |
| 18 | දිබ්බචක්ඛුං | | | |
| 19 | පටිවාතං | | | |
| 20 | පඤ්චනෙත්තො | | | |

02. පහත සඳහන් අසමස්ත පද සමාස කරන්න.

i. මහතී ගොතමී
ii. නන්‍දො ච ආනන්‍දො ච
iii. භික්ඛුනීනං නිලයො
iv. බුද්ධස්ස සාසනං
v. සද්ධම්මස්ස ඨිතියා
vi. මහන්තො මුනි
vii. භවං එව අණ්ණවං
viii. තරුණො ආදිච්චො
ix. ගුණො එව භූසණො
x. දීඝා අඞ්ගුලියො
xi. ලොකස්ස අග්ගො
xii. මහන්තො වීරො
xiii. සංසාරො එව කන්තාරො
xiv. සබ්බං සඞ්කතං
xv. චතස්සො දිසා
xvi. තයො භවා
xvii. තිස්සො විජ්ජා
xviii. කම්මස්ස යථා
xix. සත්ත අහානි
xx. භත්තස්ස පුරෙ

# පාඩම 12 - තද්ධිත

**නිපුණතාව** : 9.0 පාලිභාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.1 තද්ධිත හඳුන්වා ප්‍රයෝජන දක්වයි.
9.2 තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය පැහැදිලි කරයි.
9.3 තද්ධිත ප්‍රභේද නම් කරයි.
9.4 ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි.
9.5 බාලාවතාර සූත්‍රානුසාරයෙන් තද්ධිත පද සාධනය කරයි.
9.6 තද්ධිත පද උපුටා දක්වා ප්‍රභේද නම් කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- තද්ධිත කෙටියෙන් හඳුන්වා දෙයි.
- තද්ධිත ප්‍රයෝජන ලියයි.
- පියවරෙන් පියවර තද්ධිත පද සාදා ගන්නා ආකාරය පෙන්වයි.
- තද්ධිත ප්‍රභේද ලියයි.
- නිදසුන් මගින් ප්‍රභේද විස්තර කරයි.
- බාලාවතාර සූත්‍රානුසාරයෙන් තද්ධිත පද සකස් කරයි.
- දෙනු ලබන තද්ධිත පදවල ප්‍රභේදය ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**

- පහත ගාථාව සජ්ඣායනා කරමින් හුණු පුවරුවේ ලියා දක්වන්න.
  **ණො ණායනො ච ණානො ච - ණෙය්‍යො ණි ච ණිකො තථා**
  **ණවො ණෙරො ච ණෙ‍ය්‍යා චාති - නව ගොත්තෙ පතිට්ඨිතා**
- එම ගාථාව හඬ නගා කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එය විශ්ලේෂණය කරමින් එහි ඇති තද්ධිත ප්‍රත්‍යය යටින් ඉරි අඳිමින් උපුටා දක්වන්න.
- තද්ධිත යනු **ප්‍රත්‍යයවලට ප්‍රමුඛත්වය ලැබෙන**, ඒ ප්‍රත්‍යය නිසා අර්ථය වෙනස් වන පද විශේෂයක් බව පැහැදිලි කරන්න.
- යම් සේ 'නුග' හෝ 'බෝ' හෝ කුඩා බීජයක් තුළ විශාල වෘක්ෂයක ශක්තිය ගබඩා වී ඇත්තා සේ 'තද්ධිත ප්‍රත්‍යයක්' තුළ විශේෂ අර්ථ ගබඩා වී ඇති බව සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**

- ඇමුණුම 01 සිසුන්ට ලබා දෙන්න.
- එය ආශ්‍රයෙන් සමස්තයක් ලෙස තද්ධිත ගැන සරල හැඳින්වීමක් කරන්න.
- පෙළ පොත ඇසුරින් තද්ධිත හඳුන්වා එහි ප්‍රයෝජන පැහැදිලි කරන්න.
- තද්ධිත පද සාධනයේ දී සංයුක්ත නොවූ ස්වරවලට සිදුවන '**ආදිස්වර වෘද්ධිවීම**' පැහැදිලි කරන්න.
- තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය විස්තර කරන්න.
- තද්ධිත පද සාධනයට අදාළ බාලාවතාර සූත්‍ර වාචෝද්ගත කරවන්න.
- පෙළ පොත ඇසුරින් **තද්ධිත ප්‍රභේද** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.
- තද්ධිත යනු සන්ධි, සමාස යන ව්‍යාකරණ විධි දෙකට ම වඩා පද සංක්ෂේප කරන ව්‍යාකරණ විධියක් බව අගයමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- පෙළ පොතේ අදාළ ඡේද වෙත සිසු අවධානය යොමු කරවා එහි ඇති තද්ධිත පද උපුටා දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- තද්ධිත ප්‍රභේද 06 සඳහන් කරන ලද කුසපත් ඇදීමකින් සෑම ශිෂ්‍යයකුට ම පහත කරුණු ඇතුළත් ව (සුදුසු පරිදි හුණු පුවරුව ද භාවිත කරමින්) තමා ලබාගත් තද්ධිත ප්‍රභේදය පිළිබඳ ක්ෂණික කථාවක් කිරීමට මිනිත්තු තුනක කාලයක් ලබා දෙන්න.
    - තද්ධිත ප්‍රභේදය
    - (ඇතොත්) අනු ප්‍රභේදය
    - නිදසුන් වචන
    - ඒවායේ ප්‍රත්‍යය
    - අදාළ තද්ධිත පදය සෑදීමේ දී භාවිත බාලාවතාර සූත්‍ර
    - අදාළ තද්ධිත පද යෙදූ වාක්‍ය කීපයක්
    - භාෂා ව්‍යවහාරයේ දී තද්ධිත පද භාවිතයෙන් ලැබෙන ප්‍රයෝජන
- පෙළ පොතේ සහ ඇමුණුම 02 අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් සංකල්පඃ

- **තද්ධිත** - නාමයන්ගේ අගට විශේෂ අර්ථ පැවසෙන තද්ධිත ප්‍රත්‍යය එක් කොට සාදා ගන්නා ලද නාම තද්ධිත නම් වේ. මෙය ප්‍රත්‍යයවලට ප්‍රමුඛත්වය දෙමින් සාදා ගන්නා නාමයක් හෙයින් 'ප්‍රත්‍යාර්ථ නාම' ලෙස ද හැඳින්වේ.
- **ආදි ස්වර වෘද්ධිය** - සංයුක්ත නොවූ නාම පදයේ මුල් ස්වරය වෘද්ධි කිරීම
  (අ > ආ / ඉ, ඊ > එ /උ, ඌ > ඔ)

## ඇගයීම හා තක්සේරුකරණය :

- තද්ධිත නාමයක් යනු කුමක් දැයි පැහැදිලි කිරීම
- තද්ධිත ප්‍රභේද නම් කිරීම
- තද්ධිතවල ප්‍රයෝජන ප්‍රකාශ කිරීම
- තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය ලියා දැක්වීම
- තද්ධිත ප්‍රභේද නිදසුන් මගින් පැහැදිලි කිරීම
- තද්ධිත පද සාධනයට අදාළ බාලාවතාර සූත්‍ර මතකයෙන් කීම
- තද්ධිත පදවල අර්ථය ප්‍රකාශ කිරීම හා ලිවීම

## ගුණාත්මක යෙදවුම්ඃ

- ඇමුණුම 01 හා 02
- තද්ධිත ප්‍රභේද සහ අනු ප්‍රභේද ලියන ලද කුසපත් හයක්
- පෙළ පොත
- බාලාවතාරය


## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි ව්‍යාකරණ විවරණය - මයිලෑවේ සිරිනිවාස නාහිමි
- පාලි භාෂාව හා රචනය - පැණිහෙල සිරි සම්බොධි හිමි
- පාලි භාෂාවතරණය II, III - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය - මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි

**ඇමුණුම 01**

**සාමඤ්ඤ වුද්ධි භාවත්ථා - ව්‍යයතො තද්ධිතං තිධා**

**තත්‍රාධි චතුධාපච්චා - නෙකත්තත්ථ්‍යත්ථ සංඛතො**




**ඇමුණුම 02**

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
- i. සාමඤ්ඤ තද්ධිතයේ අනු කොටස් නම් කරන්න.
- ii. තද්ධිතවල ප්‍රයෝජන හතරක් ලියා දක්වන්න.
- iii. භාව තද්ධිතයට නිදසුන් දෙකක් සපයන්න.
- iv. අනේකත්ථ තද්ධිත පදයක් හඳුනා ගත හැකි ලක්ෂණයක් දක්වන්න.
- v. **ආලු, තර, තම, වන්තු, මන්තු** යන ප්‍රත්‍යය අයත් වන තද්ධිත ප්‍රභේදය නම් කරන්න.
- v. **දොවාරික** යන පදයේ ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.
- vii. **ණෙර විධවාදිතො** සූත්‍රයෙන් ප්‍රකාශ වන අර්ථය ලියන්න.

02. පහත වගන්තිවල ඇති තද්ධිත පද උපුටා දක්වන්න.
- i. මාගධො බිම්බිසාරො මහාරාජා ද්වීසු අංගමගධරට්ඨෙසු ආදිච්චං විය රජ්ජං කාරෙසි.
- ii. එකං සමයං ආයස්මා මහා කස්සපත්ථෙරො ගෙලඤ්ඤෙන පීළිතො රාජගහතො අවිදූරෙ පිප්ඵලි ගුහායං විහාසි.
- iii ආනන්දත්ථෙරො භගවතො සාවකෙසු බාහුසච්චෙන ච පණ්ඩිච්චෙන ච මහානීයතරො අහොසි.
- iv. මෙධාවිනී මාණවී දුල්ලභං මනුස්සත්තං ලභිත්වා බහුං පුඤ්ඤං කාතුමුස්සහති.
- v. ගුණවතී නාමිකී සීලවන්තිං භික්ඛුණිං නිමන්තෙත්වා දානමදාසි.

03. පහත සඳහන් තද්ධිත පදවල තද්ධිත ප්‍රභේදය නම් කරන්න.

| තද්ධිත පදය | සිංහල අර්ථය | ප්‍රභේදය /අනු ප්‍රභේදය |
|---|---|---|
| හත්‍ථික | අතින් උසුලන්නා | |
| ධම්මික | ධර්මයෙහි හැසිරෙන | |
| පාපිට්ඨ | වඩා පාපී වූ | |
| අභිජ්ඣාලු | බොහෝ ලෝභ ඇති | |
| අජ්ජතන | අද පටන් | |
| සබ්බථා | සෑම අයුරකින් | |
| එකක්ඛත්තු | එක්වරක් | |
| කොසල්ල | හසුරු බව | |
| එකධා | එක් අයුරකින් | |
| දුතිය | දෙවැනි | |
| ගුණවන්තු | ගුණ ඇති | |
| නීලත්ත | නිල් බව | |
| අඤ්ඤථා | අන් අයුරකින් | |
| වච්චායන | වත්සගේ පුතා | |
| නාවික | නැවින් එතෙර වූයේ | |
| සතිමන්තු | සිහි ඇති | |
| අඩ්ඪතිය | දෙකහමාර | |
| කත්තිකෙය්‍ය | කාර්තිකාගේ පුතු | |
| ඔළුම්පික | පහුරෙන් එතෙර වූයේ | |
| චම්පෙය්‍යක | චම්පාවෙහි උපන් | |

**04. පහත සඳහන් වාක්‍යවල තද්ධිත පද උපුටා දක්වා ඒවායේ ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.**

i. අයං මානවො මට්ටකුණ්ඩලී නාම.
ii. ධම්මභණ්ඩාගාරිකො ආනන්දත්‍ථෙරො ජෙතවනාරාමෙ විහරති.
iii. සෙට්ඨිපුත්තො බුද්ධස්ස සන්තිකෙ පබ්බජි.
iv. මාගධිකො බිම්බිසාරො රාජගහං පාවිසි.
v. අථ ඛො ආනන්දො කොසිනාරකං මල්ලානං එතදවොච.
vi. සමණො හො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො රාජගහං ආගච්ඡති.
vii. සංසෙ ගොතමී දෙහි.
viii. සෙට්ඨිස්ස සත්තවස්සිකො සීසාබාධො අහොසි.
ix. අම්හාකං බුද්ධො භගවා නවමෙ වස්සෙ ලංකාදීපමුපාගමි.
x. සාමණෙරො වෙසාලියං පත්‍ථා මානවකෙන සහ නික්ඛමි.

05. පහත සඳහන් නාමවලට **ණ, ණායන, ණ්‍ය, ණික, ණක, ණෙර, ක්ඛත්තු, ත්තන, ණව, ථ, ඊය, ඉට්ඨ, ථා** අතුරින් අදාළ ප්‍රත්‍යය තෝරා ගෙන අර්ථවත් තද්ධිත නිර්මාණය කරන්න.

| නාමය | යොදන ලද ප්‍රත්‍යය | තද්ධිත පදය |
|---|---|---|
| එක | | |
| පුථුජ්ජන | | |
| කුසල | | |
| සබ්බ | | |
| කච්ඡ | | |
| සත | | |
| සීස | | |
| සමණ | | |
| උළුම්ප | | |
| වසිට්ඨ | | |
| මනුස්සජාති | | |
| උපගු | | |
| කුරු | | |
| තණ්ඩුල | | |
| මනස | | |
| වීණා | | |
| බන්ධ | | |
| කුසිණාරා | | |
| පාප | | |
| චතු | | |

**06. පහත සඳහන් තද්ධිත පදවල අර්ථය ලියන්න.**

| තද්ධිත පදය | සිංහල අර්ථය |
| --- | --- |
| වාසුදෙව | |
| සාරීරික | |
| පච්ඡිමො | |
| හාලිද්ද | |
| චම්පෙය්‍යක | |
| පාපිස්සික | |
| දයාලු | |
| මෙධාවී | |
| කොසල්ල | |
| එකධා | |
| මනුස්සත්ත | |
| පාටව | |
| කතඤ්ඤුතා | |
| රමණීයකං | |
| පඤ්චම | |
| සබ්බථා | |
| බුද්ධිමන්තු | |
| තෙලික | |
| ධම්මික | |
| දණ්ඩික | |

# පාඩම 13 - කිතක

**නිපුණතාව** : 10.0 පාලි භාෂාවේ කිතක පද හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 10.1 කිතක පද හඳුන්වයි.
10.2 කිතක පද සාධනය පැහැදිලි කරයි.
10.3 කිතක ප්‍රභේද ලියයි.
10.4 බාලාවතාර සූත්‍රානුසාරයෙන් කිතක පද යොදයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- කිතක නාම හා ක්‍රියා අව්‍යය වශයෙන් භාවිත වන බව පෙන්වයි.
- බාලාවතාර සූත්‍රානුසාරයෙන් කිතක පද සාදයි.
- කිතක ප්‍රභේද ලියා නිදසුන් දෙයි.
- කිතක පද උපුටා දක්වයි.
- කිතක පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**

- ඇමුණුම 01 හි අඩංගු කිතක පද ඇතුළත් වාක්‍ය හුණු පුවරුවේ ලියන්න.
- ඒවා සිසුන් සමඟ සාකච්ඡා කරමින් එහි ඇති කිතක පද මොනවා දැයි සිසුන්ගෙන් ප්‍රශ්න කරන්න.
- කිතක පදවල වැදගත්කම පෙළ පොත ඇසුරින් පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**

- කිතක පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- පෙළ පොතේ අදාළ වගුව වෙත සිසු අවධානය යොමු කරන්න.
- බාලාවතාර සූත්‍රානුසාරයෙන් වර්තමාන කිතක පද නිර්මාණය කරගන්නා අයුරු පැහැදිලි කරන්න.
- වර්තමාන කිතක පද වාක්‍යවල විවිධාකාරයෙන් (නාම විශේෂණ, මිශ්‍ර ක්‍රියා) යෙදෙන අයුරු උදාහරණ මගින් පැහැදිලි කරන්න.
- වර්තමාන කිතක පද විශේෂණ පද ලෙස යෙදෙන විට විශේෂ්‍ය පදයට අනුරූප ව වරනැගෙන බව පෙළ පොත ඇසුරින් පහදන්න.
- **අව්‍යය කිතකපද** යනු මොනවා දැයි විස්තර කරන්න.
- එහි ප්‍රභේද නම් කොට හඳුන්වා දෙන්න.
- **අව්‍යය කිතක** පද නිර්මාණය කරගන්නා අයුරු බාලාවතාර සූත්‍රානුසාරයෙන් පහදන්න.
- **කිච්ච කිතක** නිර්මාණය කරගන්නා අයුරු පෙළ පොත ඇසුරෙන් විස්තර කරන්න.
- කිච්ච කිතක වාක්‍යවල භාවිත වන අයුරු නිදසුන් සහිත ව පහදා දෙන්න.
- ඇමුණුම 02 සිසුන්ට සපයා එහි දැක්වෙන ආකාරයට **ත්‍රෛකාලික කිතක** පද සෑදෙන අයුරු පැහැදිලි කරන්න.
- පෙළ පොතේ ඇති **කර්තෘකාරක කෘදන්ත** වෙත සිසු අවධානය යොමු කරන්න.
- විවිධ ධාතුවලට විවිධ කිතක ප්‍රත්‍යය එක් වී විවිධ අරුත් ඇති විවිධ කිතක පද සෑදෙන ආකාරය පෙළ පොත ඇසුරින් පහදා දෙන්න.
- ඇමුණුම 03 සිසුන්ට සපයා එහි දැක්වෙන ආකාරයට අතීත කිතක පද විවිධ වෙනස්කම් සහිත ව නිර්මාණය වන අයුරු බාලාවතාර සූත්‍ර ඇසුරෙන් විස්තර කරන්න.

- කිතක පද සහිත විවිධ වාක්‍ය සිසුන් ලවා නිර්මාණය කරවන්න.
- නිර්දිෂ්ට පාඨවල ඇතුළත් කිතක පද උපුටා ලිවීමට සිසුන් උනන්දු කරවන්න.
- පෙළ පොතේ සහ ඇමුණුම 04 අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් සංකල්ප

- **කිච්ච කිතක** - කර්ම කාරකයෙහි හා භාව කාරකයෙහි වන පද විශේෂය යි.
- **ත්‍රෛකාලික කිතක** - කාල තුනෙහි ම යෙදෙන කිතක පද
- **වර්තමාන කිතක** - වර්තමාන කාලයෙහි වන කිතක පද
- **අතීත කිතක** - අතීත කාලයෙහි යෙදෙන කිතක පද
- **අව්‍යය කිතක** - පූර්ව ක්‍රියා හා තුමන්ත ක්‍රියා

## ඇගයීම හා තක්සේරුකරණය :

- කිතක වර්ග නම් කිරීම
- කිතක යනු මොනවා දැයි අර්ථකථනය කිරීම
- බාලාවතාර සූත්‍රානුසාරයෙන් වර්තමාන කිතක පද නිර්මාණය කිරීම
- කිතක පද වාක්‍යවල යෙදෙන අයුරු විස්තර කිරීම
- කිච්ච කිතක පද නිර්මාණය කිරීම
- කිච්ච කිතක පද භාවිත කොට නිවැරදි ව වාක්‍ය නිර්මාණය කිරීම
- ත්‍රෛකාලික කිතක පද නිර්මාණය කර ප්‍රකාශ කිරීම සහ ලිවීම
- අතීත කිතක පද නිර්මාණය කර අර්ථ ගැන්වීම
- අව්‍ය කිතක පද නිර්මාණය කොට ඒවා වාක්‍යවල යෙදීම
- කිතක පද සහිත විවිධ වාක්‍ය ප්‍රකාශ කිරීම සහ ලිවීම
- නිර්දිෂ්ට පාඨවල ඇතුළත් කිතක පද උපුටා දැක්වීම

## ගුණාත්මක යෙදවුම්

- ඇමුණුම 01, 02, 03 හා 04
- පෙළ පොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- බාලාවතාරදීපනී - බොරලන්දේ ධම්මරතන හිමි
- පාලිභාෂාවතරණය II, III - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි

**ඇමුණුම 01**

1. **ගච්ඡන්තො** පුරිසො **කුම්භකාරෙන** සද්ධිං ගාමං **ගන්ත්වා නාටකං** අපස්සි.
2. **ආහිණ්ඩන්තො** සුනඛො ධාවන්තං සසකං **පස්සිත්වා** තං **ගණ්හිතුං** අනුබන්ධි.
3. **නායකො** ගණං **ආමන්තෙතුං** නගරං **ගතො.**
4. **දායකො** සාවකෙහි සද්ධිං විහාරං **ගන්ත්වා** සංඝෙ **උපට්ඨිතො.**
5. **ධම්මධරා** භික්ඛූ වස්සානසමයෙ අනුදිනං **පාලකානං** ධම්මං **දෙසිතා.**
6. **සන්තො දන්තො ගුත්තො** උපාසකො **භින්නං** ඝටං **දිස්වා** අනිච්චසඤ්ඤං භාවෙසි.

**ඇමුණුම 02**

| නාමය | ධාතුව | ප්‍රත්‍යය | කිතක නාමය |
|---|---|---|---|
| කුම්භ | ✓කර | ණ | කුම්භකාර |
| | ✓නී | අක | නායක |
| | ✓දා | අන | දාන |
| | ✓කර | තු | කත්තු |
| භය | ✓දිස | ආවී | භයදස්සාවී |

**ඇමුණුම 03**

| ධාතුව | අතීත 'ත' ප්‍රත්‍යය | කිතක පදය |
|---|---|---|
| ✓භුජ | ත | භුත්ත |
| ✓කුධ | ත | කුද්ධ |
| ✓සම | ත | සන්ත |
| ✓තර | ත | තිණ්ණ |
| ✓භිද | ත | භින්න |
| ✓දිස | ත | දිට්ඨ |

**ඇමුණුම 04**

01. පහත දැක්වෙන කිතක විශේෂණ පද සහිත වාක්‍ය ඛණ්ඩ යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

i. යාචන්තස්ස යාචකස්ස
ii. ගච්ඡන්තෙන සහායකෙන සද්ධිං
iii. ධාවන්තො බාලකො
iv. කීළමානා දාරිකා
v. පචන්තං සූදං
vi. පඨන්තා සිස්සා
vii. සයමානං ඉමං දාරකං
viii. වදන්තං සාමණෙරං
ix. නිසීදන්තියා නාරියා
x. පතන්තානි ඵලානි

02. සුදුසු පරිදි කිතක පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. වනං ......................................... පුරිසො ......................................... සීහං පස්සි.
ii. දාරකො දන්තං ......................................... හසති.
iii. උපාසකා ධම්මං ......................................... භික්ඛු සන්තිකං අගමිංසු.
iv. ථෙරො ධම්මං ......................................... රුක්ඛමූලෙ අට්ඨාසි.
v. සාමණෙරා පාලිභාසං ......................................... පරිවෙණං ගච්ඡන්ති.
vi. පුරා රාජා අරීහි සද්ධිං ......................................... ඉමං දීපං එකච්ඡත්තං අකරි.
vii. අම්හෙහි පුඤ්ඤං ......................................... හොති.
viii. උපාසිකා විහාරං ......................................... අංගණං සම්මජ්ජති.
ix. යාචකො ආහාරං ......................................... මග්ගෙ ආහිණ්ඩති.
x. වාණිජා භණ්ඩානි ......................................... නගරං පවිසිංසු.
xi. ගජා වනෙ ......................................... එකං වාපිං පස්සිංසු.
xii. ආචරියා පාඨසාලං ......................................... සිස්සෙ ආමන්තෙසුං.
xiii. තුම්හෙහි ......................................... කුසලං ......................................... බ්‍රහ්මචරියං
xiv. අනාථපිණ්ඩිකො සෙට්ඨි පතිදිනං භගවන්තං ......................................... ජෙතවනං ගච්ඡි.
xv. කුම්භකාරො ගාමං ......................................... වනං පාවිසි.

03. පහත දැක්වෙන වාක්‍ය අව්‍යය කිතක යොදා තනි වාක්‍ය බවට පත්කරන්න.

i. සාමණෙරො චෙතියඞ්ගණං සම්මජ්ජති. සාමණෙරො බුද්ධං වන්දති.
ii. වනිතායො නගරං ගච්ඡන්ති. වනිතායො භණ්ඩානි කිණන්ති.
iii. දාරකා කන්දුකකීළං කීළන්ති. දාරකා අඞ්ගණං ගච්ඡන්ති.
iv. යාචකො ධනං යාචති. යාචකො ධනං ලභති.
v. දාසා පාතොව කවාටෙ විවරන්ති. දාසා සායණ්හෙ කවාටෙ සංවරන්ති.
vi. වාණිජා සකටෙහි භණ්ඩානි ආදාය නගරං ගච්ඡන්ති. වාණිජා භණ්ඩානි වික්කිණිත්වා ධනං ලභන්ති.
vii. උපාසිකා ජම්බුදීපං ගච්ඡති. උපාසිකා කොළම්බනගරං ගච්ඡති.
viii. මම සහායකො ජලං ආහරති. මම සහායකො වාපිං ගච්ඡති.
ix. භික්ඛු ධම්මං මනසිකරොති. භික්ඛු චිත්තං සොධෙති.
x. සිස්සා පඤ්හං පුච්ඡිංසු. සිස්සා ආචරියස්ස සන්තිකං අගමංසු.

04. පහත සඳහන් වාක්‍ය වර්තමාන කිතක පද භාවිත කොට තනි වාක්‍ය ලෙස ලියන්න.

i. වෙජ්ජො රොගීනං තිකිච්ඡති. වෙජ්ජො ගාමෙ විචරති.
ii. ආචරියා සිස්සෙ විනෙන්ති. ආචරියා සිස්සානං ඔවාදං දදන්ති.
iii. කුමරො රථෙන නගරං ගච්ඡති. කුමාරො මග්ගෙ ගච්ඡන්තං එකං සහායකං අපස්සි.
iv. තච්ඡකා පාසාදං මාපෙන්ති. රාජා සහ පරිවාරෙන උපසඞ්කමි.
v. එකො සිස්සො ගීතං ගායති. එකො සිස්සො වීණං වාදයති.
vi. දාසො භත්තං භුඤ්ජති. දාසො ජලං පිබති.
vii. සකුණා ආකාසෙ උඩ්ඩෙන්ති. සකුණා කූජන්ති.
viii. උපාසකො ධම්මං සුණාති. උපාසකො පඤ්හෙ පුච්ඡති.
ix. තෙ දළිද්දානං උපකාරං කරොන්ති. තෙ බහූනි පුඤ්ඤානි පසවන්ති.
x. අහං සම්මා උග්ගණ්හාමි. අහං කදාචි පණ්ඩිතො භවාමි.

# පාඩම 14 - උදානපාළි සහ අපදානපාළි

**නිපුණතාව** : 11.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි.

**නිපුණතා මට්ටම** : 11.1 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
11.2 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට නගයි.
11.3 පාලි පාඨ රුචිකත්වයෙන් යුතු ව කියවයි.
11.4 නිර්දිෂ්ට පාඨවල ඇති ජීවන දර්ශනය පෙන්වයි.

**කාලච්ඡේද** : 34 යි.

**ඉගෙනුම් පල** :

- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ රුචිකත්වයෙන් සහ අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය රස වින්දනයේ යෙදෙයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍යවල ධර්ම කරුණු එක්රැස් කරයි.
- පාලි පාඨ මාධ්‍ය භාෂාවට නගයි.
- සාරධර්ම චරිතායනය කරයි.
- සූත්‍ර පාඨ යොදා ගනිමින් ධර්ම දේශනා පවත්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**

- ත්‍රිපිටකය විකාශනය වූ ආකාරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- පෙළ පොතේ ඇති වගුව වෙත සිසු අවධානය යොමු කරමින් ත්‍රිපිටකය බෙදී ගොස් ඇති ආකාරය පැහැදිලි කරන්න.
- ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ නාමාවලිය සිසුන් සමග ශබ්ද නගා කියවන්න.
- පෙළ පොත ඇසුරින් **උදානපාළි** උපුටා ගැනීමේ අනුක්‍රමය සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 01 (උදානපාළි)**

- '**උදාන**' යන්න විස්තර කරමින් ඛුද්දක නිකාය තුළ උදානපාළියට හිමි තැන පැහැදිලි කරන්න.
- පෙළ පොත ඇසුරින් '**උදාන**' යන වචනය විස්තර කරන පාලි පාඨය වාචෝද්ගත කරවන්න.
- පෙළ පොත ඇසුරින් උදානපාළියේ අන්තර්ගත වග්ග අට නම් කිරීමට සිසුන් යොමු කරන්න.
- සංගාමජි සූත්‍රය බෝධිවග්ගයටත්, ගබ්භිනී සූත්‍රය මුචලින්ද වග්ගයටත්, නන්ද සූත්‍රය නන්ද වග්ගයටත් ඇතුළත් වන බව පෙන්වන්න.
- නියමිත ගද්‍ය පාඨ උච්චාරණ භේදය පැහැදිලි වන පරිදි සිසුන් ද සමග ශබ්ද නගා කියවන්න.
- **කාරකාර්ථ, වාක්‍ය, රීති** යනාදිය පිළිබඳ සැලකිලිමත් වෙමින් නිර්දිෂ්ට කොටස් මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර පෙන්වන්න.
- විශේෂිත පද කීපයක් ගද්‍ය පාඨවලින් උපුටා **ව්‍යාකරණ ලක්ෂණ** විභාග කරන්න.
- නියමිත සූත්‍රවල අන්තර්ගත කරුණු සමාලෝචනය කරන්න.
- අදාළ සූත්‍ර පාඨවල එන **රූඪී, සංවාදාත්මක භාෂණ, හාස්‍යෝත්පාදක ප්‍රකාශ** උපුටා දක්වන්න.
- උදානපාළියේ නියමිත සූත්‍ර කොටස්වල අර්ථ වනපොත් කිරීමට උපදෙස් දෙන්න.
- ගද්‍ය පාඨවල වාක්‍ය ක්‍රම උපුටමින් පාලි සාම්ප්‍රදායික වාක්‍ය රටා හඳුන්වන්න.
- නිර්දිෂ්ට සූත්‍රවල ධර්ම කරුණු වෙන වෙන ම ලියා දක්වන්න.
- අදාළ සූත්‍ර තුළින් උපුටා ගත් කෙටි මාතෘකා සිසුන්ට ලබා දෙමින් මිනිත්තු 03 ක පමණ ක්ෂණික කථා තරගයක් පවත්වන්න.
- පෙළ පොතේ අභ්‍යාස වෙත සිසුන් යොමු කරන්න.

## පියවර 02 (මහාප්‍රජාපතීගෝතමී අපදානය)

- මහාප්‍රජාපතීගෝතමී අපදානයෙන් උපුටා ගත් මාතෘත්වය පිළිබිඹු වන පහත දැක්වෙන අනුවේදනීය අර්ථ ප්‍රකාශක ගාථාව හුණු පුවරුවේ ලියන්න.
  **මුහුත්ත'තණ්හාසමණං ඛීරං ත්වං පායිතො මයා,**
  **තයා'හං සන්තමච්චන්තං ධම්මඛීරං ස පායිතා.**
- එහි අර්ථය පැහැදිලි කරන්න.
- පෙළ පොත ඇසුරින් අපදානපාළි උපුටා ගැනීමේ අනුක්‍රමය සාකච්ඡා කරන්න.
- අපදානපාළියේ වග්ග හතර නම් කිරීමට සිසුන් යොමු කරන්න.
- අපදානපාළියේ ව්‍යුහය පැහැදිලි කරන්න.
- මහාපජාපතීගොතමී අපදානය නිවැරැදි ව උච්චාරණය කර කියවන්න.
- නිර්දිෂ්ට පද්‍යවලට අන්වය ගළපමින් අර්ථ තේරුම් ගෙන පදගතාර්ථ සපයන ආකාරය සාකච්ඡා කරන්න.
- අවශ්‍ය තැන්හි අටුවා විවරණ ද ආශ්‍රය කොට ගෙන පද්‍යවල දුෂ්කර පද  විග්‍රහ කරන්න.
- නියමිත අපදානයේ සඳහන් **උපමා, රූපක, අනුප්‍රාසාදි** නිතර යෙදෙන කාව්‍යාලංකාර කිහිපයක් පෙන්වා දෙන්න.
- අලංකාරාත්මක හා අර්ථපූර්ණ ගාථා කිහිපයක් වනපොත් කරවන්න.
- නිර්දිෂ්ට අපදානය තුළ එන ධර්ම කරුණු උපුටා සාකච්ඡා කරන්න.
- මහාපජාපතීගෝතමී අපදානය පිළිබඳ මාධ්‍ය භාෂාවෙන් වර්ණනාත්මක නිර්මාණයක් (ගද්‍ය/පද්‍ය) ගොඩනැංවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 01 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් හා සංකල්ප

- **උදාන** - ප්‍රීති වේගයෙන් නඟා ලූ වචන උදාන නම් වේ. (**සොමනස්සඤාණමයිකගාථා පටිසංයුත්තා ද්වෙඅසීති සුත්තන්තා උදානන්ති වෙදිතබ්බං**)
- **රූඪී** - පාලි භාෂාවේ විශේෂාර්ථවත් වාක්‍යාංශ
- **සංවාදාත්මක භාෂණ** - සංවාදාත්මක ස්වරූපය ඇති වාක්‍ය කොටස්
- **හාස්‍යොත්පාදක ප්‍රකාශ** - කියවන විට හාෂ්‍ය රසය ජනිතවන කියමන්
- **අපදාන** - ථෙර ථෙරීන්ගේ අතීත චරිත කථා විවරණය කෙරෙන සූත්‍ර

## ඇගයීම හා තක්සේරුකරණය :

- නිර්දිෂ්ට ගද්‍ය පාඨ රුචිකත්වයෙන් කියවීම
- නියමිත පාඨවල අර්ථ ප්‍රකාශ කිරීම හා ලිවීම
- පාලි සාම්ප්‍රදායික වාක්‍ය රටා අවස්ථාවෝචිත ව භාවිත කිරීම
- නියමිත සූත්‍රවල ධර්ම කරුණු පිළිබඳ අවබෝධයෙන් හා ගාථා පාඨ යොදා ගනිමින් ධර්ම දේශනා පැවැත්වීම

## ගුණාත්මක යෙදවුම්

- ඇමුණුම 01
- පෙළ පොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- උදානපාළි - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව
- අපදානපාළි (ථෙරී අපදාන) - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව
- පාලි සිංහල අකාරාදිය - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- පාලි සිංහල ශබ්දකෝෂය - මඩිතියවෙල සිරි සුමංගල හිමි

**ඇමුණුම 01**

01. නියමිත පද යොදා සම්පූර්ණ කරන්න.

i. ආයන්තිං ................................ ................................ න සොචති.
සඞ්ගා ................................ මුත්තං ................................ ................................ බ්‍රාහ්මණං

ii. ................................ ඛො ................................ ................................ සඞ්ගාමජී ................................ අනුප්පත්තො හොති.

iii. අථ ඛො ................................ සඞ්ගාමජිස්ස පුරාණ දුතියිකා ................................ සඞ්ගාමජි තෙනුපසඞ්කමි.

iv. අථ ඛො ................................ ................................ විදිත්වා ................................ වෙලායං ................................ උදානං උදානෙසි.

v. අථ ඛො ................................ පරිබ්බාජිකා ................................ පරිනිබ්බාණං................................

vi. ගච්ඡ ................................ බ්‍රාහ්මණ තෙලං ................................ යං මෙ ................................ භවිස්සති.

vii. සුඛිනො ................................ ................................ අකිඤ්චනා - ................................ හි ................................ අකිඤ්චනා ................................ පස්ස................................ - ජනො ................................ පටිබද්ධචිත්තො

viii. එතමත්තං ................................ ඛො සො භික්ඛු ................................ එතදවොච.

ix. අද්දසා ඛො ................................ තං පරිබ්බාජකං ................................ ................................ ................................ ................................ ................................ ථූට්ඨං ................................ ................................

x. ................................ ඛො ................................ ................................ එතදහොසි.

02. පහත සඳහන් අර්ථය දෙන පාලි පදය නිර්දිෂ්ට කොටසෙන් උපුටා ලියන්න.

i. ගිහිබවට යන්නෙමි
ii. අඩක් පීරන ලද
iii. අප්සරාවන් පන්සීයක්
iv. පරෙවි බඳු පා ඇති
v. සමීපයේ තැබීමට ද නො එයි
vi. ඇපවෙමි
vii. බැලමෙහෙකරු වාදයෙන්
viii. පෙළනු ලබන්නේ
ix. දිය පොදකින් ධෝවනය කරගත්
x. භික්ෂුණී ආරාමයෙන්
xi. පාමුල වැටී
xii. භවසාගරය
xiii. සියලු දෝෂයන්ට ආකරයකි
xiv. වාදීන්ගේ මානය මඩින
xv. සර්පයන් වසන තුඹසක් වැනි

# පාඩම 15 - පාලි සාහිත්‍යයේ සුවිශේෂ චරිත

**නිපුණතාව** : 12.0 පාලි සාහිත්‍යයේ සුවිශේෂ චරිත හඳුනා ගෙන චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම** : 12.1 අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ පෝෂණයට සිදු වූ මෙහෙය ලියයි.
12.2 අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ පෝෂණයට සිදු වූ සේවාව පිළිබඳ කථාවක් පවත්වයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :

- අදාළ චරිතවලින් පාලි සාහිත්‍යයේ සංවර්ධනය උදෙසා වූ උදාර දායකත්වය අභිරුචියෙන් යුක්ත ව පෙන්වයි.
- පාලි සාහිත්‍යයේ පෝෂණය උදෙසා තම දායකත්වය සපයයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයː**

- අටුවාචාරී බුද්ධඝෝෂ මාහිමි, දිඹුලාගල මහාකාශ්‍යප මාහිමි, පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි සහ රීස් ඩේවිඩ්ස් මැතිතුමා යන පඬිවරුන් විසින් රචිත ග්‍රන්ථයක් හෝ කිහිපයක් සිසුන්ට ප්‍රදර්ශනය කොට පෙළ පොතේ ඇති ඡායාරූප ද පෙන්වා ඒ පඬිවරුන්ගේ වටිනාකම හා මෙහෙවර පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එම මෙහෙවර සම්බුද්ධ සාසනයේ චිරස්ථිතියට හේතු වූ ආකාරය පහදන්න.
- එම චරිත චරිතායනය කළ යුතු චරිත ලෙස දක්වන්න.

**පාඩම සංවර්ධනයː**

**පියවර 01 (බුද්ධඝෝෂ මාහිමි)**

- පාලි අටුවා රචනයේ ප්‍රමුඛයා බුද්ධඝෝෂ මාහිමි බව පෙන්වා දෙන්න.
- බුද්ධඝෝෂ මාහිමි අටුවාකරණයට යොමු වූ ආකාරය දැක්වෙන කථා ප්‍රවෘත්තිය විස්තර කරන්න.
- උන්වහන්සේ විසින් රචිත අටුවා ග්‍රන්ථ පෙළ පොතට අනුව හඳුන්වා දෙන්න.
- පෙළ පොත ඇසුරින් බුදුදහමේ හා පාලි සාහිත්‍යයේ අභිවර්ධනයට බුද්ධඝෝෂ මාහිමියන්ගෙන් සිදු වූ මෙහෙවර ගැන සමාලෝචනයක යෙදෙන්න.
- පෙළ පොතේ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

**පියවර 02 (දිඹුලාගල කාශ්‍යප මාහිමි)**

- පෙළ පොත ඇසුරින් දිඹුලාගල කාශ්‍යප මාහිමි වැඩ සිටි යුගයේ ආගමික, සාමාජික, දේශපාලනික පසුබිම ගැන සිසුන් දැනුවත් කරන්න.
- පොළොන්නරු යුගයේ සාහිත්‍ය මූලාශ්‍රවල උන්වහන්සේ ගැන සඳහන් වන තොරතුරු ගෙන හැර දක්වන්න.
- උන්වහන්සේගෙන් සිදු වූ ශාසනික මෙහෙවර සිසුන් ලවා ලියවන්න.
- පෙළ පොතේ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

**පියවර 03 (පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි)**

- මෑතකාලීන පාලි උගතුන් අතර පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන්ට හිමි වන ගෞරවනීය ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරන්න.

- පාලි භාෂාව හැදෑරීමේ දී උන්වහන්සේ දැක් වූ කුසලතාව හා ඉමහත් කැපකිරීම සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ශිෂ්‍ය ජීවිතයට බුද්ධදත්ත නාහිමි චරිතයෙන් ගත හැකි ආදර්ශ මතු කොට පෙන්වන්න.
- ඇමුණුම 01 සිසුන්ට සපයා උන්වහන්සේ ලියූ ග්‍රන්ථවල තේමා අධ්‍යයනය කරවන්න.
- පෙළ පොතේ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

## පියවර 04 (රීස් ඩේවිඩ්ස් පඬිතුමා)

- පෙළ පොත ඇසුරින් රීස් ඩේවිඩ්ස් පඬිතුමා පාලි භාෂා අධ්‍යයනයට යොමු වූ ආකාරය විස්තර කරන්න.
- එතුමා බුදුදහම හා පාලි භාෂාව යුරෝපයේ ස්ථාවර කිරීමෙහි ලා පුරෝගාමී වූ චරිතයක් බව පෙන්වා දෙන්න.
- එතුමා විසින් ආරම්භ කළ පාලි ග්‍රන්ථ සමිතියෙන් (PTS) පාලි භාෂාවේ උන්නතියට සිදු වූ සේවය පිළිබඳ සිසුන් දැනුම්වත් කරන්න.
- රීස් ඩේවිඩ්ස් මැතිතුමා තුළ තිබූ මහත්මා ගති ගුණ චරිතායනය කර ගත යුතු බව අවධාරණය කර පෙන්වන්න.
- පෙළ පොතේ සහ ඇමුණුම 02 අභ්‍යාස කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

## මූලික වදන් හා සංකල්ප

- **පාලි සාහිත්‍යය** - පාලි භාෂාවෙන් ලියැවී ඇති පෙළ, අටුවා, ටීකා හා ප්‍රකරණ ග්‍රන්ථ සහිත කෘති එකතුව පාලි සාහිත්‍යය යි.
- **අටුවා සාහිත්‍යය** - පාලි ත්‍රිපිටකය විවරණය කිරීමට ලියැවී ඇති කෘති සමූහය

## ඇගයීම හා තක්සේරුකරණය :

- අටුවාචාරී බුද්ධඝෝෂ මාහිමි ලියූ අටුවා ග්‍රන්ථ මතකයෙන් නම් කිරීම
- උන්වහන්සේගෙන් පාලි සාහිත්‍යයට සිදු වූ සේවය විස්තර කිරීම
- දිඹුලාගල කාශ්‍යප මාහිමි චරිතයේ විශේෂතා ඉස්මතු කර පෙන්වීම
- පාලි සාහිත්‍යයට පොල්වත්තේ බුද්ධදත්ත මාහිමි වෙතින් සිදු වූ සේවය විස්තර කිරීම
- පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි විසින් රචිත ග්‍රන්ථ කීපයක් මතකයෙන් කීම
- රීස් ඩේවිඩ්ස් පඬිතුමාගේ චරිතය පිළිබඳ අදහස් දැක්වීම
- පාලි පොත් සමාගම (PTS) හඳුන්වා දීම
- රීස් ඩේවිඩ්ස් පඬිතුමා විසින් රචිත හා සංස්කරණය කරන ලද ග්‍රන්ථ කීපයක් නම් කිරීම

## ගුණාත්මක යෙදවුම්

- පෙළ පොත
- ඇමුණුම 01 හා 02

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- බුද්ධඝෝෂ, අනුවාදක - ගණේගම සරණංකර හිමි, 1963
- ශ්‍රී බුද්ධදත්ත, සම්පාදක - සිරි සීවලී හිමි, අනුල මුද්‍රණාලය, 1965
- ධාරා (රීස් ඩේවිඩ්ස් අංකය) සංස්: වග ඥාණාලෝක හිමි, 1965, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය
- පාලි භාෂා සාහිත්‍ය හෙබවූ විදේශිකයෝ - මිරිස්වත්තේ විමලඥාණ හිමි, බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, මහනුවර, 2012
- අට්ඨකතා සාහිත්‍යය සහ දිඹුලාගල කාශ්‍යප මාහිමි සඟ පරපුර - ගෝණදෙනියේ පඤ්ඤාරතන හිමි

## ඇමුණුම 01

# පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි සාහිත්‍ය සේවාව

| පාලිභාෂා අධ්‍යයනයට උපකාර පිණිස ලියූ ග්‍රන්ථ | බුරුමවැසියන්ගේ පාලිභාෂා අධ්‍යයනය පිණිස ලියා ඇති ග්‍රන්ථ | බුරුම අකුරෙන් කළ සංස්කරණ හා සන්න ග්‍රන්ථ | (P.T.S.) සඳහා රෝමන් අකුරෙන් ලියා සංස්කරණය කොට ඇති ග්‍රන්ථ / සිංහලෙන් කළ සංස්කරණ | ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ / බෞද්ධ / ඉතිහාස | විවාද ග්‍රන්ථ | පුවත්පත් ලිපි සංග්‍රහ | කුඩා ධර්ම ග්‍රන්ථ |
|---|---|---|---|---|---|---|---|
| 1. පාලිභාෂාවතරණය I, II, III<br>2. පාලි පාඨාවලී<br>3. පාලි වාක්‍ය විවේචනය<br>4. පාලි වාක්‍ය රචනාව<br>5. පරිවර්තන පරිචය<br>6. පාලි ගද්‍ය පද්‍ය රචනා<br>7. පාලි සිංහල අකාරාදිය<br>8. පාලි සාහිත්‍යය 1, 2<br>9. කල්‍යාණි ශිලා ලිපිය<br>10. ත්‍රිපිටක සූචිය<br>11. පාලි භාසප්පවෙසිනී<br>12. පාලි සන්දේසාවලී<br>13. New Pali Course - I, II<br>14. Aids to Pali<br>15. Conversation & Translations<br>16. Higher Pali Course<br>17. Pali – English Dictionary | 1. පාලි භාසප්පවෙසිනී<br>2. ත්‍රිභාෂරත්නාකරය<br>3. සාරත්‍ථ ලක්ඛණ අභිධානය | 1. පාලි නිඝණ්ඩුව<br>2. රසවාහිනී<br>3. මහ පිරිත් පොත<br>4. විමුක්ති සංග්‍රහය<br>5. බුද්ධඝොසුප්පත්ති | 1. නාම රූප පරිච්ඡේද<br>2. සම්මොහවිනොදනී<br>3. සද්ධම්මපජ්ජෝතිකා<br>4. නිද්දෙසඅටුවාව<br>5. විනය විනිච්ඡය<br>6. උත්තර විනිච්ඡය<br>7. සමන්තකූටවණ්ණනා අග පරිච්ඡේදය<br>8. ධම්මපදට්ඨකථාවේ තණ්හාවග්ගය<br>9. ධම්මපදය<br>10. ජිනකාලිනී<br>11. සීහලවත්ථු<br>12. අපදානපාළි<br>13. අභිධම්මවිකාසිනී<br>14. පාළි මහාවංස | 1. ථෙරවාද බෞද්ධ දර්ශනය<br>2. අභිධර්ම මාතෘකා ස්වරූපය<br>3. පාලි සාහිත්‍යය<br>4. හියුංසියං භ්‍රමණ වෘත්තාන්තය<br>5. ථෙරවාදී බෞද්ධාචාර්යයෝ<br>6. භාරතීය බෞද්ධාචාර්යයෝ<br>7. සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ<br>8. කල්‍යාණශාසන වංශය<br>9. කල්‍යාණ වංශනිකාය I, II, III<br>10. ඉනා පැරැණි බණකතා<br>11. අටුවා පරීක්ෂණය හා අටුවා කථාවස්තු | 1. ගාරවාගාරවවිනිච්ඡය<br>2. හෙසිරීමා වාදය<br>3. ආත්ම අනාත්ම වාදය | 1. ධර්මවාදී<br>2. සත්‍යවාදී<br>3. අර්ථවාදී | 1. පමාවීමයුතු ද?<br>2. බුද්ධගුණදීපනිය<br>3. ධර්මාවවාදමඤ්ජරී<br>4. කර්මවීර්යදීපනී<br>5. විශුද්ධිදීපනී<br>6. දශසංඥා විභාගය |

| |
|---|
| අමරපුර ශ්‍රී කල්‍යාණිවංශ මහා නිකායේ මහා නායක ධුරය/විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය |
| බුරුමයේ පැවැත්වූ ෂට්ඨ සංගායනාවේ දී ප්‍රධාන කර්තෘ මණ්ඩල සාමාජික හා විනය පිටකයේ භාරව ක්‍රියා කිරීම |
| අග්ගමහා පණ්ඩිත උපාධියෙන් පිදුම් ලැබූ පළමු ලාංකික භික්ෂුව |
| (P.T.S.) එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගමේ ක්‍රියාකාරී සාමාජික |

**ඇමුණුම 02**

01. පහත දැක්වෙන ගාථා වාචෝද්ගත කරන්න.

i. බුද්ධස්ස විය ගම්භීරඝොසත්තා නං වියාකරුං,
බුද්ධඝොසො'ති ඝොසො හි බුද්ධො විය මහීතලෙ.

ii. තත්‍ථ ඤාණොදයං නාමං කත්වා පකරණං තදා,
ධම්මසඞ්ගණියා'කාසි කච්ඡං සො අත්ථසාලිනිං.

iii. පරිත්තට්ඨකථඤ්චෙ'ව කාතුමාරභි බුද්ධිමා,
තං දිස්වා රෙවතො ථෙරො ඉදං වචනමබ්‍රවි.

iv. පාළිමත්තමිධානීතං නත්‍ථි අට්ඨකථා ඉධ,
තථාචරියවාදා ච භින්නරූපා න විජ්ජරෙ.

v. සීහළට්ඨකථා සුද්ධා මහින්දෙන මතීමතා,
සංගීතිත්තයමාරූළ්හං සම්මාසම්බුද්ධෙන දෙසිතං.

**(මහාවංසය, 37 පරිච්ඡේදය, 224 - 228 ගාථා)**

vi. අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා,
තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටං.

vii. සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤං ච භාවයං,
ආතාපි නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං.

**(සංයුත්ත නිකාය, දේවතා සංයුත්තය, සත්ති වර්ගය, ජටා සූත්‍රය)**

02. පාලි ග්‍රන්ථ සමිතිය (PTS) මගින් සංස්කරණය කරන ලද ග්‍රන්ථ ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

# තක්සේරුව සහ ඇගයීම

# හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් නිපුණතා පාදක විෂය මාලාව හඳුන්වා දීමේ දී **පාසල පදනම් කරගත් තක්සේරුකරණය** පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එසේම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගෙන ඒවා දියුණු කරමින් හා පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟාකර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයාගේ කාර්යභාරයයි. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම

ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්‍ෂාත් වුයේ දැ යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන් ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මේ සඳහා පවත්නා හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමයයි. යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්‍ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්‍ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්‍ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්‍ෂණ
4. ගවේෂණ
5. නිරීක්‍ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්‍ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්‍ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්‍ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්‍ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්‍ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සෑම එකක්මත්, සෑම විෂයක් සම්බන්ධයෙන්මත්, සෑම විෂය ඒකකයකටමත්, යොදා ගත යුතු යැයි අපේක්‍ෂා නොකෙරේ. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

# ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2018

## 5 ශ්‍රේණිය

**පාලි භාෂාව I** **කාලය : පැය එකයි**

විභාග අංකය :..........................................

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 40 කි.
- ❖ අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ❖ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

### I කොටස

**01.** අංක 1 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

1. පාලි හෝඩියේ ඇති **අඝෝෂාක්ෂර** සංඛ්‍යාව,
   i. 08 කි. ii. 10 කි. iii. 11 කි. iv. 21 කි.

2. **මහාප්‍රාණාක්ෂර** පමණක් සහිත වරණය තෝරන්න.
   i. ක ච ට ත ප ii. ඡ ඨ ථ බ ළ
   iii. ඛ ඩ ද ග භ iv. ජ ඪ ද ග බ

3. නිවැරදි අක්ෂර වින්‍යාසය යෙදී ඇති වාක්‍යාංශය තෝරන්න.
   i. පුරිසධම්මසාරථී ii. සත්තා දෙවමනුස්සානං
   iii. සොත්ති තෙ හොතු සබ්බදා iv. සබ්බෙ සත්තා ආහාරට්ඨීතිකා

4. ය ර ල ව යන අක්ෂර හැඳින්වීමට යොදන නමක් නොවන්නේ,
   i. වර්ගාන්තාක්ෂර ii. ද්වියාක්ෂර
   iii. අන්ත්‍යස්ථාක්ෂර iv. ඊෂත්පෘෂ්ඨාක්ෂර

5. බුද්ධඝෝෂ මාහිමියන්ගේ ගුරුවරයා වූයේ,
   i. සුමන නම් තෙර නමකි. ii. සංඝමිත්ත නම් තෙර නමකි.
   iii. රේවත නම් තෙර නමකි. iv. අශ්වඝෝෂ නම් තෙර නමකි.

6. බුද්ධඝෝෂ තෙරුන් විසින් විනය පිටකයට සැපයූ අටුවාව නම් කර ඇත්තේ,
   i. සුමංගලවිලාසිනී නමිනි. ii. සමන්තපාසාදිකා නමිනි.
   iii. සාරත්ථප්පකාසිනී නමිනි. iv. පරමත්ථජෝතිකා නමිනි.

7. උදානපාළියට අර්ථකථාවක් සම්පාදනය කරන ලද්දේ,
   i. බුද්ධඝෝෂ තෙරුන් විසිනි. ii. ධම්මපාල තෙරුන් විසිනි.
   iii. බුද්ධදත්ත තෙරුන් විසිනි. iv. වජිරබුද්ධි තෙරුන් විසිනි.

8. 'සඞ්ගාමජී' නමින් තෙරුන් වහන්සේ හඳුන්වනු ලබන්නේ,
   i. කෙලෙස් ඇලීම්වලින් ජයගත් බැවිනි. ii. සංගාම නම් ගම උපන් බැවිනි.
   iii. යුද්ධයක් ජයගෙන පැවිදි වූ බැවිනි. iv. භික්ෂූන් සමග හිතවත් බැවිනි.

9. 'හීනායාවත්තිස්සාමි'යන්නෙහි අර්ථය වන්නේ,
   i. ක්ෂයවීමට යන්නෙමි යන්න යි.  ii. ගිහිබවට පත්වන්නෙමි යන්න යි.
   iii. කුලයෙන් පහත් වන්නෙමි යන්න යි.  iv. හොරෙන්ම පැන යන්නෙමි යන්න යි.

10. හතකවාදෙන යනු,
   i. මිලදී ගැනීමේ වාදයෙනි.  ii. බැලමෙහෙකරු වාදයෙනි.
   iii. බත් පිළිබඳ වාදයෙනි.  iv. පොරොන්දු වාදයෙනි.

11. **සහ, සද්ධිං, සමං** යන නිපාත පද යෙදෙන්නේ,
   i. දුතියා විභක්ති නාමපද සමග ය.  ii. තතියා විභක්ති නාමපද සමග ය.
   iii. චතුත්ථී විභක්ති නාමපද සමග ය.  iv. පඤ්චමී විභක්ති නාමපද සමග ය

12. **අඤ්ඤතරො ච ඛො පනායස්මා නන්දො අරහතං අහොසි** යන වැකියෙහි අරහතං යන්නෙහි විභක්තිය හා වචනය වන්නේ,
   i. දුතියා විභක්ති ඒකවචනය යි.  ii. තතියා විභක්ති ඒකවචනය යි.
   iii. පඤ්චමී විභක්ති බහුවචනය යි.  iv. ඡට්ඨී විභක්ති බහුවචනය යි.

13. ථෙරා **නවහි මාසෙහි** සංගීතිං අකංසු යන වැකියෙහි අංකිත පදයෙහි විභක්ති ප්‍රයෝගය වන්නේ,
   i. ක්‍රියා ප්‍රවර්ගාර්ථයේ තතියා විභක්තිය යි.
   ii. ක්‍රියා විශේෂණාර්ථයේ තතියා විභක්තිය යි.
   iii. අපාදානාර්ථයේ පඤ්චමී විභක්තිය යි.
   iv. නිර්ධාරණාර්ථයේ ඡට්ඨී විභක්තිය යි.

14. ආඛ්‍යාත පදයක ලක්ෂණයක් **නොවන්නේ,**
   i. කාලත්‍රයක් තිබීම.  ii. පුරුෂත්‍රයක් තිබීම.
   iii. ලිංගත්‍රයක් තිබීම.  iv. වචනද්වයක් තිබීම.

15. පංචමී ක්‍රියාපදයක් ඇතුළත් නොවූ වාක්‍යය තෝරන්න.
   i. දෙවො වස්සතු කාලෙන.  ii. ත්වම්පි සමණ කසස්සු.
   iii. යන්තෙ කරණීයං කරොහි.  iv. න භජෙ පාපකෙ මිත්තෙ.

16. **යාවකො දුක්ඛෙන ජීවති** යන අදහස කිව හැකි විකල්ප පාලි වාක්‍යය තෝරන්න.
   i. යාවකො දුක්ඛම්හා ජීවති.  ii. යාවකො දුක්ඛො ජීවති.
   iii. යාවකො දුක්ඛෙ ජීවති.  iv. යාවකො දුක්ඛං ජීවති.

17. අජ්ඣාවසති යන ක්‍රියාපදයේ නිවැරදි පද බෙදීම වන්නේ,
   i. අධි + ආ + වසති යන්නයි.  ii. අජ්ඣ + ආවසති යන්නයි.
   iii. අජ්ඣා + වසති යන්නයි.  iv. අධි + වසති යන්නයි.

18. බොරුව යන අර්ථය **නො දෙන** නිපාත පදයක් වන්නේ,
   i. අලිකං  ii. මුසා  iii. මිච්ඡා  iv. ඊසකං

19. අග්ගලසූචි යනු,
   i. ඉදිකටුවකි.  ii. දොරපොල්ලකි.
   iii. දියඅගලකි.  iv. අත්සුණුවකි.

20. සමානාර්ථ **නොවන** නිපාත යුගලය තෝරන්න.
   i. අභිණ්හං, අභික්ඛණං  ii. පරිතො, සමන්තා
   iii. ඛිප්පං, ආසු  iv. යාවතා, තාවතා

21. යවමදනතරළාචාගමා යන සූත්‍රයෙන් අකුරක් ආගම **නොවූ** පද යුගලය තෝරන්න.
   i. එතදවොච, එතදෙව   ii. පුනරෙව, අත්‍ථදත්‍ථං
   iii. යාවදෙව, තාවදෙව   iv. නයිදං, නයිමස්ස

22. සං + ජාතො යන විසන්ධිය **සඤ්ජාතො** ලෙස සන්ධි වූයේ බාලාවතාරයේ එන,
   i. එහෙඤ්ඤං යන සූත්‍රයට අනුව ය.
   ii. නිග්ගහීතං ච යන සූත්‍රයට අනුව ය.
   iii. සයෙච යන සූත්‍රයට අනුව ය.
   iv. වග්ගන්තං වා වග්ගෙ යන සූත්‍රයට අනුව ය.

23. **පරො වා සරො** යන සූත්‍රයේ කාර්ය වන්නේ
   i. පර ස්වරය ලොප් කිරීම ය.
   ii. පූර්ව ස්වරය ලොප් කිරීම ය.
   iii. බින්දුවෙන් පර ස්වරය ලොප් කිරීම ය.
   iv. ස්වරයෙන් පර බින්දුව ලොප් කිරීම ය.

24. **පච්චන්ත** යන්නෙහි නිවැරදි විසන්ධි පදය වන්නේ
   i. පච්ච + අන්ත යන්න යි.   ii. පති + අන්ත යන්න යි.
   iii. පච් + අන්ත යන්න යි.   iv. පච්චි + අන්ත යන්න යි.

25. **වග්ගෙ ඝොසාඝොසානං තතිය පඨමා** යන සූත්‍රයට අදාළ සන්ධි පද පමණක් ඇති වරණය තෝරන්න.
   i. අප්පමාදො, දුච්චරිතං, චතුද්දිසං
   ii. පඨමජ්ඣානං, සෙතච්ඡත්තං, ආයුක්ඛයං
   iii. ජච්චන්ධා, යජ්ජෙවං, අනුස්සති
   iv. දුබ්බලො, අජ්ඣභාසි, විප්පයුත්තො

26. සමාස නාම සම්බන්ධයෙන් අසත්‍යය වූ ප්‍රකාශය තෝරන්න.
   i. අන්‍යෝන්‍ය සම්බන්ධය ඇති පද කීපයක් තනි පදයක් සේ ගැළපෙයි.
   ii. සමාසයන්හි මුල් පදයන්හි විභක්ත්‍යන්තය ලොප් වේ.
   iii. නාමපද ඇතැම් විට නිපාත හා උපසර්ග පද හා එක් වී සමාස වේ.
   iv. නාමපදයක් හා ආඛ්‍යාත පදයක් එක් වී සමාස වේ.

27. අව්‍යයීභාව සමාස පද පමණක් ඇති වරණය තෝරන්න.
   i. අබ්‍රාහ්මණො, ගුණධනං, කාපුරිසො   ii. සුගන්ධො, චතුප්පදො, රාජභයං
   iii. අනුරථං, යාවජීවං, පටිවාතං   iv. මාතාපිතරො, පාවචනං, අසුරො

28. අපච්චත්ථ තද්ධිත ප්‍රත්‍යය දැක්වෙන සූත්‍රයක් නොවන්නේ,
   i. සත්‍යාදීහි මන්තු යන්නයි.   ii. වාණප්පච්චෙ යන්නයි.
   iii. ණෙරවිධවාදිතො යන්නයි.   iv. ණවො පග්වාදීහි යන්නයි.

29. පහුරෙන් එතරවන්නා යන අර්ථය ඇති තද්ධිත පදය තෝරන්න.
   i. කත්තිකෙය්‍යො   ii. ඔලුම්පිකො
   iii. නාවිකො   iv. සාකටිකො

30. පාපතරො, දණ්ඩී, ගුණවා යන තද්ධිත පද අයත් වන්නේ,
   i. අනෙකත්ථ තද්ධිතයට ය.   ii. අපච්චත්ථ තද්ධිතයට ය.
   iii. අත්ථ්‍යත්ථ තද්ධිතයට ය.   iv. භාව තද්ධිතයට ය.

31. නිපාත පද සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
    i. නිපාත පද වරනැගිය හැකි ය.
    ii. වාක්‍යයක මුල මැද අග යෙදිය හැකි ය.
    iii. නිපාත පද අව්‍යය පද යන නමින් ද හඳුන්වයි.
    iv. අර්ථ සහිත නිපාත පද මෙන් ම අර්ථ රහිත නිපාත පද ද ඇත.

32. රීස් ඩේවිඩ්ස් මහතාගෙන් පාලි සාහිත්‍යයට වූ සේවාවක් වන්නේ,
    i. පාලි අට්ඨකථා රචනා කිරීම ය.
    ii. පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂය සම්පාදනය කිරීම ය.
    iii. පාලි භාෂාවතරණය රචනා කිරීම ය.
    iv. ලංකා පාලි සාහිත්‍යය නම් ග්‍රන්ථය රචනා කිරීම ය.

33. පොළොන්නරු යුගයේ **මහාථෙර, සංඝපරිනායක** යන ගෞරව නාමයෙන් හඳුන්වනු ලැබූ යතිවරයා වූයේ,
    i. බුද්ධඝෝෂ මාහිමි　　ii. දිඹුලාගල කාශ්‍යප මාහිමි
    iii. සාරිපුත්‍ර මාහිමි　　iv. සංඝරක්ඛිත මාහිමි

34. සූත්‍ර පිටකය හැඳින්වීමට භාවිත කරන අපර නාමයක් වන්නේ,
    i. ආඥා දෙසනා　　ii. වොහාර දෙසනා
    iii. පරමත්ථ දෙසනා　　iv. සාමුක්කංස දෙසනා

35. සංගාමජී සූත්‍රය අන්තර්ගත වන්නේ උදානපාළියෙහි,
    i. බෝධි වග්ගයට ය.　　ii. මුචලින්ද වග්ගයට ය.
    iii. නන්ද වග්ගයට ය.　　iv. පාටලීගාමීය වග්ගයට ය.

36. බුද්ධඝෝෂ මාහිමියන් ලක්දිවට වැඩම කරන විට මෙරට පාලනය කළ රජතුමා වූයේ,
    i. මහසෙන් රජු ය.　　ii. මහානාම රජු ය.
    iii. උත්තිය රජු ය.　　iv. මහමුගලන් රජු ය.

37. අපදානපාළියෙහි
    i. වර්ග 40 ක් අපදාන 590 ක් හා ගාථා 7650 ක් ඇත.
    ii. වර්ග 55 ක් අපදාන 550 ක් හා ගාථා 8500 ක් ඇත.
    iii. වර්ග 65 ක් අපදාන 582 ක් හා ගාථා 7629 ක් ඇත.
    iv. වර්ග 65 ක් අපදාන 592 ක් හා ගාථා 7619 ක් ඇත.

38. භික්ඛුනීනිලයො යනු,
    i. භික්ෂුණී ආරාමයකි.　　ii. භික්ෂුණීන්ගේ තනතුරකි.
    iii. භික්ෂුණීන්ගේ ශික්ෂාපදයකි.　　iv. භික්ෂුණියකගේ නමකි.

39. මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය පිරිනිවන් පෑවේ,
    i. සැවැත් නුවර දී ය.　　ii. විශාලා මහනුවර දී ය.
    iii. රජගහ නුවර දී ය.　　iv. කපිලවස්තුපුරයේ දී ය.

40. බුද්දකනිකායට අයත් **නොවන** ග්‍රන්ථයක් ඇතුළත් වරණය තෝරන්න.
    i. පටිසම්භිදාමග්ග, පෙටකොපදෙස　　ii. විමානවත්ථු, පෙතවත්ථු
    iii. ථෙරගාථා, ථෙරීගාථා　　iv. අපදානපාළි, උදානපාළි

(ලකුණු - 1 x 40 = 40)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2018**<br>5 ශ්‍රේණිය<br>**පාලි භාෂාව II** **කාලය : පැය තුනයි**<br>**විභාග අංකය :.........................................** |

**I කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද II කොටසින් තවත් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.**

**I** කොටස

**01. (අ) සිංහලට නගන්න.**

අථ ඛො භගවා ආයස්මන්තං නන්දං බාහාය ගහෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි අච්ඡරාසතානි සක්කස්ස දෙවානමින්දස්ස උපට්ඨානං ආගතානි හොන්ති කකුටපාදානි. අථ ඛො භගවා ආයස්මන්තං නන්දං ආමන්තෙසි: 'පස්සසි නො ත්වං නන්ද; ඉමානි පඤ්චඅච්ඡරාසතානි කකුටපාදානී'ති. 'එවං භන්තෙ'ති. 'තං කිං මඤ්ඤසි නන්ද, කතමා නු ඛො අභිරූපතරා ච දස්සනීයතරා ච පාසාදිකතරා ච, සාකියානී වා ජනපදකල්‍යාණී, ඉමානි වා පඤ්චඅච්ඡරාසතානි කකුටපාදානී'ති.

**(ආ) සිංහලට නගන්න.**

තදා අවොච සා සබ්බං යථා පරිවිතක්කිතං,
තායො'පි සබ්බා ආහංසු යථා පරිවිතක්කිතං.

''යදිතෙ රුචිතං අය්‍යෙ නිබ්බාණං පරමං සිවං,
නිබ්බායිස්සාම සබ්බාපි බුද්ධා'නුඤ්ඤාය සුබ්බතෙ.

මයං සහා'ව නික්ඛන්තා සරාපි ච භවාපි ච,
සහයෙ'ව ගමිස්සාම නිබ්බාණපුරමුත්තමං.

(ලකුණු 6+6=12)

**02. (අ) පාලියට නගන්න.**

i. කුමාරයා මිතුරන් සමඟ වනයට පිවිසියේය.
ii. වෙළෙන්දෝ ගොවීන්ගෙන් බඩු මිලදී ගත්හ.
iii. අද පටන් දිවි ඇති තාක් මම සතුන් නො මරමි.

(ලකුණු 2×3=6)

**(ආ) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන වච්ඡගොත්තො පරිබ්බාජකො එකපුණ්ඩරීකෙ පරිබ්බාජකාරාමෙ පටිවසති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය වෙසාලියං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි. අතිප්පගො ඛො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං. යන්නූනාහං යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො, යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති, අථ ඛො භගවා යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අද්දසා ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච.

එතු බො භන්තෙ, භගවා ස්වාගතං භන්තෙ භගවතො චිරස්සං බො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු, භන්තෙ භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. වච්ඡගොත්තො'පි බො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්‍වා එකමන්තං නිසීදි.

i. වච්ඡගොත්ත පිරිවැජියා වාසය කළේ කිනම් නගරයක ද?
ii. 'අතිප්පගො බො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං' යන්නෙහි අර්ථය ලියන්න.
iii. වච්ඡගොත්ත පිරිවැජියා බුදුරදුන් පිළිගැනීමට භාවිත කළ ප්‍රකාශ දෙකක් සිංහලෙන් ලියන්න.
iv. ඡේදයෙන් ගම්‍ය වන බුදු සිරිතේ විශේෂ ගුණාංග දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 1+1+2+2=6)

## 11 කොටස

03. i. පාලි භාෂාවේ අක්ෂර ගණන කියවෙන බාලාවතාර සූත්‍ර පාඨය නිවැරදි ව ලියන්න.
ii. 'යවමදනතරළා චාගමා' යන සූත්‍රයට උදාහරණ 8ක් ලියා දක්වන්න.
iii. පහත දැක්වෙන පද සන්ධි කර අදාළ සූත්‍රය ලියා දක්වන්න.
(අ) මාතු + උපට්ඨානං
(ආ) බුද්ධානං + එව
(ඉ) ජායා + ඉව
(ඊ) යං + අනිච්චං
(උ) සං + ඨිතො
(ඌ) උ + සොසො

(ලකුණු 2+4+6=12)

04. i. ''යං තිකාලං තිපුරිසං...................'' යන ගාථාව සම්පූර්ණ කරන්න.
ii. ආඛ්‍යාත විභක්ති අට නම් කරන්න.
iii. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ශබ්දය | දුතියා විභක්ති | | පඤ්චමී විභක්ති | | සත්තමී විභක්ති | |
|---|---|---|---|---|---|---|
| | එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| මනුස්ස | මනුස්සං | ............. | ............. | ............. | මනුස්සෙ | ............. |
| සද්ධා | ............. | ............. | සද්ධාය | ............. | ............. | සද්ධාසු |
| අම්හ | මං | ............. | මයා | ............. | ............. | ............. |

(ලකුණු 2+4+6=12)

05. i. 'සඞ්ඛ්‍යා පුබ්බො දිගු' යන සූත්‍රයට අර්ථ ලියා උදාහරණයක් සපයන්න.
ii. පහත සඳහන් අසමස්ත පද සමාස කර දක්වන්න.
(අ) නාගො විය බුද්ධො
(ආ) ඛීණා ආසවා යස්ස සො
(ඉ) රාජතො භයං
(ඊ) අද්ධමාසං අද්ධමාසං අනු
(උ) ජිනස්ස චරිතං
(ඌ) හිරඤ්ඤං ච සුවණ්ණං ච
(එ) මාතා ච පිතා ච
(ඔ) චත්තාරි සච්චානි

iii. පහත සඳහන් පද කවර තද්ධියකට අයත් දැයි නම් කරන්න.
(අ) සාකටිකො
(ආ) වාසුදෙවො
(ඉ) පාපිස්සකො
(ඊ) මනුස්සත්තං

| | |
|---|---|
| (උ) ඡට්ටයො | (ඌ) අඤ්ඤාටා |
| (එ) සාමණෙරො | (ඔ) දොවාරිකො |
| (ක) තපස්සි | (ඛ) දූතියො |
| (ග) සත්තධා | (ඝ) කොසල්ලං |

(ලකුණු 2+4+6=12)

06. i. පහත දැක්වෙන වචන පාලියෙන් ලියන්න.

(අ) අනිද්දා (ආ) යට

ii. පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

(අ) බුද්ධො ධම්මං දෙසෙති.

(ආ) මනුස්සා රුක්ඛෙ ඡින්දන්ති.

iii. පහත දැක්වෙන මාතෘකාවකට අනුව වාක්‍ය හයකට නො අඩු රචනාවක් ලියන්න.

(අ) මම පරිවෙණං

(ආ) සාරිපුත්තත්ථෙරො

(ඉ) අනුරාධපුරං

(ලකුණු 2+4+6=12)

07. i. වර්තමාන කෘදන්ත ප්‍රත්‍යය දෙකට නිදසුන් දෙකක් දක්වන්න.

ii. පහත දැක්වෙන පදයන්ගේ ඇති උපසර්ග පද වෙන් කොට දක්වන්න.

(අ) පහරති (ආ) අජ්ඣාභාසි

(ඉ) පටිලභති (ඊ) පළිබොධො

iii. පහත දැක්වෙන නිපාත පද යොදා හිස්තැන් පුරවා නැවත ලියන්න.

(සක්කා, සම්මා, පෙච්ච, නිච්චං, අචිරං, විනා)

(අ) සද්ධිවිහාරිකෙන පන එවං.................................... වත්තිතබ්බං.

(ආ) න.................................... අක්කමිතුං.

(ඉ) ලෙඛනෙන.................................... කථං ලිඛාමි.

(ඊ) .................................... වතයං කායො.

(උ) තෙ.................................... පරිවෙණං ගච්ඡන්ති.

(ඌ) ඉධ සොචති .................................... සොචති.

08. i. අපදාන යන්නෙහි අර්ථය කෙටියෙන් ලියා දක්වන්න.

ii. මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය ඇතුළු පිරිසට පිරිනිවීමට සිතිවිලි පහළ වූ අවස්ථාවේ ඇති වූ අසිරිමත් සිදුවීම් හතරක් ලියන්න.

iii. මහාප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ මොනවා දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 2+4+6 = 12)

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. වාරය ඃ පළමු වැනි වාරය

2. ආධාරක අංකය ඃ 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම ඃ 4.1, 4.2, 4.3, 4.4, 4.5 සහ 4.6

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය ඃ පාලි භාෂා රීති නිවැරැදි ව හසුරුවමින් පූර්ණ වාක්‍ය ගොඩනැඟීම

5. ආධාරකයේ ස්වභාවය ඃ පාලි භාෂාවෙන් ළමා කතා පොතක් නිර්මාණය

6. ආධාරකයේ අරමුණු ඃ
   - පාලි භාෂාවෙන් නිර්මාණශීලී වාක්‍ය ලිවීම දිරි ගැන්වීම
   - භාෂා කුසලතාව ප්‍රායෝගික ජීවිතයට අර්ථාන්විත ව යොදා ගැනීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් ඃ

- එක් එක් සිසු කණ්ඩායමට වෙන වෙන ම ආදර්ශමත් ළමා කතාවක් ලිවීමට නිශ්චිත කාලයක් ලබා දෙන්න.
- සිසුන් ලියන ලද කතා පරීක්ෂා කර වැරැදි ඇතොත් නිවැරැදි කොට තව දුරටත් සංවර්ධනය කරන්න.
- කතාවේ අන්තර්ගතය A4 පිටු 8කට සීමා කිරීමට, අකුරුවල විශාලත්වය 20 (font size) හි පවත්වා ගැනීමට, පින්තූර, කවරය සහ පොතක තිබිය යුතු අනෙකුත් අංගෝපාංග සිසු අභිමතය පරිදි චිත්තාකර්ෂණීය ලෙස සැකැසීමට උපදෙස් දෙන්න.
- අදාළ නිර්ණායකයන්ට ලකුණු ලබා දෙන්න.

සිසු උපදෙස් ඃ

- කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් සිත් ඇද ගන්නාසුලු, ළමයින්ට ගැළපෙන සරල කතාවක් ගොඩනඟන්න.
- පොතෙහි විවිධ කාර්යවල නියැළුණු කණ්ඩායමේ සියලු සිසුන් ගේ නම් ද ඇතුළත් කරමින් පොත ලියා පරිගණක යතුරු ලියනය (පහසුකම් ඇතොත්) කරන්න.
- නිර්ණායක මැනවින් තේරුම් ගෙන උසස් මට්ටමින් පොත නිර්මාණය කරන්න.

**ලකුණු පරාසය**

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු ය 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කිරීම නිර්දේශ කෙරේ. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

| | |
|---|---|
| 9-10 | විශිෂ්ට මට්ටමේ නිපුණතාව |
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව |
| 6-7 | සම්මාන මට්ටමේ නිපුණතාව |
| 4-5 | ආසන්න මට්ටමේ නිපුණතාව |
| 5 ට | අඩු නිපුණතාවට ළඟා නො වූ |

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කරගත හැකි ය.

| නිර්ණායකය | සිසුන්ගේ නම් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| 1. ආදර්ශමත් ළමා කතාවක් වීම | | | | | | | | |
| 2. වාක්‍ය නිවැරැදි බව | | | | | | | | |
| 3. නියමිත පිටු ගණන තිබීම | | | | | | | | |
| 4. පොතට අවශ්‍ය අංග | | | | | | | | |
| 5. සුන්දර නිමාව | | | | | | | | |
| එකතුව | | | | | | | | |